# ශ්‍රී ලාංකික මාධ්‍යවේදීන් ඝාතනය: නිමලරාජන් මෛල්වාගනම්ගේ නඩු විභාගය

සැප්තැම්බර් 2025



REDRESS

Ending torture, seeking justice for survivors

INTERNATIONAL TRUTH AND JUSTICE PROJECT

# ප්‍රධානසාරාංශය

සිවිල් යුද්ධයේදී ඝාතනයට ලක් වූ මාධ්‍ය සේවකයින් සහ මාධ්‍යවේදීන් රැසකගේ ඝාතකයින් ශ්‍රී ලංකාව ක්‍රමානුකූලව ආරක්ෂා කර ඇත. 2000 සහ 2010 අතර සිදු වූ අවම වශයෙන් ඝාතන 44 ක වැඩිවීමක් සම්බන්ධයෙන්, සමහර අවස්ථාවල දීර්ඝ අපරාධ පරීක්ෂණ ආරම්භ කර ඇතත්, එක් පුද්ගලයෙකුවත් කිසිදා වගකිව යුතු බවට තීන්දු කර නොමැත. මෙසේ මාධ්‍යවේදීන්ට එල්ල කරන ලද පහරදීම් සම්බන්ධයෙන් වගවීමක් නොමැතිකම ඔස්සේ සිය ජීවිත අවදානමට ලක් කරමින්, ස්වයං-වාරණය සිදු කරමින් නැත්නම් පිටුවහල්ව සේවය කරන, රටේ ඉතිරිව සිටින ප්‍රවෘත්ති වාර්තාකරුවන්ට බියජනක පණිවුඩයක් ලබාදෙයි. ශ්‍රී ලංකාවේ මාධ්‍යවේදීන් අත්විඳින කම්පනයේ ස්වභාවය ගැන ද සැලකිය යුතු වේ. ඔවුන්ගෙන් බොහෝ දෙනෙකුට මරණ තර්ජන සහිතව ජීවත් වීමට, සැඟවී සිටීමට හෝ පදිංචිය වෙනස් කිරීමට බලපෑම් සිදු වී ඇති අතර, තවත් සමහරු රඳවා තබාගෙන ඇත.

තිස් නව හැවිරිදි නිමලරාජන් මයිල්වාගනම්, ශ්‍රී ලංකාවේ ගැටුම පිළිබඳ වාර්තා කිරීම දේශපාලනඥයින්ගේ සහ ආරක්ෂක හමුදාවන්ගේ අවශ්‍යතාවලට තර්ජනයක් වීම නිසා ඝාතනයට ලක් වූ ඉහළම පෙළේ දෙමළ මාධ්‍යවේදීන්ගෙන් එක් අයෙකි. නිමලරාජන් මයිල්වාගනම්ගේ මුළු පවුලම කැනඩාවට පලා ගිය අතර කිසි දිනෙක ආපසු පැමිණියේ නැත. එහෙත් සෑම වසරකම යාපනයේ පුවත්පත් සමාජයේ නිමලරාජන් මයිල්වාගනම්ගේ සගයන් විසින් ඔහුගේ මරණය ගෞරවාන්විතව සිහිපත් කිරීම සිදු වේ. ලන්ඩනයේ, ඔහු සේවය කළ බීබීසීයේ, ඔහු නමින් රැස්වීම් ශාලාවක් නම් කර ඇති අතර, ඔහුගේ කතාව දන්නා බොහෝ දෙනෙක් දැන් විශ්‍රාම ගොස්, මිය ගොස් හෝ සංවිධානයෙන් ඉවත් වී ඇත. ඓතිහාසික හා නීතිමය වාර්තාවන් සඳහා, මාධ්‍යවේදී නිමලරාජන්ගේ ඝාතනය සම්බන්ධයෙන් දැකිය හැකි දඬුවම් නොලැබීම ලේඛනගත කිරීමට මෙම වාර්තාව කටයුතු කරයි. මෙමගින් වගකිවයුත්තන්ට ක්‍රමානුකූලව නඩු පැවරීමට අසමත් වීම - කිසි විටෙකත් නීතිය හමුවට පමුණුවා නොමැති සැකකරුවන් විසින් පසුව සිදු කරන ලද ඉලක්කගත ඝාතන ඇතුළුව, උල්ලංඝනයන් බේදජනක ලෙස සක්‍රීය කිරීමට හේතු වූ අසාර්ථකත්වයන් ද - අවධාරණය කරයි.

මෙම ඝාතනය පිළිබඳ පොලිස් විමර්ශනය එවැන්නක් නොකළ යුතු ආකාරය පිළිබඳ පෙළපොත් උදාහරණයක් සේ දැක්විය හැකිය. අපරාධ ස්ථානය කිසි විටෙකත් සුරක්ෂිත කර පටිගත කර හෝ, ඡායාරූප ලබාගෙන නැති අතර අධිකරණ සාක්ෂි එකතු කර නැත. අපරාධය සිදු වූයේ අධි ආරක්ෂිත කලාපයක දැඩි ඇඳිරි නීතිය අතරතුර, බහු හමුදා මුරපොලවල්වලින් වටව තිබියදී වුවත්, නිමලරාජන්ගේ නිවස කිසි විටෙකත් ආරක්ෂා කර වට කිරීම සිදු නොවීය. එදින රාත්‍රියේ රාජකාරියේ යෙදී සිටි සමහර නිලධාරීන්ගෙන් කරුණු විමසීමට වසර ගණනාවක් ගත වූ අතර බොහෝ දෙනෙකු හඳුනා ගැනීමක් හෝ ප්‍රශ්න කිරීමක් සිදු නොවීය. ගිනිඅවි පිළිබඳ සාක්ෂි වැරදි ලෙස හසුරුවන ලද අතර විශ්ලේෂණයට වසර ගණනාවක් ගත විය. නිමලරාජන්ට මරණ තර්ජන හෝ ඔහුට ලැබුණු දුරකථන ඇමතුම් සම්බන්ධයෙන් කිසිදු සාක්ෂියක් ලබා ගෙන නොතිබූ නමුත්, ඒ වෙනුවට විකාරරූපී ලෙස ඔහුගේ බැංකු ගිණුම පරීක්ෂා කිරීම සිදු විය. චෝදනා එල්ල වූ සැකකරුවන්ට නිදහසේ සැරිසැරීමට සහ තවත් මිනීමැරුම් සිදු කිරීමට සහ පසුව ආරක්ෂක හමුදාවල සහාය ඇතිව රටින් පිටවීමට අවසර දෙන ලදී. ඔවුන්ගෙන් ප්‍රශ්න කිරීම සිදු වූ නමුත් ඔවුන් සිය නිර්දෝෂී බව ප්‍රකාශ කර සිටි විට මෙම කරුණු මතුපිටින් සලකා බලා ඔවුන් නිදහස් කරන ලද අතර ඔවුන්ට කිසි

විටෙකත් අපරාධයක් සම්බන්ධයෙන් චෝදනා එල්ල නොවිය. කනස්සල්ලට කරුණක් නම්, අත්අඩංගුවේ සිටියදී වධ හිංසා පමුණුවා ඇති බවත් ව්‍යාජ පාපොච්චාරණවලට අත්සන් කිරීමට බල කළ බවත් පවසමින් සැකකරුවන් නිරන්තරයෙන් පහරදීම් තුවාල සහිතව පැමිණීමයි.

මේ අතර, ඝාතනය සිදු කළ බවට චෝදනා එල්ල වන ඊලාම් මහජන ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ නායක ඩග්ලස් දේවානන්දගෙන් පොලිසිය කිසි විටෙකත් මෙම ඝාතනය සම්බන්ධයෙන් ප්‍රශ්න කර නොමැත. ඒ වෙනුවට 2000 සිට සෑම රජයකම පාහේ ඔහුට කැබිනට් අමාත්‍ය ධුරයක් ලබා දී තිබේ. 2024 දී පමණක් ඔහුට මෙම තනතුර අහිමි වුවත් ඔහු තව දුරටත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස රැඳී සිටියේය. ඊට වෙනස්ව, නිමලරාජන්ගේ මව සහ පියා සිය පුතාගේ ඝාතකයින් සම්බන්ධයෙන් යුක්තිය ඉටුවන තෙක් පිටුවහල්ව බලා සිටියදී මිය ගියෝය.

මෙම වාර්තාව මගින් නිමලරාජන්ගේ ඝාතනය සහ ඉන් පසු දශකය තුළ අවම වශයෙන් මාධ්‍යවේදීන් 44 දෙනෙකු ඝාතනය කිරීම කෙරෙහි අවධානය යොමු කළ ද, ඔහුට පෙර දකුණේ ද ඇතුළුව ශ්‍රී ලංකාවේ අනෙකුත් මාධ්‍ය සේවකයින් ඝාතනයට හෝ අතුරුදහන් වීමට ලක් වී ඇති බව සැලකිල්ලට ගත යුතුය. යුද්ධය වාර්තා කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදා විසින් අත්අඩංගුවට ගෙන හෝ පැහැරගෙන ගොස් වධහිංසා පමුණුවා ඇති දෙමළ සහ සිංහල වාර්තාකරුවන් විශාල සංඛ්‍යාවක් සිටින බව ද සඳහන් කිරීම වටී. ජීවතුන් අතර සිටින ඔවුන්ට තමා රඳවා තබා ගත්තේ කවුරුන්ද සහ කොහේද යන්න පිළිබඳව සාක්ෂි දිය හැකි නමුත් ඔවුන් වෙනුවෙන් යුක්තිය පසෙකලා කිසිදු පිළිගැනීමක් හෝ ලැබී නොමැත. ඒ අය අතරින් බොහෝ දෙනෙක් දැන් රටින් බැහැරව ජීවත් වෙති.

මෙම ප්‍රකාශනය යුරෝපීය සංගමය විසින් සම-අරමුදල් සපයන ලද අතර වධහිංසාවට එරෙහි එක්සත් සම්මේලනය (UATC) යටතේ නිෂ්පාදනය කරන ලදී. එහි අන්තර්ගතය ITJP සහ REDRESS හි තනි වගකීම වන අතර එය අනිවාර්යයෙන්ම යුරෝපීය සංගමයේ අදහස් පිළිබිඹු නොකරයි.

**යුරෙෝපාසංගමයෙන්සම අරමුදල්ලබාඇත.**

# පටුන


1. පසුබිම .............................................................................. 06
2. ඝාතනය ..............................................................................09
3. විමර්ශනය .............................................................................. 18
4. පොලිස් විමර්ශනය පිළිබඳ විශ්ලේෂණයක්...............................32
5. විමර්ශනය සිදු කිරීමට අපොහොසත් වීම: ඇඟවීම් ........................ 45
6. අනෙකුත් මාධ්‍යවේදීන් සහ මාධ්‍ය සේවකයන් ඝාතනය කිරීම ....... 50
7. සමාලෝචනය හා නිර්දේශ .............................................................. 60

## බීබීසී පුවත් සේවයේ නිමලරාජන්

ඒ යුධ සමයයි. කැරලිකරුවන් වන්නියේ වාසි ලබා ගනිමින් සැබෑ රාජ්‍යයක් ස්ථාපිත කරමින් සිටි නමුත් ශ්‍රී ලංකා හමුදාව යාපනය දෙමළ ජනතාවගේ හදවත වූ උතුරේ යාපනය නගරයේ පාලනය දෙමළ කොටින්ගෙන් උදුරා ගෙන තිබුණි. ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංගගේ රජය විසින් දෙමළ කතා කරන නගරයට දැඩි සම්බාධක පනවා තිබුණි: එහි විදුලිය නොතිබුණි, ඉන්ධන නොතිබුණි, බැටරි නොතිබුණි, පුවත්පත් මුද්‍රණයක් නොතිබුණි. නිමලරාජන් අයත් වූයේ මෙම ප්‍රජාවටය. ගැටුම් කලාපවල ජාත්‍යන්තර මාධ්‍යවේදීන් භුක්ති විඳින අධි තාක්ෂණික පහසුකම් හෝ ආරක්ෂක විධිවිධාන කිසිවක් ඔහු සතුව නොතිබුණ ද, ඔහු යුද්ධයෙන් විනාශ වූ යාපනය ලොවට ගෙන හැර පාන ඇස් සහ කන් සේ කටයුතු කළේය. බෝම්බ පිපිරීමක දර්ශනය, අතුරුදහන් වූවන් සොයන පවුලක් හෝ ඡන්ද මංකොල්ලකෑමේ යෙදී සිටින බලවත් දේශපාලනඥයන් වේවා, නැතහොත් සාමාන්‍ය ජීවිතයේ අයිතිවාසිකමක් ලබා ගැනීමට නිර්භීතව කටයුතු කරන දෙමළ ජනතාව වේවා යන ඕනෑම පුවතක් වෙත ඔහු තම බයිසිකලය පැදවීය. අන්තර්ජාලය හරහා වාර්තාවක් ගොනු කිරීමට ඔහුට උපකරණ තිබුණේ නැත: ඔහුගේ ප්‍රජාවට අන්තර්ජාලය කෙසේ වෙතත් විදුලිය පවා නොතිබුණි. ඒ වෙනුවට, නිමලරාජන් මෙම කතා පෑන හා කඩදාසි භාවිත කරමින්, දැඩි ආශාවකින් හා වෛෂයිකව ලිව්වේය. පසුව ලන්ඩනයෙන් දුරකථන ඇමතුමක් එනතුරු බලා සිටි ඔහු ඒවා කියෙව්වේය. නැවත නැවතත් එල්ල වූ මරණ තර්ජනවලින් නොසැලී, පීඩාවට පත් ප්‍රජාව තුළ සිටිමින් ගැටුම් වාර්තා කිරීමේ පුරෝගාමියෙකු වූ ඔහු, යාපනයේ හඬ විය. තවත් වාර්තාවක්, අපට කිසිදා අසන්නට නොලැබෙන වාර්තාවක් සකස් කරමින් සිටියදී ඔහු අමු අමුවේ මරා දමන ලදී.

**චන්දන කීර්ති බණ්ඩාර,**

**හිටපු ජ්‍යෙෂ්ඨ නිෂ්පාදක, බීබීසී සිංහල සේවය**

# 1. පසුබිම

## 1.1. හැඳින්වීම

2000 ඔක්තෝබර් 19 වන දින නාඳුනන තුවක්කුකරුවන් විසින් ඔහුගේ නිවසේ දී ශ්‍රී ලාංකික මාධ්‍යවේදී නිමලරාජන් මයිල්වාගනම් ඝාතනය කරන ලදී. ඔහුගේ ඝාතනය ශ්‍රී ලංකාවේ ජනවාර්ගික ගැටුම් සහ රාජ්‍ය අනුග්‍රහය ලත් ප්‍රචණ්ඩත්වය පැවති සමයේ දී වාර්තා කිරීම නිසා සිදු වන මාරාන්තික ප්‍රතිවිපාක සංකේතවත් කළේය. එය දෙමළ මාධ්‍යවේදියෙකු ඉලක්ක කරගත් මුල්ම ඝාතනවලින් එකක් වීම සහ රට පීඩාවට පත් කර ඇති දඬුවම් නොලැබීමේ වාතාවරණය මූර්තිමත් කළ එකක් වීම නිසා එමගින් හැරවුම් ලක්ෂ්‍යයක් සනිටුහන් කළේය.

නිමලරාජන්ගේ ඝාතනයට ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය ප්‍රතිචාර දැක්වූ ආකාරය ඔහුගේ මරණය සිදු වූ දින සිට සැකකරුවන් ඇප මත නිදහස් කරන ලද 2021 නොවැම්බර් දක්වා නිල අධිකරණ වාර්තා පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේෂණයක් මත පදනම් වෙමින් මෙම වාර්තාව මගින් විවේචනාත්මකව විමසා බලයි. පද්ධතිය තුළ සිටින සමහර පුද්ගලයින්ගේ උපරිම උත්සාහයන් හමුවේ වුවද, විමර්ශන ක්‍රියාවලිය කිසි විටෙකත් යුක්තිය සහ වගවීම සඳහා සැලසුම් කර හෝ අපේක්ෂා කර නොමැත. සැකකරුවන් කිහිප දෙනෙකු අත්අඩංගුවට ගෙන මාස ගණනක් හෝ වසර ගණනාවක් රඳවා තබා ගැනීම සිදු වුවද, වඩාත් දේශපාලනික ප්‍රතිවිපාක ඇති පුද්ගලයන්ට රටින් පලා යාමට අවසර දී ඇති අතර, ඝාතනය සම්බන්ධයෙන් කිසිවෙකුට කිසිදා චෝදනා එල්ල වී නොමැත.

ඝාතනය සම්බන්ධයෙන් අවම වශයෙන් එක් සැකකරුවෙකු එක්සත් රාජධානියේදී අත්අඩංගුවට ගෙන, එම විමර්ශනය තවමත්, ශ්‍රී ලංකා බලධාරීන්ගේ සහයෝගය බලාපොරොත්තුවෙන් සිටින නමුත්, අපේක්ෂිත සහයෝගය මේ දක්වා ලැබී නොමැත. නඩුව සම්බන්ධයෙන් සැකකරුවන්ගෙන් තවත් එක් අයෙකු පසුව එක්සත් රාජධානියේදී අත්අඩංගුවට ගෙන තිබුණ ද මේ දක්වාත් ලැබී නොමැති ශ්‍රී ලංකා බලධාරීන්ගේ සහයෝගය බලාපොරොත්තුවෙන් විමර්ශනය තවමත් ඇණහිට ඇත.

එහි ප්‍රතිඵලයක් වශයෙන්, සත්‍යය නිල වශයෙන් පිළිගැනීම, වන්දි ලබා ගැනීම සහ වගකිවයුත්තන්ට ලැබිය යුතු දඬුවම් සම්බන්ධයෙන් වසර 25 කට පසුවත් තවමත් නිමලරාජන්ගේ පවුලේ අය අවිනිශ්චිතව සිටිති. ඔවුන්ගේ දිගු අරගලය ඔස්සේ ගැටුම් ආශ්‍රිත උල්ලංඝනයන් විමර්ශනය කිරීමට සහ නඩු පැවරීමට අපරාධ යුක්ති යාන්ත්‍රණයන් නැවත නැවතත් අසමත් වී ඇති ශ්‍රී ලංකාවේ ව්‍යාප්තව ඇති රටාව පෙන්නුම් කරයි. වසර ගණනාවක් පුරා විශේෂ විමර්ශන කොමිෂන් සභා කිහිපයක් පත් කර ඇතත්, ඒ කිසිවකින් යුක්තිය ඉටු කර නොමැත.

ඝාතනය සිදු වූ දේශපාලන සන්දර්භය පැහැදිලි කර, නිමලරාජන් සහ ඔහුගේ කෘති හඳුන්වා දෙමින් මෙම වාර්තාව ආරම්භ වේ. 2 වැනි කොටසේ දී 2000 ඔක්තෝබර් 19 වන දින සිදු වූ ඔහුගේ ඝාතනය විස්තර කරන අතර, 3 වැනි කොටස නිල විමර්ශනයේ ගමන් පථය සහ එහි අසාර්ථකත්වය විමසා බලයි. 4 වැනි කොටස අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අදාළව විමර්ශනය තක්සේරු කරන අතර එහි අඩුපාඩු ඉස්මතු කරයි. 5 වැනි කොටස නිමලරාජන්ගේ ඝාතනය විමර්ශනය කිරීමට අපොහොසත් වීමේ ඇඟවුම් සමාලෝචනය කරන අතර 6 වැනි කොටස සිවිල් යුධ සමයේ සිදු වූ අනෙකුත් මාධ්‍යවේදීන් සහ මාධ්‍ය වෘත්තිකයන් ඝාතන පිළිබඳ දළ විශ්ලේෂණයක් සපයයි.

අවසාන වශයෙන්, 7 වැනි කොටස යුක්තිය සහ වගවීම සෙවීමේදී ශ්‍රී ලංකා රජය සහ අනෙකුත් අදාළ ක්‍රියාකාරීන් වෙත යොමු කරන ලද නිගමන සහ නිර්දේශ කිහිපයක් ඉදිරිපත් කරයි.

## 1.2 ඝාතනය සම්බන්ධ දේශපාලන සන්දර්භය

දෙමළ ජාතිකයන් බහුතරයක් වෙසෙන සහ ඔවුන්ගේ ඓතිහාසික අගනුවර වන යාපනය පිහිටා ඇති ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල, දශක තුනක් පුරා පැවති ගැටුමට දිගුකාලීන ජනවාර්ගික ආතතීන් හේතු වී තිබේ. ජාතික වශයෙන්, බහුතර ජනගහනය සිංහල වන අතර දශක ගණනාවක් තිස්සේ ක්‍රමානුකූලව කොන් කිරීම සහ දෙමළ සුළුතරයට එරෙහිව වෙනස් කොට සැලකීමේ රාජ්‍ය භාවිතයන්ට මෙම විෂමතාව දායක වී ඇත. මෙම විෂමතාව සහ එහි දේශපාලන ප්‍රතිවිපාක, 1983 දී සිවිල් යුද්ධය ආරම්භ වීමට කේන්ද්‍රීය විය.[1]

1995 දෙසැම්බර් මාසයේ දී ශ්‍රී ලංකා හමුදාව (SLA) විසින් බෙදුම්වාදී ඊලාම් විමුක්ති දෙමළ කොටි (LTTE) සංවිධානයෙන් යාපනය නැවත අත්පත් කර ගත්තේය. භෞමික වශයෙන් මෙම ජයග්‍රහණය ලබා තිබියදීත්, 2009 මැයි මාසයේ දී මිලිටරිමය වශයෙන් පරාජය වන තෙක් එල්ටීටීඊය කැරැල්ල දිගටම කරගෙන ගිය බැවින් සන්නද්ධ ගැටුම තවත් වසර ගණනාවක් පුරා පැවතුනි. මෙම කාලය තුළ, රජයට පක්ෂපාතී දෙමළ පැරාමිලිටරි කණ්ඩායම් රජයේ ආරක්ෂක හමුදා සමග, විශේෂයෙන් නිමලරාජන් ඝාතනය වූ අවස්ථාවේ දී, ඊලාම් මහජන ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය (ඊපීඩීපී) එක්ව ක්‍රියාත්මක වීම සිදු විය. දෙමළ මාධ්‍යවේදීන්, විපක්ෂ දෙමළ දේශපාලනඥයින්ෙ සහ ක්‍රියාකාරීන් ඉලක්ක කරගත් ඝාතන ඇතුළු ප්‍රචණ්ඩකාරී දේශපාලන බිය ගැන්වීම් සහ මර්දනයන් සඳහා ඊපීඩීපිය, විවෘතව වගකිව යුතු විය. ද්‍රව්‍යමය සහ දේශපාලන සහයෝගය ඇතුළු රාජ්‍යයේ පිටුබලය සහිතව, නායක ඩග්ලස් දේවානන්ද යටතේ ඊපීඩීපියට දඬුවම් විරහිතව ක්‍රියාත්මක වීමට ඉඩ ලැබී තිබුණි. දේවානන්ද සහ අනෙකුත් ජ්‍යෙෂ්ඨ පුද්ගලයින් පසුව අමාත්‍ය තනතුරු ඇතුළු විධිමත් දේශපාලන ව්‍යුහයන්ට ඒකාබද්ධ වීම සිදු විය.

2002 පෙබරවාරි මාසයේ දී දෙමළ කොටි සංවිධානය සහ ශ්‍රී ලංකා රජය අතර බලාත්මක වූ සටන් විරාම ගිවිසුමට ඊපීඩීපී වැනි පැරාමිලිටරි කණ්ඩායම් නිරායුධ කිරීමට අවශ්‍ය වන විධිවිධාන ඇතුළත් වූ නමුත් ඒවා කිසි විටෙකත් සම්පූර්ණයෙන් ක්‍රියාත්මක නොවීය. විශ්වාසදායක සාක්ෂි තිබියදීත්, බරපතල මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් ඊපීඩීපී සාමාජිකයින්ට එරෙහිව විමර්ශනය කිරීමට හෝ නඩු පැවරීමට අපොහොසත් වීම මානව හිමිකම් උල්ලංඝනයක් වේ. රාජ්‍යයේ සහ එහි ආරක්ෂක හමුදාවන්ගේ මෙන්ම, ඊපීඩීපී වැනි පැරාමිලිටරි කණ්ඩායම්වල දණ්ඩමුක්තිය අද දක්වාම පවතින අතර, එය වගවීම සහතික කිරීම සහ නැවත සිදු වීම වැළැක්වීම සඳහා දේශීය හා ජාත්‍යන්තර නීතිය යටතේ ඇති බැඳීම් ඉටු කිරීමට රාජ්‍යය අසමත් වීමක් ලෙස සැලකේ.

## 1.3 මයිල්වාගනම් නිමලරාජන්ගේ කටයුතු

මයිල්වාගනම් නිමලරාජන් විසිවන සියවසේ අවසාන දශකයේ ක්‍රියාකාරී ව සිටි කීර්තිමත් බහුභාෂික දෙමළ මාධ්‍යවේදියෙකි. ඔහු දෙමළ දිනපතා පුවත්පතක් වන *වීරකේසරි* සහ සිංහල සතිපතා පුවත්පත් වන *හරය* සහ *රාවය* සඳහා යාපනයේ වාර්තාකරු වූ අතර *ටැමිල්නෙට්* අන්තර්ජාල ප්‍රවෘත්ති සේවාව සඳහා ද වාර්තා සිදු කළේය. යුද්ධයෙන් විනාශ වූ උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල බීබීසියේ දෙමළ සහ සිංහල සේවාවන් සඳහා ද වාර්තාකරුවෙකු සේ කටයුතු කළ ඔහු, 'නවතම වර්ධනයන් පිළිබඳව බාහිර ලෝකයට දැනුම් දීම සඳහා වගකියන එකම පුද්ගලයා' සහ 'අර්ධද්වීපයේ ක්‍රියා කළ හැකි ස්වාධීන මාධ්‍යවේදීන් කිහිප දෙනාගෙන් කෙනෙකු' ලෙස ඇතැම් විට

[1] 1972-2012 සිදුවීම් පිළිබඳ කාලරේඛාවක් සහ සමහර සිදුවීම් පිළිබඳ විස්තරයක් සඳහා, බලන්න Frances Harrison, 'Still Counting the Dead: Survivors of Sri Lanka's Hidden War', Portobello Books, 2012, or BBC Sri Lanka Profile – Timeline: https://www.bbc.co.uk/news/world-south-asia-12004081

[2] බලන්න TamilNet: 19, 20 ඔක්තෝබර් 2000, 13 ඔක්තෝබර් 2003: https://www.tamilnet.com/art.html?catid=13&artid=12703; *ටැමිල්නෙට්* යනු 1995 දී ආරම්භ කරන ලද පුළුල් ලෙස කියවන ඉංග්‍රීසි භාෂා ප්‍රවෘත්ති වෙබ් අඩවියක් වන අතර එය ශ්‍රී ලංකාවේ දෙමළ ජනතාව සහ ශ්‍රී ලංකා ගැටුම පිළිබඳ වාර්තා කිරීම සඳහා විශේෂිත වූ අතර, එවකට එහි කර්තෘ (පසුව ඝාතනයට ලක් විය) නිමලරාජන්ගේ මිතුරෙකු විය.

බ්‍රිතාන්‍ය *ගාඩියන්* (Guardian) පුවත්පත විසින් ඔහුව විස්තර කර දී තිබේ.[3]

## 1.4 ශ්‍රී ලංකාවේ මැතිවරණය: 2000 ඔක්තෝබර්

2000 ඔක්තෝබර් 10 වන දින, අඛණ්ඩ ගැටුම් මධ්‍යයේ, ශ්‍රී ලංකාවේ මහ මැතිවරණයක් පැවැත්විණි. ඊට පෙර, ශ්‍රී ලංකා ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග විසින් කැරලිකාර දෙමළ කොටින්ට එරෙහිව ප්‍රධාන මෙහෙයුමක් නිවේදනය කළාය. උතුරු යාපනය අර්ධද්වීපයේ පදිංචි නිමලරාජන්, බීබීසියේ දෙමළ සහ සිංහල භාෂා සේවා ඇතුළු විවිධ ප්‍රවෘත්ති සංවිධාන සඳහා වාර්තා කරමින් සිටියේය. නිමලරාජන් යාපනයෙන් ස්වාධීන ප්‍රවෘත්ති ඉදිරිපත් කරන ස්වල්ප දෙනෙකුගෙන් කෙනෙකු වූ අතර, ඔහු ප්‍රධාන රජයට පක්ෂපාතී දෙමළ පැරාමිලිටරි කණ්ඩායමක වූ ඊපීඩීපීයේ හාවිතයන් පිළිබඳව විවේචනාත්මකව වාර්තා කරමින් එහි සාමාජිකයින්ට ප්‍රචණ්ඩත්වය, මැතිවරණ වංචා සහ බිය ගැන්වීම් සම්බන්ධයෙන් චෝදනා කළේය.[4] මැතිවරණයට කලින් මාසයේ දී, දෙපාර්ශ්වය ම විසින් සිදු කරන ලද මැතිවරණ ආශ්‍රිත ප්‍රහාරවලින් 50 කට වැඩි පිරිසක් මිය ගිය බව වාර්තා විය.[5] ඉන්පසු, ඡන්දයට සති දෙකකට පෙර, නිමලරාජන් සතුව තිබී, යාපනයේ සියලුම අපේක්ෂකයින් පෙන්වන ඡායාරූප සහිත කවරයක් ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා විසින් අල්ලා ගැනීම සිදු විය. 'පොලිසියේ සහ හමුදා සාමාජිකයින් ලියුම් කවරය ගැන ප්‍රශ්න කිරීමට ඔහුගේ නිවසට ගිය' බවට Reporters sans frontières (දේශසීමා නොමැති වාර්තාකරුවන්, හෝ RSF) පසුව වාර්තා කර තිබුණි. නිමලරාජන් මෙම ඡායාරූප දෙමළ කොටින්ට යැවීමට සැලසුම් කළ බවට චෝදනා එල්ල වූ නමුත්, තර්කය වූයේ කොළඹ *රාවය* කර්තෘ විසින් රූප සඳහා කරන ලද ඉල්ලීමක් ඉටු කිරීමට එය සිදු කළ බවයි.[6]

නව සභාග රජයේ කොටසක් ලෙස ඊපීඩීපී පක්ෂය මැතිවරණයේදී ආසන හතරක් ලබා ගත්තේය. නිමලරාජන් *ටැමිල් නෙට්* වෙත පවසා තිබුණේ 'ඊපීඩීපී විසින් ලබා ගැනීමට අපේක්ෂා කළ යාපනයේ බහුතර ඡන්ද ලබා නොලැබීම සම්බන්ධයෙන් ඔහු අර්ධ වශයෙන් වගකිව යුතු'[7] වූ බව ඊපීඩීපී මතය වූ බවයි. කෙසේ වෙතත් , ඊපීඩීපී නායක ඩග්ලස් දේවානන්ද උතුරු පුනරුත්ථාපන, ප්‍රතිසංස්කරණ සහ දෙමළ කටයුතු පිළිබඳ අමාත්‍ය ධුරයට පත් කරන ලදී[8]. පසුව සම්මුඛ සාකච්ඡාවක දී නිමලරාජන් 'ඇතැම් පුද්ගලයින්ගේ ජීවිත අවදානමට ලක්වන ආකාරයෙන් තම කටයුතු කරගෙන යන' නිසා ඊපීඩීපී පක්ෂය විසින් ඔහුට අනතුරු ඇඟවූ බවයි ප්‍රකාශ කර සිටියේය.[9] සිය මැතිවරණ වාර්තාකරණය නිසා ඔහුට ඊපීඩීපීහි 'ඉහළ පුද්ගලයින්ගෙන්' මරණ තර්ජන ලැබී ඇති බවත්, ඔහුට 'කිසියම් කරදරයක්' සිදුවුවහොත් එය ඊපීඩීපී පක්ෂයෙන් සිදු කෙරෙන බවත් ඔහු පැවසූ බව නිමලරාජන්ගේ මිතුරන් වඩාත් පැහැදිලිව දක්වා තිබුණි. නිමලරාජන් විසින් ම තර්ජනාත්මක දුරකථන ඇමතුම් ලැබීම පිළිබඳව නිල වශයෙන් පැමිණිලි කළ නමුත් ඒවා සොයාගත නොහැකි බව දන්වා තිබුණි. ඔහුගේ බිරිඳ ද බිය ගැන්වීම්වලට ගොදුරු ව සිටියාය.[10] හමුදාව තමා සොයා ආ බවත්, 'තර්ජන කිහිපයක් ලැබුණු බැවින් සිය ආරක්ෂාව ගැන සිත්තැවුලෙන් සිටින' බවත් ඔක්තෝබර් 16 වන දින නිමලරාජන් *ටැමිල්නෙට්* වෙත පැවසුවේය.[11] RSF විමර්ශනයකින් පසුව, ඔවුන් ප්‍රකාශ කළේ, 'ඔහුගේ මරණයට පැය කිහිපයකට පෙර' අපේක්ෂක ඡායාරූප සම්බන්ධයෙන් නිමලරාජන්ගෙන් 'හමුදා සාමාජිකයින් විසින් නැවතත් ප්‍රශ්න කරන ලද' බවයි.[12]

[3] Guardian 23 ඔක්තෝබර් 2000: https://www.theguardian.com/news/2000/oct/23/guardianobituaries2

[4] *TamilNet*: 20 ඔක්තෝබර් 2000: https://www.tamilnet.com/art.html?catid=13&artid=5513

[5] BBC ප්‍රවෘත්ති, 6 ඔක්තෝබර් 2000: http://news.bbc.co.uk/1/hi/world/south_asia/959214.stm

[6] RSF (Reporters without Borders) Damocles Network සමග, විවෘත ලිපියක්, 17 ඔක්තෝබර් 2002: https://rsf.org/en/open-letter-sri-lankan-prime-minister

[7] *TamilNet*: 20 ඔක්තෝබර් 2000: https://www.tamilnet.com/art.html?catid=13&artid=5513

[8] *TamilNet*: 25 ඔක්තෝබර් 2000: https://www.tamilnet.com/art.html?catid=13&artid=5523

[9] ජූලි 2001: https://www.theacademic.org/feature/deva/. 'ඔහුගේ ඝාතනයට අපි කිසිසේත් වගකිව යුතු නැහැ' යනුවෙන් දේවානන්ද තවදුරටත් පැවසීය.

[10] නිමලරාජන්ගේ ඝාතනය පිළිබඳ විමර්ශනය ආවරණය කරන පුළුල් නමුත් සම්පූර්ණ නොවූ අධිකරණ ලේඛන කට්ටලයක් 2023 දී යාපනය මහේස්ත්‍රාත් අධිකරණය විසින් නිකුත් කරන ලද අතර ඉන් පසුව MCJ2023 නිකුත් කරන ලදී. 2001 මැයි 30 වන දින කොළඹ CID හි පොලිස් පරීක්ෂක ද සිල්වා විසින් අධිකරණයට ඉදිරිපත් කරන ලද සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශවල පොලිස් සාරාංශ බලන්න: MCJ2023 පිටු 269-271.

[11] TamilNet: 20 ඔක්තෝබර් 2000: https://www.tamilnet.com/art.html?catid=13&artid=5513

[12] RSF, 2002: https://rsf.org/en/open-letter-sri-lankan-prime-minister. තව දුරටත් බලන්න TamilNet, 27 ඔක්තෝබර් 2000, නිමලරාජන් 'ඔහුගේ ඝාතනයට පෙර දින පක්ෂ සාමාජිකයින් විසින් ඔහු බැලීමට ගොස් තර්ජනය කළ බවට වාර්තා වී ඇති බව' සඳහන් වේ: https://www.tamilnet.com/art.html?catid=13&artid=5530

# 2. ඝාතනය

නිමලරාජන් යාපනයේ චුන්ඩුක්කුලි, කච්චේරි නල්ලූර් පාරේ, චුන්ඩුක්කුලි දුම්රිය මාවතේ අංක 17/3 දරන ස්ථානයේ ජීවත් විය. 2000 ඔක්තෝබර් 19 වැනි දින සවස් වරුවේ ඔහු තම මව සහ පියා, බිරිඳ පරිමාලා, වයස අවුරුදු පහට අඩු ඔහුගේ කුඩා දියණියන් තිදෙනා සහ යාබද නිවසේ ජීවත් වූ ඔහුගේ 11 හැවිරිදි බෑණනුවන් වන ප්‍රසන්න සමග නිවසේ සිටියේය.[13] කලින් සැලසුම් කළ විදුලිය අත්හිටුවීමකින් අනතුරුව ප්‍රදේශයේ විදුලි සැපයුම නැවත බල ගැන්වීම සිදුව නොතිබූ බැවින්[14], නිමලරාජන් භූමිතෙල් ලාම්පුවක ආලෝකයෙන් සිය වැඩකටයුතුවල නිරත විය. ඔහුගේ පියා නිවසේ ප්‍රධාන විසිත්ත කාමරයේ, අඩ අඳුරේ සැහැල්ලු පුටුවක වාඩි වී රාත්‍රී 9.15 සිට 9.45 දක්වා විකාශය වූ බීබීසී හි සවස ප්‍රවෘත්තිවලට සවන් දෙමින් සිටියේය. දරුවන් නිදි කරවමින් සිටි නිමලරාජන්ගේ බිරිඳ, ඔවුන් සමග ම නින්දට වැටී සිටි අතර, ප්‍රසන්න ද නිදා සිටියේය. ප්‍රවෘත්ති විකාශය අවසන් භාගය වන වන විට[15], නිමලරාජන් දුරකථන ඇමතුමක් ගත්තේය[16]. කලින් නිදා සිටි ඔහුගේ මව වන ලිලී තෙරේස් අඳුරේ ම නාන කාමරයට යමින් සිටියාය. ඔවුන්ගේ නිවසේ බිත්තිවලින් ඔබ්බෙන් වූ, අසල්වැසි ප්‍රදේශයේ ඇඩි හමුදා ඇඳිරි නීතිය ක්‍රියාත්මක වෙමින් පැවතුනි.

නිවසේ ඉදිරිපස දොර විවෘතව තිබුණි. අඩ අඳුරේ සිටි, නිමලරාජන්ගේ පියා වන මයිල්වාගනම්ට, ටී-ෂර්ට් එකක් සහ දිගු කලිසමක් ඇඳගත් රුවක් ඇතුළු වන ආකාරය දිස්විය. ඔහු, 'පුතා, ඔයා කවුද?' යැයි විමසමින් වාඩි වී සිටි පුටුවෙන් නැගිටින්නට උත්සාහ කළ නමුත් පැමිණ සිටි පුද්ගලයා සිය හිසෙන් ඔහුව පසුපසට තල්ලු කර දැම්මේය. ඒ සමගම, ඔහු සිය අනෙක් අතින් මයිල්වාගනම්ගේ බෙල්ලට පිහියක් තැබුවේය. පළමුවෙන් පැමිණි පුද්ගලයා ඔහුගේ මුහුණට, හිසට සහ බෙල්ලට සෙන්ටිමීටර 30 ක පිහියකින් දරුණු කැපුම් තුවාල සිදු කරමින්[17] ඔහුට පහර දෙන විට, දෙවැනි රූපයක් සිය පුතා වැඩකරමින් සිටි කාමරයේ දොරකඩට දෙසට 'වේගයෙන් පැමිණෙන' ශබ්දය මයිල්වාගනම්ට ඇසුණි. මයිල්වාගනම් කෑ ගැසීමට පටන් ගත්තේය. වෙඩි හඬ දෙකක් ඇසුණු අතර, අනතුරුව තුන්වැනි වෙඩි හඬක් ඇසුණි. ඔහුගේ බිරිඳ වන නිමලරාජන්ගේ මව වෙඩි හඬ ඇසී නාන කාමරයෙන් පිට වී, ඉදිරියට දිව ආවාය. නිමලරාජන්ගේ බෑණනුවන් වන ප්‍රසන්න ද දිව ආවේය. තම හිස අල්ලා ගෙන සිටි ඇඩි ග්‍රහණය ලිහිල්වනු දැනුණු මයිල්වාගනම් දැතින් ම සිය තුවාල වූ හිස බදා ගත් අතර: ඔහුගේ හිස් කබලේ කොටසක් ඔහුගේ පුටුවේ වැටී තිබුණි. ප්‍රහාරකයින්, අත් බෝම්බයක් පුපුරුවා හරිමින්

[13] නිමලරාජන්ගේ ඝාතනය පිළිබඳ මෙම වාර්තාව MCJ2023 තුළ බහුවිධ ලේඛන ඒකාබද්ධ කරයි: නිමලරාජන්ගේ පියා විසින් යාපනයේ වැඩබලන අධිකරණ වෛද්‍ය නිලධාරී වෛද්‍ය එස්. වී. සිරිරාජේශ්වරන් වෙත ලබා දුන් ප්‍රකාශය, 2000 ඔක්තෝබර් 20: MCJ2023 p243; මහේස්ත්‍රාත්, විනිසුරු ඊ.ටී. විග්නරාජා මහතා විසින් ස්ථානීය විමර්ශනයේ සටහන්, 2000 ඔක්තෝබර් 20: MCJ2023 pp52-55; නිමලරාජන්ගේ පියා විසින් රෝහලේ මහේස්ත්‍රාත්වරයාට ලබා දුන් ප්‍රකාශය, 2000 ඔක්තෝබර් 20: MCJ2023 pp57-59; නිමලරාජන්ගේ මස්සිනා විසින් අධිකරණ සාක්ෂිය, 2000 ඔක්තෝබර් 27: MCJ2023 pp60-64; නිමලරාජන්ගේ මව විසින් අධිකරණ සාක්ෂිය, 2000 ඔක්තෝබර් 31: MCJ2023 pp65-67; යාපනය භාර නිලධාරී අයි පී ආරියවංශ විසින් අධිකරණයට ඉදිරිපත් කරන ලද නිමලරාජන්ගේ පවුලේ සාමාජිකයන් විසින් දින නියම නොකළ ප්‍රකාශවල CID සාරාංශ: 2001 අප්‍රේල් 22, MCJ2023 පිටු 264-266; 2001 අප්‍රේල් 28 දින කොළඹ CID කණ්ඩායම විසින් ගන්නා ලද අසල්වැසියන් සහ අනෙකුත් අදාළ පාර්ශවයන්ගේ ප්‍රකාශවල CID සාරාංශ, සහ දැනට කොළඹ ජීවත් වන නිමලරාජන්ගේ පවුලේ අය විසින් ඒකාබද්ධව අධිකරණයට ඉදිරිපත් කරන ලද වැඩිදුර ප්‍රකාශවල CID සාරාංශ, 2001 මැයි 30 දින කොළඹ CID පරීක්ෂක ද සිල්වා විසින්: MCJ2023 පිටු 268-273. එය 2025 මැයි මාසයේදී දිවි ගලවා ගත් නිමලරාජන් පවුලේ සාමාජිකයන් විසින් ITJP වෙත ලබා දුන් මතකයන් මත ද පදනම් වේ.

[14] අසල්වැසියෝ රාත්‍රී 9.15 හෝ 9.30 ට පමණ සැපයුම නැවත ආරම්භ කරනු ඇතැයි අපේක්ෂා කළහ: 2002 අප්‍රේල් 29 වන දින පරීක්ෂක ද සිල්වා විසින් අධිකරණයට ඉදිරිපත් කරන ලද ජෝර්ජ් රාජරත්නම් තිරුබයිරාජා, බාලරත්නම් ගනේෂානන්දන් සහ තිරුඥානම් ජෝන් ක්වින්ටස් විසින් CID ප්‍රකාශවල සාරාංශ බලන්න: MCJ2023 පිටු 295-296; 2001 මැයි 30 වන දින අධිකරණයට ඉදිරිපත් කරන ලද ප්‍රාදේශීය විදුලිබල මණ්ඩලයේ අධිකාරී කන්දයියා සිදම්බරනාදන්ගේ ප්‍රකාශය ද බලන්න: MCJ2023 පිටුව 270.

[15] පසුදා රෝහල් සම්මුඛ සාකච්ඡාවකදී නිමලරාජන්ගේ පියා ඝාතනය සිදු වූ වේලාව මෙම බීබීසී ප්‍රවෘත්ති විකාශනයට සම්බන්ධ කළේය. පසුව සමහර අසල්වැසියන් වේලාව රාත්‍රී 10 හෝ 10.15 ලෙස මඳක් ප්‍රමාද කර දැක්වූහ.

[16] පොලිස් සාරාංශයේ සඳහන් වන්නේ ඔහුට දුරකථන ඇමතුමක් 'ලැබෙමින්' තිබූ බවත්, ඔහු ඇමතුමක් ලබා නොගත් බවත්ය: MCJ2023 පිටුව 2.

[17] බලන්න https://www.bbc.com/sinhala/highlights/story/2004/08/040820_frances. නිමලරාජන්ගේ පවුලේ සාමාජිකයින්ට එල්ල කරන ලද පහරදීම් පොලිස් විමර්ශනයේ කොටසක් ලෙස ලැයිස්තුගත කර ඇතත්, මෙහි සඳහන් කර ඇති වෛද්‍ය වාර්තාව MCJ2023 හි ලේඛනගත කර නොමැත.

පළා ගිය අතර එය විසිත්ත කාමරය මැද පුපුරා ගියේය.[18] පිපිරීමෙන් ප්‍රසන්නගේ කකුල කැඩී එල්ලෙමින් තිබුණි. මයිල්වාගනම්ට අත්බෝම්බ කැබලි වැදී තිබුණි. කකුල් සහ උදරයට දරුණු තුවාල සිදුව සිටි ඔහුගේ බිරිඳ මෙහොතකට ක්ලාන්ත වූවාය. පිපිරීමෙන් සිවිලිමේ කොටසක් කඩා වැටී, ඉදිරිපස වූ වීදුරු ප්‍රදර්ශන පෙට්ටියක් විනාශ වී, නිවසේ ඉදිරිපස තිබූ ජනෙල් වීදුරු සියල්ල පුපුරා, නිවසේ ලාම්පු ද බිඳී ගොස්, අඳුරේ දූවිලි හා දුම නිවස පුරා පැතිර යමින් තිබුණි.[19] දරුවන්ගේ නිදන කාමරයෙන් පිටතට දිව ආ නිමලරාජන්ගේ බිරිඳ වන පරිමලාට, පවුලේ සාමාජිකයන් ලේ ගලමින් බිම වැටී සිටිනු දකින්නට සිදු විය.

යාබද නිවසක තම දරුවන් සමග ජීවත් වූ නිමලරාජන්ගේ සහෝදරිය වන ප්‍රේමරානි සහ ඇගේ සැමියා වන ඇන්ටන් ජෙගතාස් පෝල්ටත්, වෙඩි හඬ ඇසුණි. මුලින් ඔවුන් සුපුරුදු පරිදි ආරක්ෂාව සඳහා මේසයක් යට සැඟවී සිටිය ද, පසුව මයිල්වාගනම්ගේ කැගැසීම ඇසී වයස අවුරුදු 16 ක් වූ ඔවුන්ගේ වැඩිමහල් පුත් ප්‍රේම්ජී සමග දුව එන විට, අත්බෝම්බය පුපුරා යනු ඔවුන්ට ඇසුණු අතර, ඒ පිපිරීමත් සමග නිමලරාජන්ගේ නිවසේ ඉදිරිපස මුළු කොටසම ක්ෂණිකව ආලෝකමත් වනු අපෙනුණි. එහෙත් ඔවුන් ඇතුළු වූ විට, සියල්ල අන්ධකාරයෙන් හා ව්‍යාකූලත්වයෙන් පිරී තිබුණි. ඇගේ දෙපා බිමට ඇලෙන බව ප්‍රේමරානිට දැනුණු අතර; තමා ලේ විලක් මැදින් ඇවිද යන බව ඇයට පසුව වැටහුණි. ප්‍රේම්ජී උදව් ඉල්ලා කැගැසීමට ආපසු පිටතට දිව ගිය නමුත් ඔහුට  කිසිම හඬක් පිට කිරීමට නොහැකි විය. වහාම ඔහු පසුපස ගිය ඔහුගේ මව, මේ වන විට දැඩි ලෙස කලබලයට පත්ව සිටි අසල්වැසියන්ගෙන් උපකාර ඉල්ලා මහ හඬින් කැගසන්නට විය. අනෙක් පස ජීවත් වූ පහළම මට්ටමේ පළාත් පාලන පරිපාලකවරයෙකු වන ග්‍රාම සේවක මහතාට[20] ඇය විසින් මෙය දැනුම් දීමෙන් අනතුරුව, ඔහු පවුලේ අය රෝහලට ගෙන යෑමට ලැන්ඩ් මාස්ටර්යක් එනම්, ට්‍රේලරයක් සහිත කුඩා විවෘත ට්‍රැක්ටරයක් ලබා දෙන ලෙස තවත් අසල්වැසියෙකුට යාප්පු වෙමින් සිටියේය. ඒ සමග ම ප්‍රේමරානිගේ සැමියා විදුලි පන්දමක් රැගෙන ඉක්මනින් ළඟම ඇති හමුදා ආරක්ෂක මුරපොළට සිද්ධිය වාර්තා කිරීමට පිටත් විය. විදුලිය නැවත පැමිණෙන විට ම ඔහු සෙබළුන් පස් දෙනෙකු හෝ ඊට වැඩි පිරිසක් කැටුව ආපසු පැමිණි අතර, විදුලිබල මණ්ඩලයේ ප්‍රාදේශීය අධිකාරීවරයාට අනුව, එදින රාත්‍රියේ දහයට පසු වී විනාඩි පහකින් විදුලිය යථා තත්ත්වයට පත් කිරීම සිදු වී ඇත. නිමලරාජන් ඔහු වැඩ කරමින් සිටි කාමරයේ දොරටුව අසල මුණින් අතට බිම වැටී සිටිනු දක්නට ලැබුණු අතර, කාමරයෙන් පිටතට ලේ ගඟක් ගලා යමින් තිබුණි. ඔහු මිය ගොස් ඇති බව මේ වන විට ඔහුගේ පවුලේ සාමාජිකයින් වටහා ගෙන සිටියෝය.

තුවාලකරුවන් රෝහලට ගෙන යාම සඳහා හමුදා ට්‍රක් රථයක් සපයන බව සෙබළුන් විසින් පවසා තිබුණි. විසිත්ත කාමරයේ පුටුවක් යට තිබී හමු වූ ග්‍රෙනේඩ් ලීවරයක් සහ එක් උණ්ඩ ආවරණයක් ද ඔවුන් සිය භාරයට ගත්හ. නිවස අසල රැස් වීමට පටන් ගත් සමහර අසල්වැසියන් තුවාල ලැබූ පවුලේ සාමාජිකයින්ගේ තුවාල වෙලීමට උත්සාහ කරමින් සිටියෝය. හමුදා වාහනයක් පැමිණෙන බවක් නොපෙනුණු අතර ගිලන් රථයක් කැඳවීම කිසිසේත්  නොකළ හැකි බව පැහැදිලි විය. සැලකිය යුතු ව්‍යාකූලතාවයකින් පසු, මිතුරන් සහ ඥාතීන් විසින් නිමලරාජන්ගේ දේහය ලැන්ඩ් මාස්ටර් ට්‍රේලරයට ගෙන ගිය අතර, දරුණු ලෙස තුවාල ලැබූ ඔහුගේ පවුලේ සාමාජිකයන් තිදෙනාට ද එයට ගොඩ වීමට උපකාර ලැබුණි. සිය පුත් ප්‍රසන්න උකුලට ගත් ප්‍රේමරානි ද එයට ගොඩ වූ අතර, ඇගේ සැමියා ද ඔවුන්ට එක්විය. රාත්‍රියේ ගමන් කිරීමේදී අල්ලා ගැනීමේ අවදානම ඇතුළුව ඇඳිරි නීතිය කඩ කිරීමට රියදුරා බිය වූ නිසා, ගමේ පරිපාලක වූ ග්‍රාම සේවකවරයා තම යතුරුපැදියෙන් ඔවුන් සමග යාමට පෙළඹුනේය. මේ අතරේ නිමලරාජන්ගේ තුවාල නොලැබූ බෑණනුවන් වන ප්‍රේම්ජී මොටර්සයිකලයේ පිටුපසින් ගොඩ විය. මුල දී හුළු අතු රැගත් අසල්වැසියන් මෙම කුඩා රථ පෙළ පසුපස පයින් ගමන් කළ ද, ඔවුන් වැඩි වෙලා නොගොස් නැවතුණු නිසා ලැන්ඩ්මාස්ටරය හා  මෝටර් සයිකලය අඳුරේම ඉදිරියට ඇදෙන්නට විය. එතැන සිටි සෙබළුන්

18 MCJ2023 හි සපයා ඇති ප්‍රකාශවල ප්‍රහාරකයින් අත්බෝම්බය විසි කරන විට ඔවුන් ස්ථානගත කර ඇති ස්ථානය නිශ්චිතව සඳහන් කිරීමට අපොහොසත් වී ඇත,  නමුත් පිපිරීමේ දී මිදී යන එහි ලීවරය පුටුවක් යට තිබී හමු විය: 2001 මැයි 30 වන දින පොලිස් පරීක්ෂක ද සිල්වා විසින් අධිකරණයට ඉදිරිපත් කරන ලද අසල්වැසි සිසිල් සෙල්වරාජ් දිනේෂ්ගේ සාරාංශගත ප්‍රකාශය බලන්න: MCJ2023  පිටුව 268.

19 නිමලරාජන් ඔහුගේ අධ්‍යයන කාමරයේ කවුළුව හරහා වෙඩි තබා ඝාතනය කරන ලද බවට දිගින් දිගටම පැතිර යන කතාවක් බවට පත්ව ඇති බව ප්‍රවෘත්ති වාර්තාකරුවන් පසුව තහවුරු කළහ. කෙසේ වෙතත්,  පිටත නිරීක්ෂණය නොකළ තුන්වන ප්‍රහාරකයෙකු සිටියද,  ඔහුගේ වෙඩි උණ්ඩවල කෝණ අනුව මෙය  සිදු කළ නොහැක්කකි.

20 මෙම දෙමළ නාමය 1993 දී සිංහල ‘ග්‍රාම නිලධාරී’ ලෙස නිල වශයෙන් ප්‍රතිස්ථාපනය කරන ලද නමුත් දෙමළ කතා කරන්නන් අතර පැරණි නාමය දිගටම භාවිතයේ පැවතුනි.

දෙදෙනෙකු ද ඔවුන්ව පසුපස යාමට සූදානම්ව සිටිය ද, ඔවුන් ඉක්මනින් තම අදහස් වෙනස් කරගෙන තිබුණි. ඒ වෙනුවට, ගුවන් විදුලි සංඥා ඔස්සේ ඉදිරියේ වූ විවිධ මුරපොලවල් දැනුවත් කිරීමට සහ වඩාත් ඍජු මාර්ගය වන රෝහල් වීදියේ ප්‍රධාන මාර්ග බාධකයක් හරහා යාමට හැකි වන බව සහතික කිරීමට ඔවුහු ඉදිරිපත් වූහ. කෙසේ වෙතත්, මේ පිරිස මාර්ග බාධකය වෙත ළඟා වන විට, එය වසා දමා ඇති බවත්, ඔවුන් දිගු මාර්ගයේ යා යුතු බවත් ඔවුන්ට දන්වනු ලැබුණි. ට්‍රේලරයේ තුවාල ලැබූ තිදෙනාගේ ජීවිත ලේ වහනය නිසා සෙමින් අහිමි වී යනු ඇතැයි පවුලේ අය බිය වී සිටියහ. සිවිල් වැසියන්ගෙන් සම්පූර්ණයෙන්ම හිස් වූ අඳුරු වීදි ඔස්සේ ඔවුන් සෙමින් සෙමින් යාපනය ශික්ෂණ රෝහල කරා ගියෝය. කිලෝමීටරයකට වඩා ටිකක් වැඩි දුරක් යාමට ඔවුන්ට පැයක් ගත වී තිබුණි.[21]

නිමලරාජන්ගේ දේහය මෘත ශරීරාගාරයට භාර දීමෙන් සහ, තුවාල ලැබූ පවුලේ සාමාජිකයන් අදාළ වාට්ටුවලට ඇතුළත් කිරීමෙන් පසු, කණ්ඩායමේ ඉතිරි අය ආපසු යාමට බියෙන් ඇඳිරි නීතිය ඉවත් කරන තෙක් අලුයම වන තුරු ඔවුන් සිටි එම ස්ථානයේම රාත්‍රිය පුරා රැඳී සිටියෝය.

[21] බලන්න https://www.bbc.com/sinhala/highlights/story/2004/08/040820_frances

# ප්‍රහාරය

රාත්‍රී 9.45ට මඳ වේලාවකට පෙර දීර්ඝ කරන ලද විදුලි කප්පාදුවක් අතරතුර දී ඝාතනය සිදු විය

අසල්වැසි ප්‍රදේශවල දැඩි ඇඳිරිනීතියක් පැවතුනි.

අසල මුරපොල කිහිපයකම සිටි සෙබළුන්ට අත්බෝම්බය පුපුරා යන හඬ ඇසුණි




මයිල්වඟනම් නිමලරාජන්, 39, මූනිස්සම් නිසා සිදු වූ තුවාල තුනක් සහිතය, අවසන් උණ්ඩය හිසට එල්ල වී ඇත: ක්ෂණිකව මියගොස් ඇත
ප්‍රහාරකයන් දෙදෙනෙක් මිනිත්තු ගණනත් තුළ ඇතුළු වී සහ පිට වී ගොස් තිබේ.

# යාපනයේ නිමලරාජන්ගේ නිවස




RAKKA ROAD
KACHCHERI NALLUR ROAD
AY LINE
AD LANE
AD
මීටර් 100 දුරින් පිහිටි කෝවිල පාර පටුමගේ මුර පොළ: නිමලරාජන්ගේ මස්සිනා උපකාර පතා දිව ගිය මුරපොළ
ප්‍රධාන හමුදා මුර පොළ මීටර් 200ක් ඔබ්බෙන්: සෙබළුන් හතර දෙනෙක් රජකාරී කරමින් සිටි අතර පිපිරීම් හඬ ඇසීමෙන් අනතුරුව තවත් හටසේනා පැමිණෙනත් තෙක් බලා සිට ඇත.

# රෝහල වෙත ගිය ගමන



ශ්‍රී ලංකා හමුදාවේ 512 වැනි බල සේනාංක මූලස්ථානය, ඥානම් හෝටලය, ඔරලෝසු කණුව පාර
STANLEY ROAD
POWER HOUSE ROAD
JAFFNA-POINT PEDRO ROAD
ඊපීඩීපී ලේකම් කාර්යාලය, 273 ස්ටැන්ලි පාර
CLOCK TOWER ROAD
HOSPITAL ROAD
යාපනය ශික්ෂණ රෝහල කිලෝ මීටර් 1.5 පමණ දුරින් පිහිටා ඇත.
HOSPITAL ROAD
VEMBADY ROAD


දුම්රිය මාර්ගය අසබඩ වදුලක අත් හැර දැමූ බයිසිකලය අසල්වැසියන්ට හමු විය
TEMPLE ROAD
RASAVIN THOTTAM ROAD
LEY ROAD
RAKKA ROAD
RAILWAY LINE
නිමලරාජන්ගේ නිවස
TEMPLE ROAD LANE
TEMPLE ROAD LANE
SOMASUNDARAM AVENUE
TEMPLE ROAD
රෝහල පාර මාර්ග බාධකය: පිරිසට මෙතැනින් යාමට අවසර නොලැබුණි.
HOSPITAL ROAD

# 3. විමර්ශනය

## 3.1 ශ්‍රී ලාංකික ඝාතන විමර්ශනයක විධිවිධාන

ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතියට අනුව, මහේස්ත්‍රාත්වරයෙකු විසින් අපරාධය සිදු වූ භූගෝලීය ප්‍රදේශයේ අපරාධ විමර්ශනයක් අධීක්ෂණය කරනු ලබන අතර, පොලිසිය විසින් සිදු කෙරෙන විමර්ශනය සක්‍රියව මෙහෙයවීම සිදු කරයි. ශ්‍රී ලංකා අපරාධ නඩු විධාන සංග්‍රහයට අනුව, අදාළ අපරාධය සාපරාධී මිනීමැරුමක් ලෙස පෙනෙන විට, මහේස්ත්‍රාත්වරයා මෙන්ම පොලිසියද අපරාධ ස්ථානයට පෞද්ගලිකව පැමිණිය යුතු වේ.[22] සාක්ෂිකරුවන් කැඳවීම සහ පරීක්ෂා කිරීම, සෝදිසි කිරීමේ සහ අත්අඩංගුවට ගැනීමේ වරෙන්තු නිකුත් කිරීම සහ භෞතික සාක්ෂි විශ්ලේෂණය සඳහා යැවිය යුතු බව ඇතුළු අනෙකුත් අවශ්‍ය නියෝග නිකුත් කිරීම මෙන් ම සමස්තයක් වශයෙන්, නිසි පරීක්ෂණ සිදු කරන බව සහ විමර්ශනය කඩිනමින් සහ නීත්‍යානුකූලව සිදු කරන බව සහතික කිරීම ද මහේස්ත්‍රාත්වරයාගේ කාර්යභාරයට ඇතුළත් වේ.[23] නිමලරාජන් නඩුවේ දී, යාපනය මහේස්ත්‍රාත් අධිකරණයේ විනිසුරු ඊ.ටී. විග්නරාජා නඩුව අධීක්ෂණය කළ මහේස්ත්‍රාත්වරයා විය

ශ්‍රී ලංකා අපරාධ නඩු විධාන සංග්‍රහයේ තවත් විධිවිධානයක් තුළින් 'අගතියට පත් පාර්ශ්වයට' නීතිඥවරයෙකු මගින් අධිකරණයේ නියෝජනය කිරීමේ අයිතිය ලබා දෙයි.[24] මෙම පදනම මත, 2002 ජූලි මාසයේ සිට, නිමලරාජන් සහ ඔහුගේ පවුලේ අයගේ අවශ්‍යතා නියෝජනය කරන නීතිඥයින් නඩු විභාග කිහිපයකට සහභාගී වූ අතර, විමර්ශනය ඵලදායී අවසානයක් කරා මෙහෙයවීමට උදව් කිරීමට උත්සාහ කළෝය. මෙම නීතිඥයින්ගෙන් එක් අයෙකුට අනුව, අපරාධ නඩුවල දී වින්දිතයින්ගේ නීතිඥයින්ගේ භූමිකාව තරමක් පටු ලෙස අර්ථකථනය කිරීමට අධිකරණය නැඹුරු වී සිටියි. උදාහරණයක් වශයෙන්, ඔවුන්ට අධිකරණය ඉදිරියේ පෙනී සිටින සැකකරුවන් හෝ වෙනත් අයගෙන් හරස් ප්‍රශ්න ඇසීමට අවසර නොමැති අතර මෙවැනි නඩුවලදී බොහෝ විට ඔවුන්ට සියලු සාක්ෂි වෙත ප්‍රවේශය ලබා නොදීම නිසා බාධා ඇති වේ.[25] නිමලරාජන් නඩු විභාගයේ දී ඔහු වෙනුවෙන් ක්‍රියා කරන නීතිඥයින් විසින් කිහිප වතාවක්ම විශේෂිත සාක්ෂිකරුවන් කැඳවීම හෝ අදාළ තොරතුරු ලබා දීමට හැකි අයගෙන් ප්‍රකාශ රැස් කිරීම; හෝ සැකකරුවන් පලා යාම වැළැක්වීම සඳහා ඵලදායී පියවර ගැනීම වැනි පොලිසිය ගත යුතු විමර්ශන පියවර යෝජනා කළ අතර විනිසුරු විග්නරාජා සෑම විටම පාහේ නිර්දේශිත පියවර ක්‍රියාත්මක කරන ලෙස පොලිසියට නියෝග කළේය. කෙසේ වෙතත්, මෙය බොහෝ විට නිෂ්ඵල බව ඔප්පු විය. නිමලරාජන් විමර්ශනය අතරතුර, සිය නියෝග ක්‍රියාත්මක කිරීමට හෝ අනිවාර්ය ප්‍රමිතීන්ට අනුකූල වීමට අපොහොසත් වී ඇති බව විනිසුරු විග්නරාජා මහතා විසින් පොලිසියට කිහිප වතාවක්ම පෙන්වා දී ඇත.

ශ්‍රී ලංකාවේ අපරාධ පරීක්ෂණයක් අවසන් වූ පසු, සැකකරුවන්ට එරෙහිව ප්‍රමාණවත් සාක්ෂි ඇති බවට ඒත්තු ගැන්විය නොහැකි නම්, මහේස්ත්‍රාත්වරයා විසින් සැකකරුවන් නිදහස් කිරීම හෝ එසේ නැත්නම්, නැතහොත් නඩු විභාගයකට ඉදිරිපත් කිරීම සිදුකරයි. බරපතල නඩුවිභාගයන් හි දී මෙම නඩු විභාගය මහාධිකරණය ඉදිරියේ පැවැත්වෙන අතර, එහිදී මහේස්ත්‍රාත්වරයා විසින් පරීක්ෂණයේ වාර්තාවක් සහ සාක්ෂි මහාධිකරණයට මෙන්ම චෝදනා සම්බන්ධයෙන් වන තීරණ සඳහා වගකිව යුතු වන නීතිපතිවරයාට ද යැවීම සිදු වේ.[26] නිමලරාජන්ගේ ඝාතනයෙන් පසු දින, මාස සහ වසර ගණනාවක් තිස්සේ,

22 අපරාධ නඩු විධාන සංග්‍රහය පනත, 143 වගන්තිය.

23 1979 ශ්‍රී ලංකා අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ, විශේෂයෙන් 9, 124, 136 වගන්තිවල මහේස්ත්‍රාත්වරයාගේ කාර්යභාරය දක්වා ඇත.

24 1979 අපරාධ නඩු විධාන සංග්‍රහ පනත, 260 වගන්තිය.

25 2025 පෙබරවාරි 14 වන දින නීතිඥ කේ.එල්. රත්නවේල් සමග ගසම්මුඛ සාකච්ඡාවක්.

26 අපරාධ නඩු විධාන සංග්‍රහය පනත, 153-154 සහ 159 වගන්ති.

මිනීමැරුම් සැකකරුවන් හඳුනාගෙන නඩු විභාගයට ඉදිරිපත් කරන ලෙස ඉල්ලා මාධ්‍යවේදීන් සහ මානව හිමිකම් සංවිධාන විසින් උද්ඝෝෂණ කරමින් සැලකිය යුතු මහජන පීඩනයක් එල්ල කර ඇත.[27] කෙසේ වෙතත් වසර කිහිපයක පරීක්ෂණවලින් අනතුරුව, සැකකරුවන් පස් දෙනෙකු අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාරගත කර සිටියද, නිමලරාජන්ගේ ඝාතනය සම්බන්ධයෙන් කිසිවෙකුට නඩු පැවරීම සිදු කර නොමැත.

ශ්‍රී ලංකා අපරාධ නඩු විධාන සංග්‍රහයේ සඳහන් කරන පරිදි: 'සෑම විමර්ශනයක්ම... අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව අවසන් කළ යුතුය.' එසේම විමර්ශනය අවසන් වන තෙක් සෑම දින 15 කට වරක්ම එය භාර පොලිස් නිලධාරියා විසින් විමර්ශනයේ ප්‍රගතිය පිළිබඳව මහේස්ත්‍රාත් අධිකරණයට වාර්තා කළ යුතු වේ.[28] තවද, ඕනෑම සැකකරුවෙකු රක්ෂිත බන්ධනාගාරගත කර ඇති විට, ඔවුන් අඛණ්ඩව රඳවා තබා ගැනීම සම්බන්ධයෙන් අධිකරණය විසින් සෑම දින 15 කට ම වරක් සමාලෝචනය කළ යුතුය.[29] මහේස්ත්‍රාත්වරයාගේ තීරණ, පශ්චාත් මරණ පරීක්ෂණ සහ අධිකරණ වෛද්‍ය වාර්තා සහ අනෙකුත් ලේඛන සමග ගොනු කරන ලද මෙම මහේස්ත්‍රාත් වාර්තා මගින් විමර්ශනයේ විධිමත් වාර්තා සපයන අතර එහි වර්ධනය සටහන් කරයි. 2023 දී, ITJP සහ Redress විසින් යාපනය මහේස්ත්‍රාත් අධිකරණයෙන් වාර්තාවේ පිටපතක් ලබා ගෙන තිබේ. විමර්ශන අඩුපාඩු නිසා හෝ සමහර වැදගත් ලේඛන නොමැතිකම[30] නිසා මෙම ලේඛනවල විශාල හිස්තැන් තිබුණත්, පිටු 434 කින් යුත් මෙම මිටියේ ඇති, භාෂා තුනක මිශ්‍රණයකින් ලියා ඇති සාක්ෂිවලින් පවා බොහෝ දේ නිගමනය කළ හැකිය. නඩු කටයුතුවලදී නිමලරාජන්ගේ පාර්ශ්වය නියෝජනය කළ නීතිඥයෙකු සමග කළ සම්මුඛ සාකච්ඡා යම් යම් හිඩැස් පිරවීමට උපකාරී වී ඇති අතර, අධිකරණ වාර්තාව පිටුපස ඇති සිදුවීම් පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ලබා ගැනීමට එමගින් ඉඩ සැලසී තිබේ.

## 3.2 ඝාතනය සිදු වූ රාත්‍රිය පිළිබඳ හමුදා සහ පොලිස් ප්‍රතිචාර

නිමලරාජන් මිය යන විට, ඔහු ජීවත් වූ අධි ආරක්ෂක කලාපයේ රාත්‍රී 9.00 ට[31] ඇඳිරි නීතිය පැනවී තිබුණු අතර එය ශ්‍රී ලංකා හමුදාවේ 512 වන බලසේනාව[32] විසින් අධීක්ෂණය කරන ලදී. ඝාතනයෙන් අනතුරුව නිමලරාජන්ගේ මස්සිනා වන ඇන්ටන් ජෙගදාස් පෝල් කෙලින්ම ගිය ඔහුගේ නිවසට ආසන්නතම මිනිත්තු දෙක තුනක කෙටි ඇවිදින දුරකින් පිහිටි ආරක්ෂක මුරපොළේ 2 වන විජයබාහු පාබල රෙජිමේන්තුවේ සාමාජිකයින් සේවයේ යොදවා තිබුණි.[33] අසල පිහිටි අනෙකුත් ආරක්ෂක මුරපොළවල රාජකාරියේ යෙදී සිටි සෙබළුන් පසුව ප්‍රකාශ කළේ පිපිරුම් ශබ්දයක් ඇසුණු බවයි: එබැවින්, ප්‍රහාරය පිළිබඳව වහාම ඔවුන්ට දැන ගැනීමට ලැබුණි.[34] එසේ වුවද, ආරක්ෂක නිලධාරීන් 10 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් නිමලරාජන්ගේ නිවසට ළඟා වීමට මිනිත්තු 15-20 ක් පමණ ගත විය. යාපනය පොලිස් නිලධාරියෙකුට අනුව, ආසන්න වශයෙන් මීටර් 200 ක් දුරින් පිහිටි යාපනය-මහනුවර මාර්ගයේ ප්‍රධාන YMCA ආරක්ෂක මුරපොළේ සිටි සෙබළුන් සිව්දෙනාගේ පළමු

27 උදාහරණයක් ලෙස 2003 ජුනි 25 වන දින උතුරු පළාත් මහාධිකරණයේ වවුනියා විනිසුරු මඩුල්ලට ඉදිරිපත් කළ ඉදිරිපත් කිරීම බලන්න, එහි රජයේ නීතිඥයෙකු සඳහන් කළේ වින්දිතයා මාධ්‍යවේදියෙකු වූ නිසා, 'මෙම ඝාතනයට සම්බන්ධ අය නීතියෙන් ගැලවී නොයා යුතු බවට මානව හිමිකම් ක්‍රියාකාරීන් සැලකිලිමත් වන' බවයි: MCJ2023 පිටුව 340.

28 එහි, 120(1) වගන්තිය.

29 1979 අපරාධ නඩු විධාන සංග්‍රහ පනත, 115(2) වගන්තිය.

30 නීතිපතිවරයාගේ ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන්, සැකකරු 1 ගේ ප්‍රකාශය 'වාර්තාවේ නොමැත' යනුවෙන් පවසමින්, 2019 ජූලි 23 වන දින අධිකරණ සටහන් ද බලන්න: MCJ2023 පිටුව 47,

31 TamilNet: 19 ඔක්තෝබර් 2000: https://www.tamilnet.com/art.html?catid=13&artid=5512

32 එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය, බලහත්කාරයෙන් හෝ ස්වේච්ඡාවෙන් අතුරුදහන් කිරීම් පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම (A/HRC/WGEID/119/1), 2 දෙසැම්බර් 2019, පි 34: ශ්‍රී ලංකාවේ අතුරුදහන් වූවන්ගේ සිද්ධීන් 36 අතර සටහන්: 'ශ්‍රී ලංකා හමුදාවේ 512 වන බලසේනාව විසින් 1996 ජූලි 21 වන දින [යාපනයට සැතපුම් පහළොවක් නැගෙනහිරින්] අල්ලාරි මීසාලෙයි හි එළවළු ගොවිපලකදී අත්අඩංගුවට ගත් බවට චෝදනා එල්ල වන රාමනන් සිවනන්දන්'. බලන්න. https://documents.un.org/doc/undoc/gen/g19/334/74/pdf/g1933474.pdf. යාපනය ආරක්ෂක සේනා මූලස්ථානය එවකට මේජර් ජෙනරාල් ඇන්ටන් ර්ඩී විජේන්ද්‍ර ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, 2000.08.03 - 2001.07.02 යටතේ අණදෙන නිලධාරියා ලෙස කටයුතු කළ අතර ඔහු තවමත් ජීවතුන් අතර සිටී (https://alt.army.lk/ces/content/major-general-anton-wijendra-retd-rwp-rsp-vsv-usp-ndc-psc-msc-graced-guest-speaker-diners%E2%80%99) සහ ප්‍රශ්න කළ හැකිය.

51 වන සේනාංකය GBW ජයසුන්දර RWP RSP, https://alt.army.lk/sfhqj/51-division යටතේ අණදෙන නිලධාරියා ලෙස කටයුතු කළ අතර, විශ්‍රාමික නමුත් 2021 වන විට ජීවතුන් අතර සිටියේය (https://www.defence.lk/Article/view_article/4113); VIR රෙජිමේන්තුව (https://alt.army.lk/vir/former-colonel-of-the-regiment)

33 2001 අප්‍රේල් 23 දින යාපනය අපරාධ අංශයේ නිලධාරි ආරියවංශගේ විනිසුරු විග්නරාජා විසින් ප්‍රශ්න කිරීම: MCJ**2023** පිටු 86–87. මෙම හමුදා ඒකකයේ අණදෙන නිලධාරියා වූයේ ඩබ්ලිව්.එම්.ඩී. ගුණසේන; භූමිය භාරව සිටියේ 2 වන ලුතිනන් ඩබ්ලිව් කේ ආදිහෙට්ටි: MCJ2023 පිටු 282.

34 2001 අගෝස්තු 27 වන දින පොලිස් පරීක්ෂක ද සිල්වා විසින් අධිකරණයට ඉදිරිපත් කරන ලද, සෙබළුන් සමග කළ සම්මුඛ සාකච්ඡාවල රහස් පොලිස් සාරාංශය: MCJ2023 පිටු282.

ප්‍රතිචාරය වූයේ උපදෙස් ඉල්ලා සිටීම සඳහා කිලෝමීටර් දෙකක් දුරින් පිහිටි ඔරලෝසු කුළුණ පාරේ ඥානම්ස් හෝටලයේ වූ බලසේනා මූලස්ථානය ඇමතීමයි. ඉන්පසු ඔවුන් සිද්ධිය වූ ස්ථානයට යාමට පෙර තවත් හට සේනා එනතෙක් බලා සිට තිබේ.

ඝාතනයෙන් මිනිත්තු කිහිපයකට පසු, නිමලරාජන්ගේ පවුලේ සාමාජිකයෙකු විසින් ප්‍රමුඛ පෙළේ දෙමළ භාෂා පුවත්පතක් වන *උදයන්* වෙත දුරකථන ඇමතුමක් ලබා දී ඝාතනය පිළිබඳව මාධ්‍ය දැනුවත් කිරීම සහ උදව් ඉල්ලා සිටීම සිදු කළේය.[35] එවකට රාජකාරියේ යෙදී සිටි උප කර්තෘවරයාට පොලිසිය සම්බන්ධ කර ගත නොහැකි වූ අතර, ඔහු ඒ වෙනුවට දෙමළ දේශපාලන පක්ෂයක් වන ඊපීආර්එල්එෆ් (EPRLF) හි සංවිධායකවරයෙකුට දුරකථන ඇමතුමක් ලබා දුන්නේය. පසුව රාත්‍රී 10.15 ට ඊපීආර්එල්එෆ් නියෝජිතයෙකු විසින් පොලිසියට අපරාධය පිළිබඳව දැනුම් දීමට සමත් විය. පොලිසිය මුලින් ප්‍රතිචාර දැක්වූයේ කෙසේද යන්න පැහැදිලි නැති නමුත් දිවි ගලවා ගත් නිමලරාජන්ගේ පවුලේ සාමාජිකයින්ට එදින රාත්‍රියේ හෝ ඉන් පසුව කිසිදු ආකාරයක ආරක්ෂාවක් ලබා දීම මග හැරීම සම්බන්ධයෙන් විමර්ශනය අධීක්ෂණය කළ විනිසුරු ඊ.ටී. විග්නරාජා විසින් සිය දැඩි අප්‍රසාදය පළ කර ඇත.[36]

## 3.3 ඉදිරි දින සහ සති

නිමලරාජන් ඝාතනයට පසු දින, ශ්‍රී ලංකා ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග විසින් සම්පූර්ණ පරීක්ෂණයක් පවත්වන බවට පොරොන්දු වූවාය. නමුත් *දේශසීමා නොමැති වාර්තාකරුවන්* සඳහන් කරන පරිදි, මෙය 'විරෝධාකල්පික ලෙස දේශපාලන සංස්ථාපිතය විසින් විමර්ශනය අවහිර කිරීමට වඩාත් කැමති වනු ඇති බවට හෝ නැත්නම්, නියෝග කරනු ඇති බවට පොලිසියට සහ හමුදාවට සංඥාවක් සේ දක්නට ලැබුණි'.[37] එසේම ඝාතනයෙන් පසුව පවා නිමලරාජන්ගේ පවුලේ අයට කතා කිරීමට නිදහසක් නොතිබුණි. ඔහුගේ මස්සිනා වන ඇන්ටන් ජෙගදාස් පෝල්, රාත්‍රියේ සිදු වූ හමුදා ප්‍රතිචාරය 'සුහදශීලී'[38] බවට විස්තර කළේය. දින කිහිපයකට පසු නිමලරාජන්ට සතුරන් වේ දැයි මහේස්ත්‍රාත් අධිකරණයේදී විමසා සිටි අවස්ථාවේ දී, 'මගේ පුතා සාමාන්‍යයෙන් කිසි දෙයක් හෙළි කරන්නේ නෑ, ඒ නිසා, එයාට සතුරන් ඉන්නවද කියලා මම දන්නෙ නෑ.' යනුවෙන් ඔහුගේ මව විසින් ප්‍රකාශ කර ඇත. නිමලරාජන්ගේ සහෝදරිය 'කිසිවෙකු සැක කිරීමට නොහැකි' බව පැවසූ බවට පොලිසිය විසින් වාර්තා කරන ලදී. ඔහුගේ පියාගේ කීවේ, අඳුර නිසා, ඔහුට දුටු එකම ලක්ෂණය ප්‍රහාරකයින්ගේ ඇඳුම් පමණක් බවත්, ඔහුගේ පවුලේ අඛණ්ඩ ආරක්ෂාව සම්බන්ධයෙන් ගත් කල, ඔවුන්ට 'කිසිදු තර්ජනයක්' නොමැති බව ඔහු විශ්වාස කළ බවත්ය. එබැවින්, පොලිසිය වාර්තා කළේ, 'ඔවුන්ට පොලිස් ආරක්ෂාව සැපයීම සම්බන්ධයෙන් ඔහුගේ කැමැත්තක් නොවූ' බවයි.[39] විමර්ශනයේ පළමු මාස හය තුළ නිමලරාජන්ගේ ජීවිතයට එල්ල වූ තර්ජන සම්බන්ධයෙන් පවුලේ අයගෙන් හෝ හිතමිතුරන්ගෙන් කිසිදු ප්‍රකාශයක් ලබා ගත් බවට යෝජනා කිරීමට අධිකරණ වාර්තාවේ කිසිදු සාක්ෂියක් නොමැත.[40]

යාපනය පොලිසියේ නිලධාරීන් පස් දෙනෙකුගෙන් යුත් කණ්ඩායමකට මෙම විමර්ශනය භාර දී තිබුණි.[41] ඝාතනයෙන් පසු අලුයම නිමලරාජන්ගේ මස්සිනා රෝහලේ සිට ආපසු පැමිණි විට, යාබද නිවසේ පොලිසිය සිටිනු ඔහුට දක්නට ලැබුණි. හමුදාව පෙර දින රාත්‍රියේ අහුලා ගත් මිමී9 උණ්ඩ කොපු සහ ග්‍රෙනේඩ් ලීවරය මේ වන විට ඔවුන් විසින් භාරයට ගෙන තිබූ අතර, ඔවුන් විසින් තවත් මිමී9 උණ්ඩ

[35] 2001 අගෝස්තු 27 වන දින පොලිස් පරීක්ෂක ද සිල්වා විසින් අධිකරණයට ඉදිරිපත් කරන ලද උදයන් උප කර්තෘ ඥානසුන්දරම් කුගනාදන් විසින් CID විසින් කරන ලද ප්‍රකාශයේ සාරාංශය: MCJ2023 p281. (ඝාතනයෙන් වසරකට ආසන්න කාලයකට පසු, සාක්ෂිකරුට ඇමතුම දුන් පුද්ගලයා නිමලරාජන්ගේ මව බව මතක ඇති බව පෙනේ, නමුත් ඇගේ තුවාල සලකා බලන විට, එය ඔහුගේ සහෝදරිය හෝ ඔහුගේ බිරිඳ බව වඩාත් පිළිගත හැකි බවක් පෙනෙන්නට තිබේ.) EPRLF හි නිශ්චිත සම්බන්ධය අහම්බෙන් 2002 සැප්තැම්බර් 15 වන දින පොලිස් පරීක්ෂක ද සිල්වා විසින් අධිකරණයට ඉදිරිපත් කරන ලද ඉදිරිපත් කිරීමක සඳහන් වේ: MCJ2023 පිටු 374.

[36] 2000 ඔක්තෝබර් 27 වන දින අධිකරණයේදී විනිසුරු විග්නරාජාගේ කතාව: MCJ2023 පිටු63.

[37] https://rsf.org/en/open-letter-sri-lankan-prime-minister

[38] 2000 ඔක්තෝබර් 19-20 දින රාත්‍රියේ ලියන ලද පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවේ ඇතුළත් ප්‍රකාශය: MCJ2023 පිටු 252.

[39] 2000 ඔක්තෝබර් 31 වන දින විනිසුරු විග්නරාජා ඉදිරියේ ලිලී තෙරෙස් මයිල්වාගනම්: MCJ2023 p67; 2001 අප්‍රේල් 22 වන දින යාපනය අපරාධ අංශයේ නිලධාරී ආරියවංශ විසින් අධිකරණයට ඉදිරිපත් කරන ලද ප්‍රේමරානි ජෙගතාස්ගේ ප්‍රකාශයේ CID සාරාංශය: MCJ2023 p266; 2001 මැයි 30 වන දින පොලිස් පරීක්ෂක ද සිල්වා විසින් අධිකරණයට ඉදිරිපත් කරන ලද කැනපතිපිල්ලෙයි මයිල්වාගනම්ගේ ප්‍රකාශයේ CID සාරාංශය MCJ2023 පිටු 272; 2000 ඔක්තෝබර් 31 වන දින ලියන ලද සටහනක, යාපනය අපරාධ අංශයේ භාර නිලධාරී විසින් අධිකරණයට ලබා දුන් පොලිස් ආරක්ෂාව ප්‍රතික්ෂේප කරන බවට වාර්තාව: MCJ2023 පිටු 240.

[40] ඉහත පාදසටහන 9 බලන්න.

[41] 2001 අප්‍රේල් 23 වන දින යාපනය අපරාධ අංශයේ නිලධාරී ආරියවංශගෙන් විනිසුරු විග්නරාජා විසින් කළ ප්‍රශ්න කිරීම: MCJ2023 පිටු 86.

හෝ උණ්ඩ කොටස් දෙකක් සොයා ගෙන තිබුණි.[42] නිමලරාජන්ගේ අධ්‍යයනකාමරයේ තිබී හමු වූ දෙවන උණ්ඩ කොපුවක් සහ තුන්වන උණ්ඩයක් නිමලරාජන්ගේ වැඩිමහල් බෑණනුවන් වන ප්‍රේම්ජිට ඒ වන විටත් ලබා දී තිබුණු බව අසල්වැසියෙකු පසුව කියා සිටියේය.[43] මහේස්ත්‍රාත් විනිසුරු විග්නරාජා, එම ස්ථානය පරීක්ෂා කිරීමට පැමිණි අවස්ථාවේ දී, අධ්‍යයන කාමරයේ ජනේලය යට සහ නිමලරාජන් වැටී සිටි දොර ළඟ ජනේලය අතර විශාල රුධිර පැල්ලම් දක්නට විය. ඉන්පසු ඔහු රෝහලට ගිය අතර එහිදී පශ්චාත් මරණ පරීක්ෂණයක් සඳහා අවසර ලබා දුන්නේය.[44] වැඩබලන අධිකරණ වෛද්‍ය නිලධාරියා විසින් මෙය සිදු කරන ලද අතර නිමලරාජන් හිසට 'වෙඩි වැදීම නිසා ඇති වූ තුවාල හේතුවෙන්' මිය ගොස් ඇති බව ඔහු සාරාංශයක් ලෙස ප්‍රකාශ කළේය.[45] විස්තර වශයෙන්, නිමලරාජන්ට තුන් වතාවක් වෙඩි තබා ඇත. එක් උණ්ඩයක් ඔහුගේ දකුණු අතේ ඉහළ කොටසේ සෙන්ටිමීටර නවයක්, උරහිසට මඳක් පහළින් ඇතුළු වී තිබුණි. දෙවැනි වෙඩි පහර ඔහුගේ දකුණු කම්මුලට ඉහළින් ඇතුළු වී අතර, තුවාලය වටා කළු පැහැයක් ඇති කරමින්, පසුව ඔහුගේ බෙල්ල තුළ දී දෙකට බෙදී, එක් කොටසක් ඔහුගේ බෙල්ලේ ඉදිරිපසින් පිටව ගොස් ඇති අතර, අනෙක් කොටස ඔහුගේ දකුණු පෙනහළු වල විශාල තැල්මක් ඇති කර තිබුණි. තුන්වැනි උණ්ඩය ඔහුගේ බෙල්ලේ දකුණු පැත්තේ කෙළවරින් ඇතුළු වී මොළය හරහා ගොස් හිස් කබලේ අස්ථි බිඳීම් කිහිපයක් ඇති කරමින් ඉහළ වම් නළලෙන් පිටවී ගොස් තිබුණි.[46] ඔහුගේ දෙපාවල ඉදිරිපස සැලකිය යුතු ලේ පැල්ලම් තිබුණු අතර ඔහුගේ නාස්පුඩුවලින් ලේ ගලාගොස් තිබුණි. 'මරණ වේලාව' දක්වන ස්ථානයේ වෛද්‍ය නිලධාරියා විසින් 'ක්ෂණික' ලෙස ලියා ඇත. මියගිය පුද්ගලයා සාමාන්‍ය සෞඛ්‍ය තත්වයෙන් පසුවන බවත්, කොළ සහ සුදු බතික් සරමක් ඇඳ සිටි බවත් ඔහු තවදුරටත් පවසා තිබුණි.

ඝාතනයෙන් දින දෙකකට පසු, නිමලරාජන්ගේ අවමංගල්‍යයට ශෝකය පළ කිරීමට 4,000 කට අධික පිරිසක් එක්රැස් ව යාපනය පුරා කළු කොඩි ලෙළ දෙනු දක්නට ලැබුණි. දින හතරකට පසු, කොළඹ දී, මාධ්‍යවේදීන් 600කට අධික සංඛ්‍යාවක් ඔහුගේ ඝාතනයට විරෝධය පළ කිරීමට එක්රැස් වූ අතර, එය 'රජයට පක්ෂපාතී සටන්කාමීන් විසින් ඝාතනය සිදු කරන ලද බවට චෝදනා එල්ල වී' ඇති බව *ටැමිල්නෙට්* වාර්තා කළේය.[47]

ප්‍රහාරයෙන් සති දෙකකට ආසන්න කාලයක් ගත වීමෙන් අනතුරුව, නිමලරාජන්ගේ බෑණනුවන් වන ප්‍රසන්න තවදුරටත් රෝහලේ සුවය ලබමින්, නිමලරාජන්ගේ දෙමව්පියන් රෝහලෙන් පිට ව ගොස් තිබුණ ද ඔක්තෝබර් 31 වන දින අධිකරණයේ සාක්ෂි කැඳවන විට, ඔහුගේ මවට එයට පෙනී සිටීමට නොහැකි විය.[48] එදිනම, මහේස්ත්‍රාත්වරයා, ගමේ පරිපාලක වූ ග්‍රාම සේවකගෙන් විමසා දැනගත් පරිදි, අපරාධය පිළිබඳව හමුදාව දැනුවත් වූ පසුවත්, ප්‍රහාරකයින් අල්ලා ගැනීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි. එදින රාත්‍රියේ ඇඳිරි නීතිය ක්‍රියාත්මක කළ සෙබළුන් ප්‍රදේශය වටලා හෝ කිසිදු ආකාරයක සෝදිසි කිරීමක් සිදු කර නොමැති අතර 'ඒ සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති' බව දැක්විණි.[49]

2000 නොවැම්බර් 1 වැනි දින නිකුත් කරන ලද අධිකරණ වාර්තාවේ පළමු වතාවට 'සැක සහිත පුද්ගලයින් දෙදෙනෙකු' පිළිබඳව සඳහන විය. පොලිසිය ඔවුන් අත්අඩංගුවට ගත යුතු බවට මහේස්ත්‍රාත්වරයා ඉල්ලීමක් ද සිදු කර ඇත. ඊට ප්‍රතිචාර වශයෙන්, එම මාසය පුරාවටම, පොලිසිය ඇඟිලි සලකුණු සාක්ෂි සැකසීමේ ප්‍රමාදයන් ගැන ප්‍රකාශ කරමින්, කිසිදු පැහැදිලි කිරීමක් නොමැතිව නිමලරාජන්ගේ බැංකු වාර්තා වෙත ප්‍රවේශ වීමට විකාරරූපී ලෙස අවසර ඉල්ලා සිටියේය. පුදුමාකාර ලෙස, ඝාතනයෙන්

42 2000 ඔක්තෝබර් 20 වන දින විනිසුරු විග්නරාජා විසින් කරන ලද 'මරණ පරීක්ෂණ' සටහන්: MCJ2023 පිටු 54.

43 2001 මැයි 30 වන දින පරීක්ෂක ද සිල්වා විසින් අධිකරණයට ඉදිරිපත් කරන ලද සිසිල් සෙල්වරාජා දිනේෂ්ගේ රහස් පොලිස් ප්‍රකාශයේ සාරාංශය: MCJ2023 පිටු 268. මෙම ප්‍රකාශය ගැන වැඩිදුර කරුණු විමසීම් සිදු කළ බවට කිසිදු වාර්තාවක් නොමැත.

44 2000 ඔක්තෝබර් 20 වන දින විනිසුරු විග්නරාජා විසින් කරන ලද මරණ පරීක්ෂණයේ සටහන්: MCJ2023 පිටු 52-56.

45 සම්පූර්ණ පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා, MCJ2023 පිටු 241-253 බලන්න.

46 ඉහත දක්වා ඇති අනුපිළිවෙලට වෙඩි තුනක් එල්ල කර ඇති බවට නිහඬ ඇඟවීම හැර, පශ්චාත් මරණ පරීක්ෂණ සොයාගැනීම් පිළිබඳ කිසිදු විශ්ලේෂණයක් MCJ2023 හි සපයා නොමැත. කෙසේ වෙතත්, මෙම වෙඩි තැබීම්වල අන්ත කෝණ ගැන සඳහන් කරයි.

47 TamilNet: 21 සහ 25 ඔක්තෝබර් 2000. බලන්න: https://www.tamilnet.com/art.html?catid=13&artid=5515, සහ https://www.tamilnet.com/art.html?catid=13&artid=5523

48 මෙම කරුණ සම්බන්ධයෙන් විනිසුරු විග්නරාජාගේ නිරීක්ෂණය බලන්න, MCJ2023 පිටු 65.

49 2000 ඔක්තොම්බර් 31 දින උසාවියේදී දුන් වෛරමුත්තු ශාන්තිරරාජාගේ ප්‍රකාශය: MCJ2023 පිටු 71.

මාසයකට වැඩි කාලයකට පසු, එනම්, නොවැම්බර් මස අවසානයේ දී, හමුදාව විසින් මුලින් සොයා ගන්නා ලද උණ්ඩ ආවරණය සහ ග්‍රෙනේඩ් ලීවරය ඉදිරිපත් කර, විශ්ලේෂණය සඳහා යැවීමට විනිසුරු විග්නරාජාගෙන් අවසර ඉල්ලා සිටියේය.

## 3.4 2001: සුළු පරිමාණ ප්‍රගතියක්

2001 ජනවාරි මාසයේදී ගිනි අවි විශ්ලේෂණය සඳහා පොලිසිය විසින් ඔවුන්ගේ ඉල්ලීම නැවත ඉදිරිපත් කළේය. නඩු භාණ්ඩ P1, ග්‍රෙනේඩ් ලීවරය චීනයේ සෑදූ එකක් බවත්; නඩු භාණ්ඩ P2 පිස්තෝලයකට හෝ උප-මැෂින් තුවක්කුවක භාවිත කළ හැකි 9mm ස්වයං-පූරණ කොපුවක් බවත් රජයේ විශ්ලේෂකයින් විසින් පසුව වාර්තා කර තිබුණි.[50] නීතිපතිවරයාට මළ සිරුරෙන් ද්‍රව්‍යමය වස්තු සොයා ගෙන තිබේද යන්න පිළිබඳ පශ්චාත් මරණ පරීක්ෂණ තහවුරු කිරීමක් අවශ්‍ය වීම නිසා තවදුරටත් ප්‍රමාදයන් සිදු වූ බවට මාර්තු මාසයේ දී පොලිසිය විසින් පැහැදිලි කර තිබුණි. එය නිමලරාජන්ගේ පෙනහළු සිදුරු කළ උණ්ඩ කැබැල්ල විය හැකිය. ඝාතනයට පසු දින නිමලරාජන්ගේ නිවස අසලින් ඇඟිලි සලකුණක් සහිත අතහැර දැමූ බයිසිකලයක් හමු වූ බවට ඔවුන් පළමු වරට සටහන් කළ අතර, එහි විකුණුම්කරු සහ ගැනුම්කරුගේ තොරතුරු නීතිපතිවරයාට ඉදිරිපත් කර ඇති බව දැක්වූහ. පොලිසිය විසින් අධිකරණ අධිකාරිය මග හරිමින් නීතිපතිවරයාට ඍජුවම වාර්තා කිරීම 'පිළිගත නොහැකි' බව, මහේස්ත්‍රාත්වරයා පිළිතුරු දී සිටියේය. එසේම ඝාතනයෙන් පසු උදැසන සොයාගත් උණ්ඩ කොටස්, එනම් නඩු භාණ්ඩ P3 ගැන පැවසිය හැක්කේ කුමක්ද? බැලස්ටික් සාක්ෂි පිළිබඳ සම්පූර්ණ විස්තරයක් තවමත් නොමැති වීමට හේතුව සහ "විමර්ශනයේ කිසිදු ප්‍රගතියක් අත්කර ගැනීමට පොලිසියට නොහැකි වී ඇත්තේ මන්ද" යන්න පැහැදිලි කරමින් අප්‍රේල් 4 වන දිනට පෙර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ඔහු ඉල්ලා සිටියේය.[51]

ඝාතනයෙන් මාස හයකට පසු, ඝාතනයට පසු දින ප්‍රදේශවාසීන්[52] විසින් නිවසේ සිට 'මීටර් 500ක් පමණ' බටහිර දෙසට වන්නට දුම්රිය මාර්ගය අසල පඳුරක් තුළ අතහැර දමා ගොස් ඇඟිලි සලකුණක් සහිතව සොයා ගත් අනුක්‍රමික අංක 55661592[53] දරණ 'ලුමාලා' බයිසිකලයක් විමර්ශනය කරන බව යාපනය පොලිසිය විසින් අධිකරණයට වාර්තා කර ඇත.[54] ඉන්පසුව සිදු වූ, යාවත්කාලීන කිරීමක දී, එහි හිමිකරු හඳුනා ගැනීමට නොහැකි වූ බවත්, මිනීමැරුම් නඩුව සම්බන්ධයෙන්, 'මෙතෙක් කිසිදු සම්බන්ධයක් අනාවරණය වී නොමැති' බවත් පොලිසිය විසින් අධිකරණයට පැවසුවේය.[55] අසල්වැසියන්ගෙන් සහ මාර්ග මුරපොලවල රාජකාරියේ යෙදී සිටි පොලිස් සහ හමුදා නිලධාරීන්ගෙන් ප්‍රකාශ සටහන් කර ගෙන ඇති බවත්, මේ දක්වා සිද්ධියට අදාළ 'කිසිදු සාක්ෂියක්' අනාවරණය වී නොමැති බවත් ඔවුන් ලිඛිතව අධිකරණයට ප්‍රකාශ කළහ.[56] ඇඳිරි නීතිය අතරතුර ප්‍රදේශයේ දැඩි ආරක්ෂාවක් පැවතිය ද, ප්‍රහාරකයින්ට අසල වූ ආරක්ෂක මුරපොලවල් මග හැර පැමිණීමට අවම වශයෙන් කෙටි මං දෙකක්වත් තිබූ බව ඍජු ප්‍රශ්න කිරීම්වල දී, නිලධාරියෙකු පැහැදිලි කර සිටියේය.. මේ ආකාරයෙන් පුද්ගලයෙකුට පොලිස් මූලස්ථානයට හෝ 512 බලසේනා මූලස්ථානයට ආසන්නයට පවා ළඟා විය හැකි බවට වූ යෝජනාවට ඔහු එකඟ විය. අත්අඩංගුවට ගැනීම සිදු කරන ලෙස මහේස්ත්‍රාත්වරයා විසින් නැවතත් ඉල්ලා සිටිනු ලැබිණි.[57]

## නව විමර්ශන කණ්ඩායමක්

2001 අප්‍රේල් 16 වැනි දින කොළඹ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සහ මිනීමැරුම් ඒකකයේ ප්‍රධාන විමර්ශක රංජිත් ද සිල්වා යටතේ වූ කොළඹ පොලිස්

[50] රජයේ විශ්ලේෂක එම්.ඒ.ජේ. මෙන්ඩිස්ගේ වාර්තාව, 2001 ජනවාරි 29: MCJ2023 පිටු 259.

[51] 2001 මාර්තු 27 වන දින අධිකරණයේදී යාපනය පොලිස් ස්ථානයේ සැරයන් විමලසේනගෙන් විනිසුරු විග්නරාජා විසින් සිදු කළ ප්‍රශ්න කිරීම: MCJ2023 පිටු 81–82.

[52] උදාහරණයක් ලෙස 2001 මැයි 30 වන දින පොලිස් පරීක්ෂක ද සිල්වා විසින් අධිකරණයට ඉදිරිපත් කරන ලද රත්නම් දයාබරන්ගේ ප්‍රකාශයේ CID සාරාංශය බලන්න: MCJ2023 පිටු 269–70. NB එක් ප්‍රදේශවාසියෙකු ප්‍රකාශ කළේ සාක්ෂියක් ලෙස එහි අඛණ්ඩතාව ආරක්ෂා කර ගැනීම ගැන කිසිදු සඳහනක් නොකර, බයිසිකලය 'පැටවීමට' තමා පොලිසියට උදව් කළ බවයි: 2001 මැයි 30 වන දින පොලිස් පරීක්ෂක ද සිල්වා විසින් අධිකරණයට ඉදිරිපත් කරන ලද නවරත්නම් පරමේෂ්වරම්ගේ ප්‍රකාශයේ CID සාරාංශය බලන්න: MCJ2023 පිටුව 270.

[53] බොහෝ ප්‍රකාශ සඳහා වන නිවැරදි අනුක්‍රමික අංකය.

[54] යාපනයේ අපරාධ අංශයේ නිලධාරී විතාරණ, 2001 අප්‍රේල් 4 වන දින අධිකරණයට සිදු කළඉදිරිපත් කිරීම: MCJ2023 පිටු 262.

[55] යාපනය අපරාධ අංශයේ නිලධාරී ආරියවංශ, 2001 අප්‍රේල් 23 දින අධිකරණයට සිදු කළ ඉදිරිපත් කිරීම: MCJ2023 පිටු 84.

[56] යාපනය අපරාධ අංශයේ නිලධාරී ආරියවංශ, 2001 අප්‍රේල් 22 දින අධිකරණයට සිදු කළ ඉදිරිපත් කිරීම: MCJ2023 පිටු 266.

[57] 2001 අප්‍රේල් 23 වන දින අධිකරණයේදී යාපනය අපරාධ අංශයේ නිලධාරී ආරියවංශගෙන් විනිසුරු විග්නරාජා විසින් සිදු කළ ප්‍රශ්න කිරීම: MCJ2023 පිටු 85–88.

නිලධාරීන් කණ්ඩායමකට විමර්ශණය භාර ගන්නා පොලිස්පතිවරයා විසින් ලෙස නියෝග කරනු ලැබිණි. මෙම නව කණ්ඩායම යාපනයට යාමට පෙර, නිමලරාජන්ගේ ඥාතීන්ගෙන් නැවත ප්‍රශ්න කිරීම සිදු කළහ. මේ වන විට ඔහුගේ මුළු පවුල ම ඔවුන්ගේ ආරක්ෂාව පතා කොළඹට ගොස් සිටි අතර ශ්‍රී ලංකාවේ රැඳී සිටීම අනාරක්ෂිත යැයි හැඟුණු නිසා ඔවුන් විදේශගත වීමට දැඩි ලෙස උත්සාහ කරමින් සිටියහ.[58]

මැයි මාසයේදී, ද සිල්වා විසින් මහේස්ත්‍රාත්වරයාට වාර්තා කර සිටියේ ඝාතනය සිදු වූ රාත්‍රියේ විවිධ ආරක්ෂක මුරපොලවල්වල යොදවා සිටි සෙබළුන් බොහෝ දෙනෙකු මේ වන විට 'ඔවුන්ගේ රාජකාරි ප්‍රදේශවලින් ඉවත්ව ගොස් ඇති' බැවින්. කරුණු විමසීමට නොහැකි වී ඇති බවයි. ඇත්ත වශයෙන්ම හමුදාවට ඔවුන් සියල්ලන් හඳුනාගෙන සොයා ගත හැකි බව මෙයට පිළිතුරු ලෙස මහේස්ත්‍රාත්වරයා විසින් ප්‍රකාශ කරන ලද අතර නැවතත් දක්වා සිටියේ 'ඔවුන්ගේ අනුදැනුමකින් තොරව කිසිවෙකුට' ප්‍රදේශයට ඇතුළු විය නොහැකි' බව තමාගේ විශ්වාසය බවයි. මාසයක් ඇතුළත මෙම සෙබළුන්ගෙන් සම්පූර්ණ ප්‍රකාශ මාලාවක් එකතු කරන ලෙස ඔහු විසින් ද සිල්වාට නියෝග කරනු ලැබිණි. නඩු භාණ්ඩ P1, ග්‍රෙනේඩ ලීවරය සහ නඩු භාණ්ඩ P2, පාවිච්චි කරන ලද කොපුව වඩාත් සවිස්තරාත්මක පරීක්ෂණයකට භාජනය කළ යුතු බව ද සිල්වා විසින්ම ඉල්ලා සිටියේය. පොලිසිය දැනටමත් පරීක්ෂාව සඳහා බයිසිකලය යවා ඇති බව ඔහු පැවසීය. ඇඟිලි සලකුණු විශ්ලේෂණය 'සකසමින්' පවතින බව දැක්විනි.[59]

ද සිල්වා විසින් කරුණු විමසීම් පිළිබඳ සාරාංශ ද ඉදිරිපත් කළේය.[60] කොළඹ, සාපේක්ෂිතව ආරක්ෂිත ස්ථානයක සිටි ෙපවුලේ සාමාජිකයින්ට නිමලරාජන්ගේ ඝාතනයට පෙර ඔහුට සහ ඔහුගේ බිරිඳට ලැබුණු තර්ජන විස්තර කිරීමට හැකි වූ බව මෙයින් හෙළි විය. යාපනයේ සිදු කරන ලද වෙනත් කරුණු විමසීම්වල දී, නිමලරාජන්ගේ මිතුරන් විසින් ද තමාට ලැබුණු තර්ජන ගැන නිමලරාජන් ඔවුන්ට පැවසූ ආකාරය විස්තර කර තිබුණි. ඝාතනය සිදු වූ දින අතහැර දැමූ බයිසිකලය පසුව සොයාගත් ස්ථානයට ආසන්නව රාත්‍රී 8.00 ට කළු කලිසම් සහ ටී-ෂර්ට්වලින් සැරසුණු බයිසිකල්කරුවන් දෙදෙනෙකු හමු වී බවට විස්තර කළ වීඩියෝ සාප්පු හිමියෙකු ද ද සිල්වා විසින් සොයාගෙන තිබුණි. අඳුර නිසා ඒ රාත්‍රී මුර සංචාරයේ යෙදී සිටි සිංහල සෙබළුන් බවට ඔහු විසින් අනුමාන කර තිබුණි.[61] තවත් කරුණු විමසීමක දී කෙටි කාලයක් පමණක් ක්‍රියාත්මක වූ දේශපාලන පක්ෂයක් වන පීඩීඒ (PDA)[62] හි වන්නියසිංහම් ගුණසීලන් පවසා සිටියේ තම සංවිධානය විසින් ලුමාලා බයිසිකලය[63] මිලදී ගෙන ඇති බවත්, 2000 මුල් භාගයේ දී පක්ෂ සමාජිකයෙකු වූ වන කාන්ත්සමේ ජෙගතීස්වරන් නොහොත් ජෙගන් නොහොත් කිරුබා විසින් එය භාවිතා කර ඇති බවත්ය. ජෙගන් පීඩීඒ පක්ෂයෙන් ඉවත් ව බයිසිකලය රැගෙන ගොස් තිබුණු අතර ඉන් දින කිහිපයකට පසු, ජෙගන් ' ඊපීඩීපී සාමාජිකයින් සමග ගමන් කරනු' ගුණසීලන් දැක තිබුණි. බයිසිකලය සොයා ගැනීම ප්‍රසිද්ධියට ලක් වූ විට, ගුණසීලන් ජෙගන් සම්බන්ධයෙන් පොලිසියට වාර්තා කර තිබුණි. ජෙගන් විසින් විෂු නම් කෙනෙකුට බයිසිකලය ලබා දුන් බවට පැවසූ බවට ගුණසීලන් හෙළි කළේය. තවත් කරුණු විමසීමක දී, ඊපීඩීපී සංවිධායකවරයා ජෙගන් හෝ බයිසිකලය ගැන 'දැන සිටි' බව ප්‍රතික්ෂේප කර ඇත. ද සිල්වාගේ ප්‍රශ්න කිරීම් යටතේ ජෙගන්ම තමා ඊපීඩීපී සාමාජිකයෙකු බව එකඟ වූ නමුත්, පීඩීඒ පක්ෂයට අයත් බයිසිකලය රැගෙන යාම හෝ විෂු නම් කිසිවෙකු දැන සිටි බව ප්‍රතික්ෂේප කළේය. ඒ වෙනුවට, පෙබරවාරි මාසයේ දී පීඩීඒ සාමාජිකයින් දෙදෙනෙකු විසින් පහර දීමෙන් අනතුරුව නිමලරාජන්ගේ ඝාතනය සිදු වූ ස්ථානය ආසන්නයේ බයිසිකලය තැබූ බවට පිළිගනිමින් 'පොලිසියට ප්‍රකාශයක්

[58] 2001 මැයි 30 වන දින පරීක්ෂක ද සිල්වා විසින් අධිකරණයට ඉදිරිපත් කරන ලද රහස් පොලිස් සාරාංශයක ඔවුන්ගේ නව ප්‍රකාශ: MCJ2023 පිටු 271-273. Frances Harrison ෆ්‍රැන්සිස් හැරිසන් වෙතද මූලාශ්‍ර කරන ලදී.

[59] පරීක්ෂක ද සිල්වා, විසින් අධිකරණයට සිදු කළ ඉදිරිපත් කිරීම සහ විනිසුරු විග්නරාජා විසින් පරීක්ෂක ද සිල්වාගෙන් සිදු කළ ප්‍රශ්න කිරීම, 2001 මැයි 30: MCJ2023 පිටු 91-92.

[60] 2001 මැයි 30 වන දින පොලිස් පරීක්ෂක ද සිල්වා විසින් අධිකරණයට ඉදිරිපත් කරන ලද සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශවල රහස් පොලිස් සාරාංශය: MCJ2023 පිටු 268 සහ ff.

[61] දේශසීමා රහිත වාර්තාකරුවන් පසුව පෙන්වා දුන්නේ 'ඊපීඩීපී සාමාජිකයින්ට, විශේෂයෙන් පැරාමිලිටරි හමුදාවන්ට අයත් අයට, රාත්‍රී කාලයේ ගමන් කිරීම සඳහා විශේෂ අවසරයන් තිබූ' බවත්, ඊපීඩීපී සහ ආරක්ෂක හමුදා 'ඒ කාලයේදී සමීපව එකට වැඩ කළ' බවත්ය.: https://rsf.org/en/open-letter-sri-lankan-prime-minister

[62] PDA යනු මැතිවරණවලදී කිසිදා සමෘද්ධිමත් නොවූ කුඩා දෙමළ දේශපාලන පක්ෂයක් හෝ කන්ඩායමක් විය (MCJ2023 p281 හි PDA 'මහජන ප්‍රජාතන්ත්‍රවාදී සන්ධානය' ලෙස විස්තර කර ඇත, බොහෝ විට 'මහජන ප්‍රජාතන්ත්‍රවාදී සන්ධානය').

[63] 2001 අගෝස්තු 27 සහ 2002 ජුනි 11 යන දිනවල පොලිස් පරීක්ෂක ද සිල්වා විසින් අධිකරණයට ඉදිරිපත් කරන ලද යාපනය කොට්ඨාශයේ PDA පක්ෂ සංවිධායක නාගලිංගම් රාජේන්ද්‍රම් රාමේෂ්වරම් විසින් කරන ලද ප්‍රකාශවල රහස් පොලිස් සාරාංශය ද බලන්න: MCJ2023 පිටු 281, 305.

කිරීමට එකඟ වූ' බව ඔහු පැවසීය.[64] ගුණසීලන් ඔහුට පහර දුන් අයගෙන් එක් අයෙක් විය. 'ඔවුන්ගේ තර්ජනයට ඇති බිය නිසා', 'තමා විෂු නම් පුද්ගලයාට බයිසිකලය ලබා දුන් බව පොලිසියට ප්‍රකාශ කළ බවත් එම ප්‍රකාශය අසත්‍ය බවත්' ජෙගන් පවසා සිටියේය.[65]

ජූනි මස අගභාගයේ දී රජයේ විශ්ලේෂකයෙකුගෙන් අධිකරණයට වාර්තාවක් ලැබුණු අතර, එහි දී ඔහු විසින් නඩු භාණ්ඩ P1, ග්‍රෙනේඩ් ලීවරය, චීනයේ නිෂ්පාදිත බවට වූ ඔහුගේම පෙර සොයාගැනීම යාවත්කාලීන කළේය. එය ඇත්ත වශයෙන් ම සිංගප්පූරුවේ නිෂ්පාදනය කරන ලද SFG–87 ආකෘතියක් බව ඔහු මෙහිදී පවසා සිටියේය.[66] ජූලි මාසයේදී, ද සිල්වා විසින් ඝාතනය සිදු වූ රාත්‍රියේ රාජකාරියේ යෙදී සිටි සෙබළුන් දස දෙනෙකුගේ නම් සහිත වාර්තාවක් ඉදිරිපත් කළ අතර, එහි සඳහන් වූයේ 'ඔවුන්ගේ ප්‍රකාශවලට අනුව, ප්‍රශ්නගත රාත්‍රියේ කිසිවෙකු ඔවුන්ගේ මුරපොලවල් පසුකර ගොස් නැති' බවයි.[67] අදාළ ආරක්ෂක මුරපොලවල රාජකාරියේ යෙදී සිටි සියලුම සෙබළුන්ගේ නම් සහ ඔවුන්ගේ සම්පූර්ණ ප්‍රකාශ සියල්ල සඳහා මහේස්ත්‍රාත්වරයා නැවතත් ඉල්ලීමක් කළේය. ද සිල්වා යටතේ සේවය කළ උප පොලිස් පරීක්ෂකවරයෙකුට ජෙගන් හෝ ගුණසීලන්ගෙන් ඇඟිලි සලකුණු ලබාගෙන ඇත්දැයි පැවසීමට නොහැකි විය. නඩුවේ සියලුම සැකකරුවන්ගෙන් ඇඟිලි සලකුණු ලබා ගත යුතු බව මහේස්ත්‍රාත්වරයා නියෝග කළේය. තොරතුරු ලබා ගැනීම සඳහා අතහැර දමා තිබූ ලුමාලා බයිසිකලයේ ඡායාරූපයක් ප්‍රසිද්ධ කිරීමට ද සිල්වාගේ කණ්ඩායම අවසර ඉල්ලා සිටියේය.[68] අගෝස්තු මාසයේ දී වෙඩි තැබීම සිදු වීමෙන් අනතුරුව නිමලරාජන්ගේ නිවසට ගිය සෙබළුන්ගේ නම් ද සිල්වා විසින් ලබා දෙන ලදී. ඔහුගේ ප්‍රකාශයට අනුව ඔවුන්ට විමර්ශනය වෙනුවෙන් ඉදිරිපත් කිරීමට අලුත් දෙයක් නොතිබුණි. එදින රාත්‍රියේ එම ප්‍රදේශයේ රාජකාරියේ යෙදී සිටි, පැහැදිලිව ම තවමත් ප්‍රශ්න කිරීමට ලක් කර නොමැති තවත් සෙබළුන් 22 දෙනෙකුගේ වෙනම ලැයිස්තුවක් ලබා දෙමින්, 'විමර්ශනයේ ප්‍රගතිය වාර්තා කිරීමට දීර්ඝ කාලයක් ලබා දෙන ලෙස' ඔහු විසින් ඉල්ලා සිටියේය.[69]

ඔක්තෝබර් මාසයේ දී, ඝාතනයට පසු දින පොලිසිය විසින් සොයා ගන්නා ලද නඩු භාණ්ඩ P3, උණ්ඩ හෝ උණ්ඩ කොටස් පිළිබඳ විශ්ලේෂණයක් අවශ්‍ය බව ද සිල්වා විසින් මතු කරන ලදී. ඒවා නඩු භාණ්ඩ P2 හා සම්බන්ධද? ඒවා 'මිනිසෙකු මරා දැමීමට භාවිතා කළ හැකිද?' යන්න සම්බන්ධයෙන් විශ්ලේෂණයක් ඊළඟ මාසයේ ලබා දෙන ලෙස මහේස්ත්‍රාත්වරයා විසින් ඉල්ලා සිටියේය.[70] නොවැම්බර් 12 වන දින අධිකරණ වාර්තාවකට කෙටි සටහනක් එක් කරමින් තොරතුරු ලැබීමෙන් අනතුරුව, අපරාධයට අදාළව සැක කරන පුද්ගලයින් දෙදෙනෙකුගේ ප්‍රකාශ CID විසින් සටහන් කර ඇති බව ද සිල්වා ප්‍රකාශ කර සිටියේය. සෙබස්තියන් රමේෂ් නොහොත් නැපෝලියන් සහ ඩේවිඩ් මයිකල් කොලින් නොහොත් මුරලි අදාළ සැකකරුවන් විය. ඔවුන්ට එරෙහිව එල්ල වී ඇති චෝදනා දෙදෙනා විසින් ම ප්‍රතික්ෂේප කරන ලද අතර එබැවින් ද සිල්වා ඔවුන් නිදහස් කිරීමට කටයුතු කළේය. යාපනය අර්ධද්වීපයේ බටහිර වෙරළට ඔබ්බෙන් වූ දූපතක් වන කයිට්ස් හි පිහිටි ඊපීඩීපී හමුදා අංශයේ අණදෙන නිලධාරියා වූ නැපෝලියන්ගේ නම, එකල මාධ්‍යවේදීන් අතර සැකකරුවෙකු සහ 'වෙඩික්කරු' ලෙස පුළුල් ලෙස සඳහන් වුවද, නඩුවට ඔවුන්ගේ ඇති සම්බන්ධය පැහැදිලි කළ නොහැකි විය.[71] තවත් සැකකරුවන් දෙදෙනෙකු තවමත් සොයා ගැනීමට නොහැකි බව ඔහු වැඩි දුරටත් පැවසීය. එයට ප්‍රතිචාර දක්වමින් නැපෝලියන් සහ මුරලි නිදහස් කිරීමෙන් ද සිල්වා අපරාධ නඩු විධාන සංග්‍රහය කඩ කර ඇති ආකාරය මහේස්ත්‍රාත්වරයා විසින් විස්තරාත්මකව පැහැදිලි කර

64 එසේ නම්, යාපනය පොලිසිය ඒ අවස්ථාවේ මේ පිළිබඳව අධිකරණයට කිසිදු වාර්තාවක් ලබා දී නැති බව පෙනේ.

65 ඔහුගේ බිරිඳ වන ජෙගතීස්වරන් තවමනි විසින් කරන ලද පැහැදිලි තහවුරු කිරීම සඳහා, 2001 අගෝස්තු 27 වන දින පොලිස් පරීක්ෂක ද සිල්වා විසින් අධිකරණයට ඉදිරිපත් කරන ලද ඇගේ ප්‍රකාශයේ රහස් පොලිස් සාරාංශය බලන්නMCJ2023 පිටු 282. PDA ප්‍රතිසංස්කරණයක් සඳහා, 2001 නොවැම්බර් 11 වන දින පොලිස් පරීක්ෂක ද සිල්වා විසින් අධිකරණයට ඉදිරිපත් කරන ලද ෂන්මුගරත්නම් ජෙයමෝහන් නොහොත් නිශාන්තන්ගේ ප්‍රකාශයේ රහස් පොලිස් සාරාංශය බලන්න: MCJ2023 පිටු 287.

66 රජයේ විශ්ලේෂක එම්.ඒ.ජේ. මෙන්ඩිස්ගේ වාර්තාව, 2001 මැයි 25: MCJ2023 පිටු 276.

67 2001 ජූලි මාසයේදී [අපැහැදිලි] දින රහස් පොලිස් පරීක්ෂක ලින්ටන් අධිකරණයට සිදු කළ ඉදිරිපත් කිරීම: MCJ2023 පිටු 278.

68 පරීක්ෂක ද සිල්වා, 2001 ජූලි 16 දින අධිකරණයට සිදු කළ ඉදිරිපත් කිරීම: MCJ2023 පිටු 95–97.

69 2001 අගෝස්තු 27 වන දින අධිකරණයට ඉදිරිපත් කරන ලද පොලිස් පරීක්ෂක ද සිල්වාගේ ලිපිය: MCJ2023 p282–283. එදින රාත්‍රියේ රාජකාරියේ යෙදී සිටි ශ්‍රී ලංකා හමුදාවෙන් බීබීසී විමසූ විට, 'ඔවුන් පැවසුවේ වාර්තා නැති වී ඇති බවයි'. ප්‍රාදේශීය මාධ්‍යවේදීන් ඇසීමට බිය වූ මෙම ප්‍රශ්නය (පිළිතුර නොවේ), පසුදා උදයන් පුවත්පතේ ප්‍රධාන මාතෘකාවක් බවට පත්විය. බලන්න: https://www.bbc.com/sinhala/highlights/story/2004/08/040820_frances

70 උසාවියේ සිදු වූ හුවමාරු, 2001 ඔක්තෝබර් 3: MCJ2023 පිටු 100–102, 284–285.

71 ෆ්‍රාන්සස් හැරිසන්, බීබීසී වාර්තාකාරිනී, කොළඹ 2000-2004.

සිටියේය. 2001 නොවැම්බර් 27 වැනි දින, ඔවුන් දෙදෙනාම අධිකරණයට ඉදිරිපත් කරන ලෙස ඔහු ද සිල්වාට නියෝග කළ අතර, එසේ කිරීමට ද සිල්වා අසමත් වුවහොත් ඔහුව 'අධිකරණ සේවා' වෙත වාර්තා කරන බවට තර්ජනය කළේය.[72]

### 3.5 2002: විමර්ශනය නැවත ආරම්භ විය

තමන්ගේම විමර්ශනයකින් අනතුරුව, දේශසීමා රහිත වාර්තාකරුවන් ප්‍රකාශ කර සිටියේ ‘2000 ඔක්තෝබර් සිට 2002 ජනවාරි දක්වා කාලය තුළ කොළඹ සහ යාපනයේ බලධාරීන් විසින් පොලිසියේ කටයුතු අවහිර කර ඇති’ බව තහවුරු කළ හැකි බවයි. කෙසේ වෙතත් 2001 දෙසැම්බර් 9 වන දින මැතිවරණයක් සහ ආණ්ඩු වෙනසක් සිදු වූ පසු, පොලිසිය ‘පෙර රජය යටතේ නතර වී තිබූ විමර්ශනය නැවත ආරම්භ කළ’ බව එහි සඳහන් විය.[73] 2002 පෙබරවාරි මාසයේදී ඒ හා සමානව *ටැමිල්නෙට්* ද වාර්තා කළේ නඩුව කඩිනම් කරන ලෙස නීතිපතිවරයා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට උපදෙස් දී ඇති බවයි.[74]

2002 මාර්තු 15 වැනි දින ද සිල්වා අධිකරණයට වාර්තා කළේ, ජෙගන් නමින් හැඳින්වෙන සැකකරු නැවත ප්‍රශ්න කිරීම සඳහා ගෙන්වා ගැනීමට දැරූ උත්සාහයන්හිදී තමා කලකිරීමට පත්ව ඇති බවයි. ජෙගන් ඩෙල්ෆ්ට් දූපතේ ඊපීඩීපී කඳවුරක සිටි අතර, ‘එහි ප්‍රතිඵලයක් ලෙස ඔහුව ගෙන ඒමට නොහැකි වී අතර ඊපීඩීපී විසින් ඔහුව නිදහස් කර නොමැත’ ජෙගන්ව ‘නොවරදවා’[75] ප්‍රශ්න කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙස ඊපීඩීපී නායක ඩග්ලස් දේවානන්දට නියෝග කරන ලෙස. ද සිල්වා යාපනය අධිකරණයෙන් ඉල්ලා සිටියේය. අප්‍රේල් 2 වැනි දින කොළඹදී නැවත ප්‍රශ්න කිරීම සඳහා ජෙගන් ඉදිරිපත් කරන ලදී. එහිදී කරන ලද ‘නීතිමය - වෛද්‍ය පරීක්ෂණයකින්’ ඔහුගේ සිරුරේ ‘පිළිස්සුම් සහ මොට අයුධයකින් මාස 6 කට වඩා වැඩි කාලයක් තිස්සේ ඇති වූ පැරණි කැළැල්,’ හෙළි විය. ලුමාලා බයිසිකලයේ ඡායාරූපයක් පෙන්වීමෙන් අනතුරුව එය ඔහු භාවිතා කළ බයිසිකලය ම විය හැකි බව ජෙගන් විසින් ප්‍රතික්ෂේප කළ නමුත් දින කිහිපයකට පසු වෙනම කරුණු විමසීමක දී ඔහුගේ බිරිඳ පොලිසියට පැවසුවේ මෙය සැබවින්ම ඔහුගේ බයිසිකලය බවයි. ද සිල්වා සඳහන් කළේ ඔහු නීතිපතිවරයාගෙන් උපදෙස් ලබා ගන්නා බවයි.[76]

2002 මැයි මාසයේදී, වින්දිතයා වෙනුවෙන් පෙනී සිටි නීතිඥයින් නිමලරාජන් ජීවත් වූ ප්‍රදේශයේ රාජකාරියේ යෙදී සිටි ආරක්ෂක නිලධාරීන් සංඛ්‍යාව පිළිබඳව කතා කළ අතර, ‘ඔවුන්ගේ අනුදැනුමකින් තොරව එදින කිසිවෙකු එම ස්ථානයට පැමිණීමේ හැකියාවක් නොමැති’ බව නැවත වරක් ප්‍රකාශ කර සිටියහ. කළහ. ඝාතනය සිදු වූ රාත්‍රියේ පොලිස් නිලධාරීන් මෙන්ම සෙබළුන් ද ආරක්ෂක රාජකාරියේ යෙදී සිටි බවත්, නමුත් මෙම නිලධාරීන්ගෙන් කිසිදු ප්‍රකාශයක් ලබාගෙන හෝ ඉදිරිපත් කර නොමැති බවත් එක් නීතිඥයෙක් පෙන්වා දුන්නේය.[77] මහේස්ත්‍රාත්වරයා මෙම අවස්ථාවේ දී නියෝග කළේ මෙම පොලිස් නිලධාරීන් ද හඳුනාගෙන ප්‍රකාශ ලබා ගත යුතු බවයි.[78] *ටැමිල්නෙට් වාර්තාවලට* අනුව, ‘ප්‍රධාන සැකකරු’ ලෙස හැඳින්වූ මෙන් ම වඩාත් මෑතකදී සිදු වූ දෙවන මිනීමැරුමකට සහ දරුණු පහරදීම් දෙකකට සම්බන්ධ බව පවසන නැපෝලියන් ගැන ද සාකච්ඡා කිරීම සිදු විය. ඔහු ‘රටෙන් පැන ගොස්’ ඇති බවත්, ඔහු අත්අඩංගුවට ගැනීම සඳහා ‘ඉන්ටපොල් සහාය ලබා ගන්නා’ බවත් පොලිසිය විසින් අධිකරණයට වාර්තා කර සිටියේය.[79] කිරීමේදී, *ටැමිල්නෙට්* විසින් පසුව සිදු කළ වාර්තාවක නැපෝලියන් ‘යාපනයේ ශ්‍රී ලංකා නාවික හමුදාව සමෙග සමීපව කටයුතු

[72] 2001 නොවැම්බර් 12, 2001 නොවැම්බර් 27 සහ 2001 නොවැම්බර් 26 යන දිනවල අධිකරණ සටහන්: MCJ 2023 පිටු 287, 289, 104. නිමලරාජන්ගේ ඝාතනයේ පළමු සංවත්සරය සනිටුහන් කරමින්, මාධ්‍යවේදීන් ආරක්ෂා කිරීමේ කමිටුව (CPJ) ශ්‍රී ලංකා ජනාධිපතිවරයාට ලිපියක් යවමින් කියා සිටියේ, ‘අපගේ ගෞරවනීය සගයාගේ ඝාතනය ගැඹුරින් විමර්ශනය කිරීමට බලධාරීන් අපොහොසත් වීම නිසා සංවිධානය දැඩි ලෙස කනස්සල්ලට පත්ව සිටින’ බවයි.: https://cpj.org/2001/10/on-anniversary-of-journalists-murder-cpj-demands-a/

[73] https://rsf.org/en/open-letter-sri-lankan-prime-minister. (රත්නසිරි වික්‍රමනායක වෙනුවට රනිල් වික්‍රමසිංහ අගමැති ධූරටයට පත් වීම සිදු විය.)

[74] TamilNet: 2002 පෙබරවාරි 10: https://www.tamilnet.com/art.html?catid=13&artid=6692

[75] පරීක්ෂක ද සිල්වා, 2002 මාර්තු 15 දින අධිකරණයට සිදු කළ ඉදිරිපත් කිරීම: MCJ2023 පිටු 106-107, 293.

[76] පොලිස් පරීක්ෂක ද සිල්වා, 2002 අප්‍රේල් 29 දින අධිකරණයට සිදු කළ ඉදිරිපත් කිරීම: MCJ2023 p296. මෙම ලේඛනයේ, එසේ විස්තර කර ඇති ජෙගන්ගේ 'නීත්‍යානුකූල' බිරිඳ පොන්නසාමි මේරි සුබා ලෙස නම් කර ඇත. (පැහැදිලිවම වෙනත් 'බිරිඳක්' සඳහා පාදසටහන 65 බලන්න.)

[77] 2001 අප්‍රේල් 23 වන දින යාපනය පොලිසිය සිදු කළ ඉදිරිපත් කළ ඉදිරිපත් කිරීමේ දී, ආරක්ෂක රාජකාරියේ යෙදී සිටින පොලිස් නිලධාරීන් සිටින බව ඔවුන් පසුකර යන විට දක්නට ලැබුණි.

[78] 2002 ජූලි 5 වන දින විනිසුරු විග්නරාජාගේ නියෝගය: MCJ2023 පිටු 129.

[79] දෙමළ බෙදුම්වාදී දේශපාලනඥයන් ‘පොලිස් ප්‍රකාශය ප්‍රතික්ෂේප කරන’ බව කියනු ලැබීය. බලන්න TamilNet: 7 ජූනි 2002: https://www.tamilnet.com/art.html?catid=13&artid=7037

කළ' බවත්, ඔහු 'ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවන්හි සමහර බලවත් අංශවල සහාය ඇතිව' රටින් පිටව ගොස් ඇති බවට සැක කරන බවටත් චෝදනා කර තිබුණි.[80]

ජුනි 5 වැනි දින, ඊපීඩීපී සංවිධානයේ සාමාජිකත්වය පිළිබඳ සම්පූර්ණ ලියකියවිලි සහ එහි ගිනි අවි එකතුව පිළිබඳ සම්පූර්ණ තොරතුරු මෙන් ම, ජෙගන්, 273 ස්ටැන්ලි පාරේ ඊපීඩීපී ලේකම් කාර්යාලයේ බයිසිකල් ඇතුළු ඊපීඩීපී වාහන භාරව සිටි 'විශ්වාන් සහ ඊපීඩීපී සංවිධායක පසුපතිපිල්ලෙයි ජෙගතීස්වරන් නොහොත් විෂු අධිකරණයට ඉදිරිපත් කරන ලෙස නියෝග කරන ලෙසට ද සිල්වා අධිකරණයෙන් ඉල්ලා සිටියේය.[81] ඊපීඩීපී සංවිධානය එහි සාමාජිකයින් හය දෙනෙකු ද සිල්වාට වෙත යොමු කළ නමුත් තවත් 13 දෙනෙකු සොයා ගැනීමට ඔහුට උදව් කිරීමට අපොහොසත් විය.[82] එහිදී ගිනි අවි පිළිබඳ 'නිසි ලෙස සකස් කළ' වාර්තාවක් ද ලබා දුන්නේ නැත.[83] කෙසේ වෙතත්, එම මාසයේම මිනීමැරුමකට සැකපිට ජෙගන් සහ විශ්වන් අත්අඩංගුවට ගැනීමට ද සිල්වාට එහි අනුකූලතාවය ප්‍රමාණවත් විය. දෙදෙනාම රක්ෂිත බන්ධනාගාරගත කරන ලදී.[84] ජෙගන් මහේස්ත්‍රාත්වරයාට පෞද්ගලිකව ස්වේච්ඡා ප්‍රකාශයක් ලබා දුන් අතර එය අධිකරණ වාර්තාවල දක්නට නොලැබේ.[85] අදාළ බයිසිකලය තමාට භාර දී ඇති බව හෝ ඝාතනය සිදු වූ අවස්ථාවේ යාපනයේ ඊපීඩීපී වාහන භාරව සිටි බව හෝ එය සිදු වූ විට ඔහු යාපනයේ සිටි බව ප්‍රතික්ෂේප කරමින් විශ්වන් අධිකරණය අමතමින් 'මේ සිද්ධියට මගේ කිසිම සම්බන්ධයක් නැහැ.' යනුවෙනුත් ඒ අවස්ථාවේ භාරව සිටි පුද්ගලයා අතුරුදහන් වී ඇති බවත් පැවසීය.[86]

2002 ජූලි 4 වැනි දින, *ටැමිල්නෙට්* වෙබ් අඩවියට අනුව[87], 'හිටපු ඊපීඩීපී සාමාජිකයෙකු' වූ නව සාක්ෂිකරුවෙකු වන පොන්නයියා ධර්මලිංගම්, පොලිසියට කතා කිරීමට බිය වන බව පවසමින්, මහේස්ත්‍රාත්වරයාට පෞද්ගලිකව ප්‍රකාශයක් ඉදිරිපත් කළේය.[88] 2000 ඔක්තෝබර් අගභාගයේදී, නිමලරාජන්ගේ ඝාතනයෙන් ටික කලකට පසු, ඔහු සලීම් නම් ඊපීඩීපී සාමාජිකයෙකු සමග මත්පැන් පානය කර ඇති අතර, එහිදී මුරලි 'නිමලරාජන්ගේ ඝාතනයට බියෙන්' ඊපීඩීපී පක්ෂයෙන් ඉවත් වූ බව හෙළි විය. ඝාතනය සිදු වූ රාත්‍රියේ 'මුරලි, බාෂා [බැච්චා] සහ සත්‍යා පාපැදි දෙකක් රැගෙන ප.ව. 7.00 ට පමණ යාපනයේ ඊපීඩීපී කාර්යාලයෙන් පිටව ගිය ආකාරය' දුටු බව සලීම් තවදුරටත් පවසා තිබුණි. පසුව ද සිල්වා විසින් කරන ලද ප්‍රශ්න කිරීම්වලදී, නිමලරාජන් ඝාතනය සිදු වූ දින රාත්‍රියේ ඊපීඩීපී කාර්යාල ගේට්ටුවේ රාජකාරියේ යෙදී සිටි සලීම්, රාත්‍රී 10.00 ට තමා රාජකාරියෙන් ඉවත් වූ බවත්, පසුදා අලුයම 5.30 ට මුරලි සහ බාෂා ඊපීඩීපී කාර්යාලයේ නිදා සිටිනු දුටු බවත් තවදුරටත් පැහැදිලි කර තිබුණි.[89] සැකකරුවෙකු කොළඹ පිහිටි ඊපීඩීපී කාර්යාල මූලස්ථානයේ සහ එය ඩග්ලස් දේවානන්දගේ නිවසේ පදිංචිව සිටින බවට තොරතුරු ලැබී ඇති බව පවසමින් ජූලි 5 වන දින, ද සිල්වා විසින් අධිකරණයෙන් සෝදිසි වරෙන්තුවක් ඉල්ලා සිටියේය. වාර්තාවල 'නඩුවෙන් නිදහස් වූ පුද්ගලයෙකු' ලෙස පමණක් සැකකරු ගැන විස්තර කර ඇත. වරෙන්තුව නිකුත් කරන ලද නමුත් සැකකරු 'එම ස්ථානයේ නොසිටි' බැවින් අත්අඩංගුවට ගැනීමට නොහැකි විය.[90] ද සිල්වා ඊළඟ වසර දෙක තුළ දී සලීම්ගෙන් නැවත කරුණු විමසීමට උත්සාහ කරන විට, සලීම් ද අතුරුදහන් වී ඇති බව ඔහුට පෙනී ගියේය.[91] එසේ වුවත් ජූලි 20 වැනි දින ත්‍රිකුණාමලයේදී ද සිල්වා විසින් ඩේවිඩ් මයිකල් කොලින් නොහොත් මුරලි අත්අඩංගුවට ගෙන කොළඹට රැගෙන ගිය අතර, ජූලි 30 වැනි දින ඔහු රක්ෂිත බන්ධනාගාරගත කරන ලදී. දින කිහිපයකට පසු,

[80] *TamilNet*: 2002 නොවැම්බර් 11: https://www.tamilnet.com/art.html?catid=13&artid=7799

[81] බලන්න MCJ2023 පිටු108-109.

[82] නම් 19 සඳහා MCJ2023 පිටු 303.

[83] පොලිස් පරීක්ෂක ද සිල්වා සහ උප පොලිස් පරීක්ෂක එම්.ආර්. දයාරත්න, 2002 ජුනි 7 වන දින අධිකරණයට සිදු කළ ඉදිරිපත් කිරීම: MCJ2023 පිටු 111.

[84] පොලිස් පරීක්ෂක ද සිල්වා, 2002 ජුනි 11 දින අධිකරණයට සිදු කළ ඉදිරිපත් කිරීම: MCJ2023 පිටු 305-306; 2002 ජුනි 21 දින උප පොලිස් පරීක්ෂක එම්.පී.සී. සී. ද සිල්වාගේ වාර්තාව, විශ්වන් සහ ජෙගන් අත්අඩංගුවට ගැනීම සහ 2002 ජුනි 21 දින විශ්වන් අධිකරණයේ පෙනී සිටීම පිළිබඳව: MCJ2023 පිටු 310, 120.

[85] 2002 ජූනි 12 අධිකරණ නඩු විභාගය බලන්න: MCJ2023 පිටු 117-119.

[86] පලනිච්චාමි විශ්වනාදන්, 2002 ජුනි 21 දින අධිකරණයට සිදු කළ ප්‍රකාශය: MCJ2023 පිටුව 121.

[87] *TamilNet*: 4 ජූලි 2002: https://www.tamilnet.com/art.html?catid=13&artid=7154

[88] MCJ2023 පිටු 124-126 බලන්න.

[89] 2002 අගෝස්තු 7 වන දින පොලිස් පරීක්ෂක ද සිල්වා විසින් අධිකරණයට ඉදිරිපත් කරන ලද හමීඩ් සුල්තාන් මොහොමඩ් රිල්වාන් හෙවත් සලීම්ගේ ප්‍රකාශයේ රහස් පොලිස් සාරාංශය: MCJ2023 පිටු 360.

[90] පරීක්ෂක ද සිල්වා, 2002 ජූලි 5 වන දින අධිකරණයට සිදු කළ ඉදිරිපත් කිරීම: MCJ2023 පිටු 127-129; 2002 ජූලි 19 දින ඉදිරිපත් කරන ලද අතිරේක වාර්තාව: MCJ2023 පිටුව 132.

[91] පරීක්ෂක ද සිල්වා, 2002 නොවැම්බර් 11, 2002 දෙසැම්බර් 10, 2003 ඔක්තෝබර් 30, 2004 මාර්තු 23 සහ 2004 අප්‍රේල් 27 යන දිනවල අධිකරණයට සිදු කළ ඉදිරිපත් කිරීම්: MCJ2023 pp383, 385, 409, 420, 424.

යාපනයේ තමාට ජීවිත තර්ජන ඇති බව පවසමින් මුරලි නැවත කොළඹට බන්ධනාගාරයට මාරු කරන ලෙස ඉල්ලා සිටියේය.[92] අත්අඩංගුවට ගැනීමෙන් පසු තමාට දරුණු ලෙස පහර දුන් බවත්, කියවිය නොහැකි භාෂාවකින් කළ ප්‍රකාශයකට තම අත්සන ලබා ගන්නා විට තමා සිහිසුන්ව සිටි බවත් ඔහු කියා සිටියේය. ඔහුට ආරක්ෂාව සපයන ලෙසත් වෛද්‍ය පරීක්ෂණයක් සංවිධානය කරන ලෙසත් අධිකරණය යාපනය බන්ධනාගාර බලධාරීන්ට නියෝග කළේය.[93]

අගෝස්තු 7 වැනි දින, පොලිසිය පැවසූ පරිදි,[94] මුරලි විසින් සපයන ලද තොරතුරු මත පදනම්ව, ද සිල්වා විසින් කරාලසිංහම් සින්දුපරන් නොහොත් බැව්වා ද අත්අඩංගුවට ගනු ලැබිණි. මුරලි මෙන්ම ඔහු ද , ඝාතනය සිදු වූ රාත්‍රියේ ඊපීඩීපී යාපනය කාර්යාලයේ සිට බයිසිකලයෙන් පිටව ගිය බව කියනු ලැබේ. බැව්වා යාපනයේ රක්ෂිත බන්ධනාගාරගත කරන ලදී.[95] යාපනයේ ඊපීඩීපී කාර්යාල දෙක සෝදිසි කිරීම සඳහා වූ වරෙන්තුවක් අනුව කටයුතු කළ ද සිල්වාට, ඉන් එකක දී ඊපීඩීපී සාමාජිකයෙකු සතුව තිබී චීනයේ නිෂ්පාදිත මිමී 9 පිස්තෝලයක් සහ ජීව උණ්ඩ හයක් අත්අඩංගුවට ගැනීමට හැකි වූ අතර ඒවා ඔහුට 1999 දී යාපනයේ ආරක්ෂක හමුදා අණදෙන නිලධාරියා විසින් නිකුත් කරන ලද බව පවසා තිබුණි.[96] නිමලරාජන්ගේ අධ්‍යයනයෙන් සොයාගත් නඩු භාණ්ඩ P3 උණ්ඩ කොටස්වලට අදාළව මෙම ඊපීඩීපී පිස්තෝලය විශ්ලේෂණය කරන ලෙස සති හයකට පසු ද සිල්වා මහතා ඉල්ලා සිටියේය.[97]

අගෝස්තු 20 වැනි දින, මහේස්ත්‍රාත්වරයා විසින් සිදු කරන ලද ප්‍රගතිය පිළිබඳ ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන්, ඝාතනය සිදු වූ රාත්‍රියේ රක්කා පාර ආරක්ෂක මුරපොළේ රාජකාරියේ යෙදී සිටි පොලිස් නිලධාරීන් සියලු දෙනා මාරු කර ඇති බවත්, ඔවුන් සිටින ස්ථාන තවමත් තහවුරු කර නොමැති බවත් ද සිල්වා වාර්තා කළේය.[98] විත්තියේ නීතිඥයෙකු සහ වින්දිතයා වෙනුවෙන් පෙනී සිටින නීතිඥයෙකු යන දෙපාර්ශ්වයක් විසින් ම අඛණ්ඩ විමර්ශන ප්‍රමාදය නිසා සිදුවන අසාධාරණය පිළිබඳව අධිකරණයට පැමිණිලි ඉදිරිපත් කර තිබුණි. විත්ති පාර්ශ්වය ප්‍රකාශ කර සිටියේ එය දැනට රක්ෂිත බන්ධනාගාරගත කර සිටින සැකකරුවන් සිව්දෙනාගේ 'මානව හිමිකම් උල්ලංඝනය කිරීමක්' ලෙසය.[99] වින්දිතයාගේ නීතිඥවරයා පිළිතුරු දෙමින්, 'මාධ්‍යවේදියෙකුගේ ඝාතනය මානව හිමිකම් උල්ලංඝනය කිරීමක් මෙන් ම එය ඛේදජනක සිදුවීමක්' බව සඳහන් කරමින්, සිද්ධිය වූ අවස්ථාවේ පැවති දේශපාලන තත්වයන් නිසා පමණක් 'පරීක්ෂණය ඇණහිට තිබුණු' බවට නිරීක්ෂණය කළේය. මේ අවස්ථාවේ පවා, විමර්ශනය සැබවින්ම සිදුවෙමින් තිබුණේ 'ජාත්‍යන්තර ආයතන කිහිපයකින් එල්ල වූ පීඩනය නිසා' පමණි.[100]

2002 සැප්තැම්බර් 3 වැනි දින, විත්තියේ නීතිඥයෙකු තර්ක කළේ සැකකරුවන් වරදකරුවන් කිරීම සඳහා අධිකරණයට 'සාක්ෂි බිඳුවක්වත්' ඉදිරිපත් කර නොමැති බවයි. 'මෙම ඝාතන සිද්ධිය උපයෝගී කරගනිමින් දේශපාලනඥයින් සහ දේශපාලන පක්ෂ තමන්ගේම ලාභ ප්‍රයෝජන ලබා අපේක්ෂා කරන බව මම බියෙන් තොරව ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි.'[101] ඒ සමගම, ද සිල්වා කඩිනමින් පෙන්වා දුන්නේ, විවිධ තීරණාත්මක උණ්ඩ කොටස් සම්බන්ධයෙන් තව දුරටත් පුපුරන ද්‍රව්‍ය විශ්ලේෂණයක් අවශ්‍ය වන බවයි.[102] සැප්තැම්බර් 16 වැනි දින, මූල්‍ය ඇපකරුවන්ට යටත්ව,

[92] සැකකරු සහ ඔහුගේ නීතිඥ පොන් වෙට්‍රිවේල් මහතා, 2002 අගෝස්තු 2 වන දින විනිසුරු විග්නරාජා ඉදිරියේ සිදු කළ අධිකරණ විභාගය: MCJ2023 පිටු 140–144.

[93] මෙම වෛද්‍ය වාර්තාව අධිකරණ වාර්තාවල දක්නට නොලැබේ.

[94] *බලන්න TamilNet*: 7 අගෝස්තු 2002: https://www.tamilnet.com/art.html?catid=13&artid=7254

[95] පොලිස් පරීක්ෂක ද සිල්වාගේ අත්අඩංගුවට ගැනීමේ වාර්තාව 2002 අගෝස්තු 2: MCJ2023 පිටු 320; 2002 අගෝස්තු 7 වන දින අධිකරණයට ඉදිරිපත් කරන ලද බැවා: MCJ2023 පිටු 360.

[96] 2002 අගෝස්තු 13 වන දින MCJ2023 p148 දින විත්තියේ නීතිඥ පොන් වෙට්‍රිවෙල් මහතා විසින් අධිකරණයට ඉදිරිපත් කරන ලද සෝදිසි කිරීමක් පිළිබඳව පරීක්ෂක ද සිල්වා විසින් විස්තර කරන ලද ප්‍රතිඵල, 2002 අගෝස්තු 20 වන දින අධිකරණයට ඉදිරිපත් කිරීම: MCJ2023 පිටු 363.

[97] පොලිස් පරීක්ෂක ද සිල්වා, 2002 ඔක්තෝබර් 21 දින අධිකරණයට සිදු කළ ඉදිරිපත් කිරීම: MCJ2023 p378. 1999 පුරා යාපනය ආරක්ෂක හමුදාවට අණ දුන්නේ පුද්ගලයන් දෙදෙනෙකු විසිනි: බ්‍රිගේඩියර් LCR ගුණවර්ධන RSP USP ndu IG, 1998.11.09 - 1999.11.12, සහ මේජර් ජෙනරාල් PSP මුණසිංහ RWP RSP USP, 1999.11.12 - 1999.12.26. බලන්න: https://alt.army.lk/sfhqj/past-commanders

[98] පරීක්ෂක ද සිල්වා, 2002 අගෝස්තු 20 දින අධිකරණයට සිදු කළ ඉදිරිපත් කිරීම: MCJ2023 පිටු 363.

[99] සැකකරුවන් වෙනුවෙන් පෙනී සිටි වෙට්‍රිවේලු මහතා, 2002 අගෝස්තු 20 වන දින අධිකරණයට සිදු කළ ඉදිරිපත් කිරීම: MCJ2023 පිටුව 152.

[100] වින්දිතයා වෙනුවෙන් කේ.එස්. රත්නවේල් මහතා 2002 අගෝස්තු 20 වන දින අධිකරණයේ පෙනී සිටියේය: MCJ2023 පිටුව 153.

[101] සැකකරුවන් වෙනුවෙන් පෙනී සිටින වෙට්‍රිවේලු මහතා, 2002 සැප්තැම්බර් 3 වන දින අධිකරණයට සිදු කළ ඉදිරිපත් කිරීම: MCJ2023 පිටුව 154.

[102] පරීක්ෂක ද සිල්වා, අධිකරණයට සිදු කළ ඉදිරිපත් කිරීම, 2002 සැප්තැම්බර් 17: MCJ2023 p158. ඔක්තෝබර් මාසයේදී දේශසීමා රහිත වාර්තාකරුවන් ශ්‍රී ලංකා ජනාධිපතිවරයාට ලියූ ලිපියේ ලියා ඇත්තේ, 'ශ්‍රී ලංකා පොලිසියට සහ අධිකරණ බලධාරීන්ට ජාත්‍යන්තර විශේෂඥයින්ගේ, විශේෂයෙන් ගිනි අවි සහ අධිකරණ හඳුනාගැනීම් පිළිබඳ විශේෂඥයින්ගේ සහාය ලබා දීමට' තමන් සූදානම් බවයි.: https://rsf.org/en/open-letter-sri-lankan-prime-minister.

වවුනියාවේ පළාත් මහාධිකරණය විසින් චෝදනා ලැබූ මුරලිට සහ ඊපීඩීපී වාහන කළමනාකරු විශ්වන්ට ඇප ලබා දෙන ලදී.[103] වෙනත් අධිකරණයක නඩුව විභාග වෙමින් පවතින විට, මෙසේ සිදු කිරීම අපරාධ නඩු විධාන සංග්‍රහයට පටහැනි බව දක්වමින් වින්දිතයාගේ නීතිඥයෙකු විරුද්ධ විය.[104] ඔහු තව දුරටත් මේ එරෙහි වීම ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර සිටියේ මෙම ඇප දීම 'කිසිදු සීමා පැනවීමකින් තොරව' ලබා දී ඇති බවයි. මේ සියල්ල අතරතුර, තවත් සැකකරුවෙකු වසරක් තිස්සේ සැඟවී සිටින බව ඔහු පැවසීය. ඔහු තව දුරටත් ප්‍රකාශ කර සිටියේ: 'නැපෝලියන් රටින් පලා ගොස් ඇති අතර' ඇප මත මුදා හරින ලද මෙම දෙදෙනා ද පැන යනු ඇතැයි අපේක්ෂා කළ හැකි බවයි. එසේ වන විට, 'යුක්තිය පසිඳලීම කෙරෙහි ජනතාවට ඇති බලාපොරොත්තුවක් අහිමි වීමට අවස්ථාවක් තිබේ'. ඔවුන්ගේ විදේශ ගමන් බලපත්‍ර රාජසන්තක කර සතිපතා පොලිසියට වාර්තා කරන ලෙස නියම කරන ලෙස ඔහු අධිකරණයෙන් ඉල්ලා සිටියේය.[105] යාපනය මහේස්ත්‍රාත්වරයා මැදිහත් වී දෙසතියකට වරක් සිදු කෙරෙන පරීක්ෂාවක් පැනවූ විට, මහේස්ත්‍රාත්වරයා සිය බලතල ඉක්මවා ගොස් ඇති බවට විත්ති පාර්ශ්වයේ නීතිඥයින් තර්ක කළෝය. පසුව, මහාධිකරණය විසින් සැකකරුවන් මසකට වරක් වාර්තා කළ යුතු බවට තීන්දු කළේය.[106]

නොවැම්බර් 11 වැනි දින, ද සිල්වා විසින් යාපනය අධිකරණයට පවසා සිටියේ, රජය සහ එල්ටීටීඊය අතර එම වසරේ ම පෙබරවාරි 23 වැනි දින ඇති වූ සටන් විරාමයෙන් අනතුරුව, ඊපීඩීපී සංවිධානය සතුව තිබූ බොහෝ අවි, කොළඹ හමුදා මූලස්ථානයට භාර දී ඇති බවයි.[107] ඊපීඩීපී සංවිධානය විසින් භාර දෙන ලද මිමී 9 ගිනි අවි 'වහාම' හමුදාපතිවරයාට භාර දිය යුතු බවට මහේස්ත්‍රාත්වරයා නියෝග කළේය.[108]

මාසයකට පසු, 2002 දෙසැම්බර් 11 වැනි දින වන විට ද, ද සිල්වාට අවි විමර්ශනය පිළිබඳව වාර්තා කිරීමට කිසිවක් නොතිබුණි. මහේස්ත්‍රාත්වරයා ඔහුට තවත් මාසයක් කල් ලබා දුන්නේ, අවම වශයෙන් 'නඩුවට පොලිසිය සහ හමුදාව සම්බන්ධයෙන් ඇති ජාත්‍යන්තර අපකීර්තිය ඉවත් කිරීමට' දායක වීමට පමණක් නොවේ.[109] ඔහු නැවතත් පෙන්වා දුන්නේ, 'රාත්‍රී ඇඳිරි නීතිය ක්‍රියාත්මක වන ඒ අවස්ථාවේ, එම ස්ථානය වටා සිටින හමුදා මුරපොළේ සිටින පුද්ගලයින්ගේ අනුදැනුමකින් තොරව ඝාතනය සිදු විය නොහැකි' බවයි. වසර එකහමාරකට පෙර, ඝාතනය සිදු වූ රාත්‍රියේ රාජකාරියේ යෙදී සිටි සියලුම ආරක්ෂක නිලධාරීන්ගෙන් ලබා ගැනීමට නියෝග කළ ප්‍රකාශ තවමත් තමාට ලැබී නොමැති බව ඔහු දක්වා සිටි අතර, 'එම නියෝගය පොලිසිය විසින් නොසලකා හැර ඇති බව පැහැදිලිය' යනුවෙන් කෙලින්ම පැවසීය, එහි ප්‍රතිඵලයක් ලෙස නඩුව තව දුරටත් ඉදිරියට ගෙන යා නොහැකි විය.[110]

## 3.6 2003: රවටිලිකාර ඉදිරිගමනක සේයාවක්

2003 ජනවාරි මැද භාගයේ දී, ඊපීඩීපී සතුව තිබී පසුව 2002 දී ශ්‍රී ලංකා හමුදාව යටතට පත් වූ මිමී 9 පිස්තෝල පහක් වන නඩු භාණ්ඩ P5–P9 - විමර්ශනය සඳහා රජයේ විශ්ලේෂකයින් වෙත යොමු කළ යුතු බවට නියෝග කිරීමට බලය ඇත්තේ කාටද යන්න සම්බන්ධ කරගෙන නිලධාරිවාදී ප්‍රමාදයන් මතු විය.[111] පෙබරවාරි මාසයේ යාපනය අධිකරණයේ දී මෙම කාරණය නැවත මතු වූ විට, ද සිල්වා විසින් මෙම විශේෂිත ගිනි අවිවල නිශ්චිත මූලාශ්‍රය ඊපීඩීපී

103 අධිකරණ සටහන් බලන්න: MCJ2023 පිටු 20, සහ වවුනියාව මහාධිකරණ විනිසුරුවරයාගේ නියෝගය, 2002 අගෝස්තු 15: MCJ2023 පිටුව 352.

104 *TamilNet*: 11 සැප්තැම්බර් 2002: https://www.tamilnet.com/art.html?catid=13&artid=7458

105 වින්දිතයා වෙනුවෙන් පෙනී සිටි රෙමීඩියස් මහතා, 2002 අගෝස්තු 17 වන දින අධිකරණයට සිදු කළ ඉදිරිපත් කිරීම: MCJ2023 පිටු 161-163.

106 විනිසුරු විග්නරාජා විසින් 2002 නොවැම්බර් 11 වන දින නිකුත් කරන ලද නියෝගය: MCJ2023 p166; විත්තිකරු වෙනුවෙන් පෙනී සිටි සිරිසිවයා මහතා, 2003 ජූලි 4 වන දින වවුනියාව මහාධිකරණයට සිදු කළ ඉදිරිපත් කිරීම: MCJ2023 පිටු 353; වවුනියාව මහාධිකරණ විනිසුරු, ඇප කොන්දේසි වෙනස් කරන ලදී, 2003 ජූලි 23: MCJ2023 පිටු 357.

107 බලන්න https://peacemaker.un.org/sites/default/files/document/files/2024/05/lk020222ceasefireagreementgovernment-liberationtigerstamileelam.pdf

108 පරීක්ෂක ද සිල්වා, අධිකරණයට සිදු කළ වාර්තාව, 2002 නොවැම්බර් 11: MCJ2023 පිටු 383; විනිසුරු විග්නරාජා විසින් නියෝගය, 2002 නොවැම්බර් 11: MCJ2023 පිටු164.

109 බලන්න MCJ2023 පිටු 174, 178.

110 MCJ2023 පිටු177.

111 2003 ජනවාරි 14 වන දින අධිකරණයට ඉදිරිපත් කරන ලද වාර්තාවක පොලිස් පරීක්ෂක ද සිල්වා මහතා, මෙම කරුණ සම්බන්ධයෙන් නීතිපතිවරයාගෙන් උපදෙස් ලබා ගන්නා ලෙස කොළඹ මහේස්ත්‍රාත්වරයෙකු විසින් උපදෙස් ලබා දී ඇති බව සඳහන් කරයි: MCJ2023 පිටු 179, 387.

තුළ තහවුරු කර නොමැති බව පැහැදිලි විය.[112] කෙසේ වෙතත්, 2000 ඔක්තෝබර් 19 වැනි දින රාත්‍රියේ රක්කා පාරේ ආරක්ෂක මුරපොළේ රාජකාරියේ යෙදී සිටි පොලිස් නිලධාරීන් හතර දෙනාගෙන් දෙදෙනෙකුගෙන් කරුණු විමසීමට ඔහු සමත් වී තිබුණි. ඔවුන් පවසා තිබුණේ 'ඝාතනය සිදු වූ අවස්ථාවේ' පිපිරීමක් ඇසුණු නමුත් එය 'ඇඳිරි නීතිය වේලාවේදී සිදු වූ' බැවින් ඔවුන් කිසිවෙකු දැක නොමැති බවත්ය.[113] 2003 මාර්තු මාසයේ දී, මීට පෙර රටින් බැහැරව සිටියාද නැද්ද යන්න නොසලකා, 2001 දෙසැම්බර් මහ මැතිවරණයේදී ප්‍රතිවාදී දේශපාලන ක්‍රියාකාරීන්ට එල්ල වූ මාරාන්තික ප්‍රහාරයක් වූ නාරන්තනෙයි ඝාතන පිටුපස සිටින ඊපීඩීපී පැරාමිලිටරි සාමාජිකයකුන් වන නැපෝලියන් 'ප්‍රධාන සැකකරුවෙකු' ලෙස යාපනය අධිකරණයට ඉදිරිපත් කරන ලදී.[114] මෙම දෙවන නඩුවේ දී නැපෝලියන් ඇප ලබා ගත් අවස්ථාවේ දී, 2001 නොවැම්බර් මාසයේ වරෙන්තුව මත නිමලරාජන්ගේ ඝාතනයේ සැකකරුවෙකු ලෙස ඔහුව නැවත අත්අඩංගුවට ගන්නා ලෙස නිමලරාජන්ගේ නීතිඥවරයා වන රෙමීඩියස් මහතා, පොලිසියෙන් ඉල්ලා සිටියේය. සියල්ලට පසු, ඔහු 'අධිකරණයේ පෙනී සිටි' නමුත් පොලිසිය ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට අපොහොසත් විය. මෙම අමූලික අතපසුවීම පිළිබඳව ලිඛිත පැහැදිලි කිරීමක් ලබා දෙන ලෙස මහේස්ත්‍රාත්වරයා ද සිල්වාට නියෝග කළ අතර, වරෙන්තුව ක්‍රියාත්මක කරන ලෙස නැවතත් නියෝග කළේය.[115]

2003 අප්‍රේල් මාසයේදී රජයේ පුපුරණ ද්‍රව්‍ය විශ්ලේෂකයින්ගෙන් විසින් නව ප්‍රතිඵල ලබා දීම සිදු විය. නඩු භාණ්ඩ P3, එක් උණ්ඩයක් සහ කොටස් දෙකක්, මිමී 9 පිස්තෝල උණ්ඩයට 'සමාන' වූ නමුත්, ඒවා ඊට වඩා විනාශ වී සහ විකෘති වී ඇති බව හැර වෙනත් කිසිවක් නිගමනය කළ නොහැකි විය. නඩු විභාගය සඳහා ඉදිරිපත් කළ පිස්තෝල හයම අත්හදා බැලීමෙන් පසු පෙනී ගියේ වෙඩි තැබීම සිදු වූ රාත්‍රියේ හමුදාව විසින් සොයා ගන්නා ලද නඩු භාණ්ඩ P2, උණ්ඩය හෝ ආවරණයට, ඒවා නොගැලපෙන බවයි. එසේම යාපනයේදී අත්අඩංගුවට ගත් නඩු භාන්ඩ P4 පිස්තෝලය හෝ කොළඹින් ලබාගත් පිස්තෝල පහ භාවිත කර අවසන් වරට වෙඩි තැබුවේ කවදාද යන්න තීරණය කිරීමට ද නොහැකි විය.[116] පිස්තෝල පහේ හිමිකාරීත්ව අනුපිළිවෙල (භාරකාරත්ව දාමය) පිළිබඳව විමසූ විට, සාජන් මේජර්වරයෙකු අධිකරණය හමුවේ පෙනී සිට, 'සාක්ෂිකරුවන් නොමැති' බැවින් කිසිවෙකුට මෙයට පිළිතුරක් ලබා දිය නොහැකි බව 'ඉහළ නිලධාරීන්' විසින් තමාට දන්වා ඇති බව පැවසීය.[117] මැයි මාසයේදී, නඩු භාණ්ඩ P5–P9 පිස්තෝල සියල්ලම ශ්‍රී ලංකා හමුදාව විසින් ඊපීඩීපී වෙත නිකුත් කර ඇති ඒවා බව ද සිල්වා විසින් තහවුරු කළේය.

නිමලරාජන්ගේ ඝාතනයට නැපෝලියන් සම්බන්ධ බවට කිසිදු සාක්ෂියක් මෙතෙක් විමර්ශනවලින් ලැබී නොමැති බවත්, 'ප්‍රමාණවත් සාක්ෂි නොමැති' බැවින් ඔහු අත්අඩංගුවට ගෙන නැති බවත් ද සිල්වා අප්‍රේල් මාසයේදී ලිඛිත ඉදිරිපත් කිරීමකින් ප්‍රකාශ කර සිටියේය.[118] මැයි 30 වැනි දින යාවත්කාලීන කිරීමකදී, ද සිල්වා ප්‍රකාශ කළේ වින්දිතයාගේ නීතිඥවරයා නැපෝලියන් යාපනය අධිකරණයට ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටීමෙන් පසුව, නීතිපතිවරයා සමග සාකච්ඡා කළ බවත්, තමා නීතිපතිවරයාගෙන් උපදෙස් ලබා ගත් බවත්, 'ප්‍රමාණවත් සාක්ෂි' නොමැති නම් අත්අඩංගුවට නොගන්නා ලෙස ඔහු දන්වා සිටි බවත්ය. මේ දක්වා විමර්ශනවල දී නැපෝලියන්ට එරෙහිව 'මේ සම්බන්ධයෙන් කිසිදු සාක්ෂියක්' සොයාගෙන නොමැති බවත් ඔහු නැවත නැවතත් පැවසීය. ජූනි මාසයේදී, මෙසේ ප්‍රකාශිත සාක්ෂි නොමැතිකම නිසා, නිමලරාජන් නඩුව සම්බන්ධයෙන් 'පෙත්සම්කරු [නැපෝලියන්] අත්අඩංගුවට ගැනීමට හෝ රඳවා තබා ගැනීමට කිසිදු නියෝගයක් නිකුත් නොකෙරේ' යන ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවක් ලැබුණි.[119]

112 2003 පෙබරවාරි 25 වන දින විනිසුරු විග්නරාජා විසින් පොලිස් පරීක්ෂක ද සිල්වාට පිළිතුර සොයා ගැනීමට නියම කරමින් නිකුත් කරන ලද නියෝගයකින් පැහැදිලි වේ: MCJ2023 පිටු188.

113 2003 පෙබරවාරි 25 දින පොලිස් පරීක්ෂක ද සිල්වා විසින් කරන ලද වාර්තාවක රක්ෂිත පොලිස් කොස්තාපල් (RPC) මහින්ද දර්මප්‍රිය වීරසිංහ සහ RPC ජයවීර ආච්චිලාගේ ඥානරත්න ජයවීර යන අයගේ ප්‍රකාශවල රහස් පොලිස් සාරාංශය: MCJ2023 පිටු 389.

114 මෙය නාරන්තනෙයි ඝාතන නඩුවයි. බලන්න TamilNet: 27 මාර්තු 2003: https://www.tamilnet.com/art.html?catid=13&artid=8616

115 අධිකරණ විභාගය, 2003 මාර්තු 27: MCJ2023 පිටු 190-192.

116 රජයේ සහකාර විශ්ලේෂක පී.ජී. මඩවල සහ ජොෂ්ඨ රජයේ විශ්ලේෂක ඩබ්ලිව්.ඩී.පී.එස්. ගුණතිලකගේ වාර්තාව, 2003 අප්‍රේල් 23: MCJ2023 පිටු 323-327.

117 විනිසුරු විග්නරාජා විසින් සාජන් මේජර් පියසේනගෙන් ප්‍රශ්න කරන ලදී, 2003 අප්‍රේල් 25: MCJ2023 පිටුව 193.

118 පරීක්ෂක ද සිල්වා, 2003 අප්රේල් 25: MCJ2023 පිටු 394.

119 පරීක්ෂක ද සිල්වා, 2003 මැයි 30: MCJ2023 පි 397. වෙනම මිනීමැරුම් චෝදනාවක් මත ඇප මත මුදා හැරීමෙන් පසු නිමලරාජන් නඩුවේදී නැපෝලියන් අත්අඩංගුවට ගැනීමට හෝ රඳවා තබා ගැනීමට ඇති හැකියාවට එරෙහිව ඔහුගේ නීතිඥයින් විසින් ඉදිරිපත් කරන ලද පෙත්සමකට ශ්‍රේෂ්ඨාධිකරණ ප්‍රතිචාරය ද බලන්න.

2003 ජුනි මාසයේම, මුරලි නැවත අත්අඩංගුවට ගැනීම සඳහා වරෙන්තුවක් නිකුත් කරන ලද අතර, වෛද්‍ය සහතිකයක් ලැබීමෙන් පසු එය එකවරම මෙන් නතර කරන ලදී.[120] මේ අවස්ථාවේ දීම, සැකකරුවෙකු වසරකට වැඩි කාලයක් රක්ෂිත බන්ධනාගාරගත කර තැබීම, 1997 ඇප පනතේ කොන්දේසි උල්ලංඝනය කිරීමක් බව පවසමින් ජෙගන් සහ බච්චා වෙනුවෙන් ඇප ඉල්ලා විත්තියේ නීතිඥයින් මහාධිකරණයට ගියහ. ජුනි 30 වන දින ඇප නියෝගයක් නිකුත් කෙරුණු අතර ජූලි මාසයේදී ඔවුන් දෙදෙනාම නිදහස් කිරීම සිදු විය. [121]ඇප ලබා දීමේ කාරණය සම්බන්ධයෙන් අධිකරණ බලය ඇත්තේ කුමන අධිකරණයටද යන්න පිළිබඳ නීතිමය ආරවුලකින් අනතුරුව, මහාධිකරණය විසින් මහේස්ත්‍රාත්වරයාගේ ඇප කොන්දේසි අඩු කිරීම සිදු කළේය. නැවතත්, සැකකරුවන් මසකට වරක් පමණක් පොලිසියට වාර්තා කළ යුතු විය.[122] ද සිල්වා මහතා විසින් වසරකට පෙර අධිකරණයට ලබා දී තිබූ ඊපීඩීපී සාමාජිකයින් 19 දෙනෙකුගේ ලැයිස්තුවේ පළමු නම වූ ඊපීඩීපී සාමාජික 'මිල්ටන්' සම්බන්ධයෙන් කරුණු මතු කළේය. ඊපීඩීපී පක්ෂයේ යාපනය දිස්ත්‍රික් ලේකම්වරයා විසින් ද සිල්වාට වාර්තා කර තිබුණේ මිල්ටන් 'මෙම විමර්ශනය ආරම්භ කළ දින සිට ඊපීඩීපී පක්ෂය අතහැර දමා ගොස් ඇති බවයි. එබැවින්, ඔහු පිළිබඳව විමර්ශනය කිරීමට නොහැකි වූ බව දැක් වූ ද සිල්වා'. මේ සඳහා තවදුරටත් කාලය ඉල්ලා සිටියේ. 'නැවත විමර්ශනය කිරීමට අවශ්‍ය' බව දක්වමිනි.[123]

2003 සැප්තැම්බර් මාසයේදී නව නමක් වාර්තාවලට ඇතුළත් විය: එනම් බාලචන්ද්‍රන් උදයභවන් නොහොත් අත්පුතන්. ඔහු 23 වැනි දින, නිමලරාජන්ගේ ඝාතනයේ අවසාන නම් කරන ලද සැකකරු බවට පත් වූ, නමුත් ඒ මන්දැයි පැහැදිලි කිරීමක් ලබා දී නොමැත. සැප්තැම්බර් 5 වන දින මුලින්ම ත්‍රිකුණාමලයේදී ඔහු රඳවා ගනු ලැබූ අතර, පසුව ඔහුගේ නීතිඥවරයා මාර්ගයෙන් ඔහු කියා සිටියේ ඔහු අත්අඩංගුවට ගත් 'රහස් පොලිසියේ' සාමාජිකයින් විසින් ඔහුගේ ලිංගික අවයව පුළුස්සා දැමීම ඇතුළුව වධහිංසා පමුණුවා ඇති බවයි.[124] ත්‍රිකුණාමලයේ සිටි ඔහුව පසුව කොළඹ මැගසින් බන්ධනාගාරයේ රක්ෂිත බන්ධනාගාරගත කරන ලදී. 'ප්‍රවාහන නියාමන ගැටලු' මත පදනම්ව, ඔහුට ඇති වී යැයි කියනු ලබන තුවාල සුව වීමට යම් කාලයක් ලබා දීම හේතුවෙන්, යාපනයට මාරු කිරීම ප්‍රමාද වීම නිසා, යාපනය මහේස්ත්‍රාත්වරයා කොළඹ දී වෛද්‍ය-නීති පරීක්ෂණයක් ඉල්ලා සිටියේය.[125] ඔක්තෝබර් 3 වැනි දින කොළඹ බලධාරීන් විසින් සාක්ෂි ලෙස මොට ආයුධ නිසා බලහත්කාරයෙන් සිදු කරන ලද තුවාල පමණක් සොයා ගත් අතර ඒවා 'බරපතල නොවන' ලෙස නම් කළහ.[126] විත්තියේ එක් නීතිඥයෙක් නඩුව විසඳීමට ගතවන අසීමිත කාලයට එරෙහිව අදහස් පළ කළ අතර, උදයන් පුවත්පත කළ අනතුරු ඇඟවීමක් ගැන සඳහන් කරමින් පැවසුවේ 'ජනතාව සිය අප්‍රසාදය පළ කර යමක් කිරීමට සූදානම් වන බවයි'. ප්‍රමාදයන් සම්බන්ධයෙන් සැකකරුවන්ට නොසතුටක් ඇත්නම් 'නීතිපතිවරයා ඇමතීමට' මහේස්ත්‍රාත්වරයා යෝජනා කළේය.[127]

ඔක්තෝබර් 17 වැනි දින, යාපනය මාධ්‍යවේදීන්ගේ සංගමයේ සභාපති විරෝධතාවක් අමතමින්, "අද අපට නිමලරාජන් ඝාතනය කළ අය නිදහසේ ඇවිදිනවා දැකිය හැකියි. ඔහුගේ අමානුෂික ඝාතනය පිළිබඳ පරීක්ෂණ දිගු කලක් තිස්සේ කිසිදු ප්‍රගතියක් නොමැතිව සිදුවෙමින් පවතී." යැයි සඳහන් කළේය.[128] එදිනම, අත්පුතන් යාපනය බන්ධනාගාරයට පැමිණියේය.[129] මාසය අවසානයේ උසාවියේදී, ඔහු වෙනුවෙන් කතා කළ නීතිඥවරයා ඝාතනය සිදු වූ අවස්ථාවේ ඔහු ඊපීඩීපී සාමාජිකයෙකු බව සිටි බව

නිමලරාජන්ගේ ඝාතනයට පෙත්සම්කරු සම්බන්ධ කර ගැනීම සඳහා 'මෙතෙක් කිසිදු සාක්ෂියක් අනාවරණය වී නොමැති' බව CID ඔහුට උපදෙස් දුන් බව නීතිඥවරයා උපුටා දක්වයි. ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව යාපනය මහේස්ත්‍රාත් අධිකරණයට යොමු කරන ලදී 2003 ජුනි 16: MCJ2023 පිටු 329-332.

120 අධිකරණ සටහන්, 2003 ජුනි 27: MCJ2023 පිටු 30.

121 2003 ජුනි 25 වන දින වවුනියාව මහාධිකරණ විනිසුරු විශ්වනාන්ත්ගේ නියෝගය: MCJ2023 පිටු 342; අධිකරණ සටහන්, 2003 ජුනි 27: MCJ2023 පිටුව 30.

122 2003 ජූලි 23 දින වවුනියාව මහාධිකරණ විනිසුරු විශ්වනාන්ත්ගේ නියෝගය: MCJ2023 පිටු 358.

123 පරීක්ෂක ද සිල්වා, 2003 ජූලි 25 දින අධිකරණයට ඉදිරිපත් කිරීම: MCJ2023 පිටු 202.

124 විත්තියේ නීතිඥ ලින්ගා තුරෙයිරාජා මහත්මිය, 2003 සැප්තැම්බර් 23 දින අධිකරණයට ඉදිරිපත් කිරීම: MCJ2023 පිටු 206-207. 'රහස් පොලිසිය' යන යෙදුම එකල දෙමළ කතා කරන්නන් විසින් බහුලව භාවිතා කරන ලද නමුත් එය නිල පොලිස් තනතුරක් නොවීය.

125 විනිසුරු විග්නරාජා විසින් 2003 සැප්තැම්බර් 23 වන දින නිකුත් කරන ලද නියෝගය: MCJ2023 පිටු 209.

126 2003 නොවැම්බර් 25 වන දින යාපනයේදී ලැබුණු කොළඹ අධිකරණ වෛද්‍ය කාර්යාලයේ බාලචන්ද්‍රන් උදයපවන්ගේ වාර්තාව: MCJ2023 පිටු 410-411.

127 2003 සැප්තැම්බර් 23 වන දින, විත්තියේ නීතිඥ වෙට්‍රිවේල්, අධිකරණයට සිදු කළ ඉදිරිපත් කිරීම සහ විනිසුරු විග්නරාජාගේ ප්‍රතිචාරය: MCJ2023 පිටු 208, 211.

128 TamilNet: 17 ඔක්තෝබර් 2003: https://www.tamilnet.com/art.html?catid=13&artid=10152

129 අධිකරණ සටහන්: MCJ2023 පිටු 35.

පිළිගත් නමුත්, ඔහු 'එම සිද්ධියට කිසිදු සම්බන්ධයක් නැති' බව පැවසීය. අත්පුතන් ත්‍රිකුණාමලයේදී අත්අඩංගුවට ගෙන තිබූ අතර, එහිදී පොලිස් නිලධාරීන් සිව්දෙනෙකු, 'දැනට අධිකරණයේ පෙනී සිටින පුද්ගලයෙකු' ඇතුළු පිරිසක්, ඔහුට නොවැටහෙන සිංහලෙන් කතා කර, පහර දී ඔහුට නොතේරෙන ලියවිල්ලකට අත්සන් කිරීමට බල කර ඇත. ද සිල්වා වෙනුවෙන් පෙනී සිටි නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු අධිකරණයට දැනුම් දුන්නේ ඊපීඩීපී සාමාජිකයින් වන මිල්ටන් සහ සලීම් මේ වන විට ප්‍රශ්න කිරීම්වලට භාජනය වෙමින් පවතින බවත්, තවත් සැකකරුවන් දෙදෙනෙකු තවමත් සොයමින් සිටින බවත්ය.[130]

## 3.7 2004: විමර්ශනය නැවතෙයි

2004 වන විට, පොලිස් පරීක්ෂක ද සිල්වා අධිකරණයට සූත්‍රගත ලිඛිත යාවත්කාලීන කිරීම් ඉදිරිපත් කරමින්, ඔහු තවමත් අතුරුදහන් වූ සැකකරුවන් සොයමින් සිටින බවත්, නීතිපතිවරයාගෙන් උපදෙස් බලාපොරොත්තුවෙන් සිටින බවත් නැවත නැවතත් ප්‍රකාශ කළේය: 'මෙම නඩුවේ ප්‍රගතිය වාර්තා කිරීමට කරුණාකර දිගු කාලයක් ලබා දෙන්න,'[131] මාර්තු මාසයේදී සිය ඇප කොන්දේසි සපුරාලීමට අපොහොසත් වූ ජෙගන්ට මහේස්ත්‍රාත්වරයා විසින් නව අත්අඩංගුවට ගැනීමේ වරෙන්තුවක් නිකුත් කෙරුණි. පසුව පොලිසියෙන් ජෙගන් අත්අඩංගුවට ගනු ලැබූ අතර, 'කිරුබා' යන අන්වර්ථ නාමයෙන් ඔහු තවත් චෝදනාවක් මත අවශ්‍ය කර ඇති බව එහි දී හඳුනාගන්නා ලදී. *ටැමිල්නෙට්* වාර්තා කළ පරිදි: 'මිනීමැරුම් සැකකරු කයිට්ස් ප්‍රදේශයේ සැඟවී සිටිය දී, කරම්පොන් කුඩා කුසුම බාලිකා පාසලේ සිට නිවසට යමින් සිටි ශිෂ්‍යාවකට ලිංගික අතවර කළ බවට චෝදනා එල්ල වී තිබුණි.'[132]

පෙනී යන පරිදි අප්‍රේල් මාසයෙන් පසු, ද සිල්වාගේ සූත්‍ර අධිකරණ යාවත්කාලීන කිරීම් පවා අවසන් වූ අතර, 2004 මැයි 17 වැනි දින, 5 වන සැකකරු වන අත්පුතන් ඇප මත නිදහස් කරන කිරීම සිදු විය.[133] සැකකරුවන්ට එරෙහිව ගොනු කළ හැකි ඕනෑම චෝදනාවක් සම්බන්ධයෙන් නීතිපතිවරයාගේ උපදෙස් බලාපොරොත්තුවෙන් සිටින බව 2004 අගෝස්තු 19 වැනි දින පැවති නඩු විභාගයක දී, ද සිල්වා වාර්තා කළේය. යාපනය මහේස්ත්‍රාත් විනිසුරු විග්නරාජා පළමු වරට වැඩිදුර නඩු විභාගයක් සඳහා දිනයක් නියම කිරීමට අපොහොසත් වූ අතර, ඔහු නිමලරාජන් නඩුව ඔහුගේ අධිකරණයේ ඇමතුම් පත්‍රයෙන් ඉවත් කළ බව *ටැමිල්නෙට්* වාර්තා කළේය.[134]

## 3.8 2020 ගණන්

කොළඹ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විශේෂ ඒකකයේ ප්‍රධාන පොලිස් පරීක්ෂක ලලිත දිසානායක විසින් යාපනය මහේස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත යවන ලද ලිපියකට අනුව, නිමලරාජන්ගේ නඩුව නීතිපතිවරයාගේ උපදෙස් මත 2020 ජූලි 5 වැනි දින 'පැවරීම' හෝ නිල වශයෙන් අත්හිටුවීම සිදු කර ඇත. රහස් පොලිසිය විසින් වසර දහයකට පෙර එවකට නීතිපතිවරයා වෙත 'වැඩිදුර උපදෙස් සහ ඉදිරි උපදෙස්' ඉල්ලා ඉදිරිපත් කරන ලද විධිමත් අභියාචනයකට ලැබුණු පළමු නිල ප්‍රතිචාරය මෙය බව පෙනේ. 2021 අප්‍රේල් 27 වැනි දින නීතිපතිවරයා විසින් ඇප මත මුදා හරින ලද සැකකරුවන් පස් දෙනාට එරෙහිව 'තව දුරටත් නීතිමය පියවර ගැනීමට අපේක්ෂා නොකරන' බව තීන්දු කළේය. 2021 නොවැම්බර් 16 වැනි දින, ශ්‍රී ලංකා පොලිසිය 'යාපනයේ ප්‍රසිද්ධ මාධ්‍යවේදී මයිල්වාගනම් නිමලරාජන් වෙඩි තබා ඝාතනය කිරීම' ලෙස සාරාංශ කළ කාරණය සම්බන්ධයෙන් 'මෙම නඩුවට අදාළ සැකකරුවන්ට නඩුවෙන් නිදහස් කිරීම සම්බන්ධයෙන් දැනුම් දෙන ලෙස නොතීසි නිකුත් කරන ලෙස' යාපනය මහේස්ත්‍රාත් අධිකරණයට උපදෙස් ලැබුණි.[135]

[130] අධිකරණය ඉදිරියේ විත්තියේ නීතිඥ මහත්මිය ලින්ගා තුරෙයිරාජා සහ පරීක්ෂක ද සිල්වා, අධිකරණයට සිදු කළ ඉදිරිපත් කිරීම, 2003 ඔක්තෝබර් 30: MCJ2023 පිටු 223-224 සහ 215.

[131] උදා: 2004 අප්‍රේල්: MCJ2023 පිටු 424.

[132] TamilNet: 31 මාර්තු 2004: https://www.tamilnet.com/art.html?catid=13&artid=11629. 2012 මාර්තු 5 වන දින 13 හැවිරිදි පාසල් සිසුවියක් දූෂණය කර ඝාතනය කිරීම සම්බන්ධයෙන් එහි වාර්තාකරණය ද බලන්න, ජෙගන් පසුව වරදකරු බවට පත් විය.

[133] අධිකරණ සටහන්: MCJ2023 පිටු 43.

[134] *TamilNe*t: 20 අගෝස්තු 2004: https://www.tamilnet.com/art.html?catid=13&artid=12703

[135] යෝජනා පත්‍රිකාව, 2021 නොවැම්බර් 16: MCJ2023 p425; 'වැඩිදුර වාර්තාව', ශ්‍රී ලංකා පොලිසිය, 2016 නොවැම්බර් 21: MCJ2023 පිටු 430.

# 4. පොලිස් විමර්ශනය පිළිබඳ විශ්ලේෂණයක්

## 4.1 ජාත්‍යන්තර නීතිය යටතේ විමර්ශනය කිරීම, නඩු පැවරීම සහ දඬුවම් කිරීම සඳහා වගකීම

ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය යටතේ, ජීවත්වීමේ අයිතිය, 'සන්නද්ධ ගැටුම් ජාතියට සහ ජීවිතයට තර්ජනයක් වන අනෙකුත් පොදු හදිසි අවස්ථාවලදී පවා කිසිදු අවමානයකට ඉඩ නොදෙන උත්තරීතර අයිතියක්' ලෙස සැලකේ.[136] නිදසුනක් වශයෙන්, මූලික ජාත්‍යන්තර මානව හිමිකම් ගිවිසුම්වලින් එකක් වන 1966 සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICCPR) 6.1 වගන්තියේ මෙසේ දක්වයි:

සෑම මනුෂ්‍යයකුට ම ජීවත්වීමට ආවේණික අයිතියක් පවතියි. මෙම අයිතිය නීතියෙන් ආරක්ෂා කළ යුතුය. අත්තනෝමතික ලෙස කිසිවෙකුගේ ජීවිතය අහිමි නොකළ යුතුය.

ශ්‍රී ලංකාව 1980 සිට ICCPR හි පාර්ශවකරුවෙකු ව සිට තිබේ.

ජීවත්වීමේ අයිතිය උල්ලංඝනය කිරීම් විමර්ශනය කිරීම, නඩු පැවරීම සහ දඬුවම් කිරීම රාජ්‍යයන් මත පැවරෙන යුතුකමක් බව ජාත්‍යන්තර මානව හිමිකම් සංවිධාන දිගින් දිගට ම පවසා සිටියි. ජීවිත ආරක්ෂා කිරීමට බැඳී සිටීම පිළිබඳ මෙම වැදගත් අංගය, සම්මුතියේ (2.1 වගන්තිය) පිළිගත් සියලුම අයිතිවාසිකම්වලට 'ගරු කිරීම සහ සහතික කිරීම' සහ වින්දිතයින්ට ඵලදායී පිළියමක් ලබා දීමේ යුතුකම (2.3 වගන්තිය) තුළ ගම්‍ය වේ.[137]

ශ්‍රී ලංකා රජය සහ එල්ටීටීඊය අතර එදිරිවාදිකම් අභ්‍යන්තර ('ජාත්‍යන්තර නොවන') සන්නද්ධ ගැටුමක් ලෙස සලකනු ලබන අතර, ශ්‍රී ලංකාව 1949 ජිනීවා සම්මුතීන් හතරට පාර්ශවකරුවෙකු වන බැවින් ජාත්‍යන්තර මානුෂීය නීතිය ද මෙහි දී අදාළ වේ.[138] එදිරිවාදිකම්වලට ක්‍රියාකාරීව සහභාගී නොවන පුද්ගලයින් ඝාතනය කිරීම තහනම් කර ඇති අතර,[139] ICRC ට අනුව: 'රාජ්‍යයන් තම ජාතිකයන් හෝ සන්නද්ධ හමුදා විසින් ඔවුන්ගේ භූමිය තුළ සිදු කරන ලදැයි කියන යුද අපරාධ විමර්ශනය කළ යුතු අතර, සුදුසු නම්, සැකකරුවන්ට නඩු පැවරිය යුතුය.'[140]

[136] එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුවේ අංක 36, CCPR/C/GC/36, 3 සැප්තැම්බර් 2019, 2 වන ඡේදයේ සාමාන්‍ය අදහස: https://documents.un.org/doc/undoc/gen/g19/261/15/pdf/g1926115.pdf

[137] එහිම, 27 ඡේදය.

[138] උදාහරණයක් ලෙස එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ, ශ්‍රී ලංකාව පිළිබඳ මානව හිමිකම් විමර්ශන මහ කොමසාරිස් කාර්යාලය සඳහා 2014 නිර්දේශ කොන්දේසි බලන්න, ලබා ගත හැක්කේ: https://www.ohchr.org/en/hr-bodies/hrc/oisl

[139] යුධ සමයේදී සිවිල් පුද්ගලයින් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් IV ජිනීවා සම්මුතිය, 1949, 3 වන වගන්තිය

[140] ජාත්‍යන්තර රතු කුරුස කමිටුව, ICRC හි චාරිත්‍රානුකූල ජාත්‍යන්තර මානුෂීය නීතිය පිළිබඳ අධ්‍යයනයේ I වෙළුමේ 158 වන රීතියේ, යුද අපරාධ නඩු පැවරීමේ දී හඳුනාගෙන ඇති චාරිත්‍රානුකූල ජාත්‍යන්තර මානුෂීය නීතියේ (IHL) නීති 161 ක දත්ත සමුදාය, ලබා ගත හැක්කේ: https://ihl-databases.icrc.org/en/customary-ihl/v1/rule158

නීති විරෝධී, හෝ අත්තනෝමතික ඝාතන ජීවත්වීමේ අයිතිය උල්ලංඝනය කරන බරපතලම අවස්ථාවන් අතර වේ. මාධ්‍යවේදීන් මෙන් ම මානව හිමිකම් ආරක්ෂකයින් සහ විපක්ෂ මතධාරීන් නීති විරෝධී ලෙස ඝාතනය කිරීම, විශේෂයෙන් සැලකිලිමත් විය යුතු කරුණක් ලෙස එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් සංවිධාන විසින් හඳුනාගෙන ඇත.[141] මෙම අපරාධ සම්බන්ධයෙන් දඬුවම් නොලැබීමේ ඉතා ඉහළ අනුපාතයක් පවතින බව මෙම සංවිධාන විසින් ඉස්මතු කර ඇති අතර, මාධ්‍යවේදීන්ට එරෙහි බරපතල අපරාධ සම්බන්ධයෙන් නඩු පවරා දඬුවම් කිරීමට රාජ්‍යයන් අපොහොසත් වීම මගින් අපරාධකරුවන්ට ධෛර්යයක් ලබා දෙන බවත්, වින්දිතයින්ගේ පවුල්වලට යුක්තිය ලබා දීම ප්‍රතික්ෂේප වන බවත්, අධි අවදානම් සහිත කතා වාර්තා කිරීමෙන් අනෙකුත් මාධ්‍යවේදීන් වළක්වන බවත් ඔවුන් විසින් පෙන්වා දී ඇත.[142] එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරුවෙකු පවසන පරිදි: ‘මාධ්‍යවේදීන් ඝාතනය කර ඔවුන් නිහඬ කිරීම වාරණයේ වඩාත්ම දරුණුතම අවස්ථාවයි.’[143]

2005 එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල යෝජනාව විසින් අනුමත කරන ලද පිළියම් සහ වන්දි ලබා ගැනීමේ අයිතිය පිළිබඳ මූලික මූලධර්ම[144] මගින්, ආසන්නතම පවුලේ සාමාජිකයන් ඇතුළුව[145] **දැඩි මානව හිමිකම් උල්ලංඝනයන්ට** ගොදුරු වූවන්ට ඔවුන්ගේ හිමිකම් පෑමට ඇති අයිතිය කුමක්ද යන්න මෙසේ දක්වා ඇත:

අදාළ නීති ආයතන යටතේ සපයා ඇති පරිදි ජාත්‍යන්තර මානව හිමිකම් නීතියට සහ ජාත්‍යන්තර මානුෂීය නීතියට ගරු කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහතික කිරීමට වන බැඳීම, ඊට අමතරව...

අ) උල්ලංඝනයන් වැළැක්වීම සඳහා සුදුසු ව්‍යවස්ථාදායක සහ පරිපාලනමය සහ අනෙකුත් සුදුසු පියවර ගැනීම;

ආ) උල්ලංඝනයන් ඵලදායී ලෙස, කඩිනමින්, සම්පූර්ණයෙන් සහ අපක්ෂපාතීව විමර්ශනය කිරීම සහ සුදුසු අවස්ථාවලදී, දේශීය හා ජාත්‍යන්තර නීතියට අනුකූලව වගකිව යුතු යැයි කියනු ලබන අයට එරෙහිව පියවර ගැනීම...

ඇ) වින්දිතයින් යැයි කියා ගන්නා අයට... යුක්තිය සඳහා සමාන හා ඵලදායී ප්‍රවේශයක් ලබා දීම...

ඈ) වින්දිතයින්ට වන්දි ඇතුළුව ඵලදායී සහන ලබා දීම...

විමර්ශනය කිරීමේ සහ නඩු පැවරීමේ යුතුකම විවිධ නඩු නීති සහ ගිවිසුම් ආයතනවල තීරණවල විස්තරාත්මකව දක්වා ඇත: සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු වන එක්සත් ජාතීන්ගේ මානව කමිටුව, රාජ්‍යයන්ගේ යුතුකම් පහත පරිදි සාරාංශ කරයි: ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුකූල වීම සඳහා, පරීක්ෂණයක් සැමවිටම **ස්වාධීන, අපක්ෂපාතී, කඩිනම්, පරිපූර්ණ, ඵලදායී, විශ්වසනීය සහ විනිවිදභාවය සහිත**[146] විය යුතුය. ඊට අමතරව, විමර්ශනයක් අණදීමේ දාමය දක්වා ඉහළට ගෙන ගොස් සිය යටත් නිලධාරීන් විසින් සිදු කරන ලද ජීවත්වීමේ අයිතිය උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් උසස් නිලධාරීන් සතුව ඇති නීතිමය වගකීම ගවේෂණය කළ යුතු වේ.[147]

නීති විරෝධී මරණයක් විමර්ශනය කිරීම සඳහා වන මිනසෝටා ප්‍රොටෝකෝලය ජාත්‍යන්තර සහ ජාතික අධිකරණ සහ මානව හිමිකම් ආයතන විසින් නීතිමය ප්‍රමිතියක් ලෙස බහුලව භාවිතා කරනු ලබන අතර, එමගින් නීති විරෝධී මරණයක් විමර්ශනය කිරීමේදී අනුගමනය කළ යුතු සවිස්තරාත්මක මූලධර්ම දක්වා ඇත.[148] මරණය

141 A/HRC/41/36 බලන්න: මානව හිමිකම් ආරක්ෂකයින්, මාධ්‍යවේදීන් සහ ප්‍රමුඛ විරුද්ධවාදීන් හිතාමතා රාජ්‍ය ඝාතන විමර්ශනය කිරීම, වගවීම සහ වැළැක්වීම - නීති විරෝධී, සාරාංශ හෝ අත්තනෝමතික මරණ දණ්ඩනය පිළිබඳ විශේෂ වාර්තාකරුගේ වාර්තාව, 2019 ඔක්තෝබර් 4.

142 අදහස් ප්‍රකාශ කිරීමේ සහ ප්‍රකාශනයේ නිදහස ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම පිළිබඳ විශේෂ වාර්තාකරුගේ වාර්තාව, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය, ලේඛනය A/HRC/50/29, 2022 අප්‍රේල් 20, 29 ඡේදය.

143 එය ම.

144 ජාත්‍යන්තර මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සහ මානුෂීය නීතියේ බරපතල උල්ලංඝනයන් සම්බන්ධයෙන් වින්දිතයින් සඳහා පිළියමක් සහ වන්දි ගෙවීමේ අයිතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ මූලික මූලධර්ම සහ මාර්ගෝපදේශ (මින් ඉදිරියට, වන්දි ගෙවීමේ එක්සත් ජාතීන්ගේ මූලධර්ම), 2005 දෙසැම්බර් 16 දිනැති 60/147 එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල යෝජනාව, 3 වන වගන්තිය.

145 8 වන වගන්තිය, වන්දි ගෙවීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ මූලධර්ම.

146 සාමාන්‍ය විවරණ අංක 36, ඉහළ, 28 ඡේදය.

147 එහි, 27 වන ඡේදය; එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය, නීති විරෝධී, සාරාංශ හෝ අත්තනෝමතික මරණ දණ්ඩනය පිළිබඳ විශේෂ වාර්තාකරුගේ වාර්තාව, 2014 අප්‍රේල් 1, A/HRC/26/36, 81 ඡේදය.

148 නීති විරෝධී, අත්තනෝමතික සහ සාරාංශගත මරණ දණ්ඩන ඵලදායී ලෙස වැළැක්වීම සහ විමර්ශනය කිරීම පිළිබඳ සංශෝධිත එක්සත් ජාතීන්ගේ අත්පොත,

'රාජ්‍යයේ, එහි ආයතනවල හෝ නියෝජිතයින්ගේ ක්‍රියාවන් හෝ අතපසුවීම් නිසා සිදුවී ඇති විට හෝ ජීවත්වීමේ අයිතියට ගරු කිරීමේ යුතුකම උල්ලංඝනය කරමින් රාජ්‍යයට ආරෝපණය කළ හැකි' විට, රාජ්‍ය නියෝජිතයන් හෝ පැරාමිලිටරි කණ්ඩායම් හෝ හමුදා කණ්ඩායම් විසින් සිදු විය හැකි මරණ ඇතුළුව, රාජ්‍යයේ මග පෙන්වීම යටතේ හෝ රාජ්‍යයේ අනුග්‍රහය ඇතිව ක්‍රියා කරන බවට සැක කරන මරණ එයට මූලික වශයෙන් අදාළ වේ. මේවාට සම්බන්ධ වන සියලු දෙනා විසින් අනුගමනය කළ යුතු වෘත්තීය සහ සදාචාරාත්මක ප්‍රමිතීන් මෙන් ම ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන අපරාධ ස්ථාන සාක්ෂි, සාක්ෂිකරුවන්ගේ කරුණු විමසීම් සහ වෙනත් ආකාරයේ සාක්ෂි එකතු කිරීම, විශ්ලේෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සම්බන්ධ ප්‍රායෝගික පියවර පිළිබඳ සවිස්තරාත්මක මග පෙන්වීමක් මෙම මූලධර්ම මගින් සපයා දෙයි.[149]

එවැනි උල්ලංඝනයන් වැළැක්වීමට සහ දඬුවම් කිරීමට රාජ්‍යයේ සතු වගකීම එහි නිලධාරීන් සතු වගකීමට වඩා පුළුල් වේ. රාජ්‍ය නොවන කණ්ඩායම් විසින් සිදු කරන ලද උල්ලංඝනවලට රාජ්‍යය විවිධ ආකාරවලින් හවුල් වී සිටිය හැකිය. රාජ්‍ය නොවන ක්‍රියාකාරීන්ගේ හැසිරීම් සම්බන්ධයෙන් නිසි කඩිසරකමකින් යුතුව විමර්ශනය කිරීමට සහ ප්‍රතිචාර දැක්වීමට ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වීම නිසා රාජ්‍යයක් වගකිව යුතු වීම සිදු විය හැකිය.[150]

සෘජු වින්දිතයෙකුගේ පවුලේ සාමාජිකයින් ද අපරාධ යුක්ති විනිශ්චය ක්‍රියා සන්දර්භයක් තුළ, වින්දිතයින් ලෙස සලකනු ලබන අතර ඔවුන්ට ද අයිතිවාසිකම් පවතියි. පරීක්ෂණයක් සිදු වන අතරතුර, රාජ්‍යයන් වින්දිතයාගේ ළඟම ඥාතීන්ට තොරතුරු හෙළි කළ යුතු අතර, විමර්ශනයේ ඉදිරි ගමන පිළිබඳ ඔවුන් දැනුවත් කරමින්, විමර්ශන පියවර සම්බන්ධයෙන් යෝජනා ඉදිරිපත් කිරීමට, සාක්ෂි සැපයීමට මෙන් ම ක්‍රියාවලිය පුරාවට ඔවුන්ගේ අවශ්‍යතා සහ අයිතිවාසිකම් තහවුරු කිරීමට හැකියාව ඇතුළුව ඔවුන්ගේ ඵලදායී සහභාගීත්වය සක්‍රිය කළ යුතුය.[151]

අවසාන වශයෙන්, ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය යටතේ, වින්දිතයින්ට වන්දි ලබා දීමට කටයුතු කිරීමට ද රාජ්‍යයන් බැඳී සිටී. ඉහත සඳහන් කළ පිළියම් සහ වන්දි ලබා ගැනීමේ අයිතිය සම්බන්ධයෙන්, ජාත්‍යන්තර මානව හිමිකම් සහ මානුෂීය නීති සම්මතයන් උල්ලංඝනය කරන ක්‍රියාවන් හෝ අතපසුවීම් සඳහා වන වන්දි ප්‍රමාණවත්, ඵලදායී සහ කඩිනම් විය යුතු බවත්, ප්‍රතිස්ථාපනය, වන්දි, පුනරුත්ථාපනය, තෘප්තිය සහ නැවත සිදු නොවීම සහතික කිරීම එයට ඇතුළත් විය යුතු බවත් එක්සත් ජාතීන්ගේ මූලික මූලධර්මවල සඳහන් වේ.[152] මහජන සමාව අයැදීම, අනුස්මරණ සහ වින්දිතයින්ට උපහාර දැක්වීම සහ සත්‍යය සම්පූර්ණයෙන් හෙළිදරව් කිරීම වැනි පියවර මෙයට ඇතුළත් විය හැකිය. එයට, නැවත සිදු නොවන බවට සහතික කිරීම් යන මාතෘකාව යටතේ, සියලුම සිවිල් සහ හමුදා ක්‍රියාමාර්ග නිසි ක්‍රියාවලිය, සාධාරණත්වය සහ අපක්ෂපාතීත්වය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන බව සහතික කිරීම වැනි, යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම සඳහා නිර්මාණය කර ඇති පියවරයන් ද ඇතුළත් විය හැකිය.[153]

## 4.2. ජාත්‍යන්තර නීති ප්‍රමිතීන්ට සාපේක්ෂව නිමලරාජන් විමර්ශනය

2015 දී ප්‍රකාශයට පත් කරන ලද එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලය (OHCHR) විසින් පවත්වන ලද ශ්‍රී ලංකාව පිළිබඳ විමර්ශනය (OISL) වාර්තාවේ, 'අද දක්වා ම ශ්‍රී ලංකාව තුළ ගැඹුරින් මුල් බැස ඇති දණ්ඩ මුක්තිය' ගැන සඳහන් කර ඇත.[154] 2002 පෙබරවාරි සිට ඉදිරියට ආවරණය වන, වාර්තාවේ

2017:https://www.ohchr.org/sites/default/files/Documents/Publications/MinnesotaProtocol.pdf

149 මිනසෝටා ප්‍රොටෝකෝලය, පිටුව 1.

150 සන්නද්ධ රාජ්‍ය නොවන ක්‍රියාකාරීන්ට නීති විරෝධී, සාරාංශ හෝ අත්තනෝමතික මරණ දණ්ඩනය පිළිබඳ විශේෂ වාර්තාකරුගේ වාර්තාව: ජීවත්වීමේ අයිතිය ආරක්ෂා කිරීම, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය, ලේඛනය A/HRC/38/44, 2020 දෙසැම්බර් 7, 22 ඡේදය.

151 මිනසෝටා ප්‍රොටෝකෝලය, 35 ඡේදය. අපරාධ සහ බලය අනිසි ලෙස භාවිතා කිරීමේ වින්දිතයින් සඳහා යුක්තිය පිළිබඳ මූලික මූලධර්ම පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රකාශනය, 1985 නොවැම්බර් 29 වන දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල යෝජනාව 40/34, විශේෂයෙන් 6 ඡේදය ද බලන්න.

152 වන්දි ගෙවීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ මූලධර්ම, වගන්ති 15-23.

153 වන්දි ගෙවීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ මූලධර්ම, වගන්ති 22-23.

154 ශ්‍රී ලංකාව පිළිබඳ OHCHR විමර්ශන වාර්තාව, A/HRC/30/CRP.2, 2015 සැප්තැම්බර් 16, 7 ඡේදය.

නිමලරාජන් නඩුව විශේෂයෙන් සඳහන් කර නැති නමුත් එහි කාල රාමුව නිමලරාජන් ඝාතනය පිළිබඳ ක්‍රියාකාරී විමර්ශනයේ කොටසක් සමග සමපාත වූ අතර, අපරාධකරුවන් වගවීමට ලක් කිරීමට අපොහොසත් වීම එහි බලතල කාලයට බොහෝ කලකට පෙර සිටම පැවත එන බව වාර්තාවේ විශේෂයෙන් සඳහන් වී තිබුණි.[155]

ඉහත ලැයිස්තුගත කර ඇති සහ ශ්‍රී ලංකාව විසින් පිළිගෙන ඇති ජාත්‍යන්තර නීති ප්‍රමිතීන්ට අනුකූල වීම සඳහා, නිමලරාජන්ගේ ඝාතනය පිළිබඳ විමර්ශනය ස්වාධීන, අපක්ෂපාතී, කඩිනම් සහ පරිපූර්ණ ආකාරයෙන් යුතුව, ඵලදායී, විශ්වසනීය සහ විනිවිදභාවය සහිත විය යුතු මෙන් ම, ඉහළ විධාන දාමය දක්වා වගකීම ගවේෂණය කළ යුතුව තිබුණි. 2000 ඔක්තෝබර් මාසයේ ඝාතනයට පසු දින විමර්ශනය ආරම්භ කළ මොහොතේ සිට අවසන් සැකකරුවන් ඇප මත නිදහස් කරන ලද 2021 නොවැම්බර් දක්වා වන සමස්ත විමර්ශනයේ අධිකරණ වාර්තාව පරීක්ෂා කරන විට, බොහෝ අසාර්ථකත්වයන් හෙළිදරව් වන අතර, එවැනි නඩුවලදී යුක්තිය පසිඳලීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියට ඇති හැකියාව සහ සියල්ලටත් වඩා කැමැත්ත පිළිබඳ බරපතල ගැටලු මතු වේ. අවසානයේ, නිමලරාජන්ගේ ඝාතකයින් නීතිය හමුවට පමුණුවා ගැනීමේ විමර්ශනය අසාර්ථක විය.

## 'ස්වාධීන, අපක්ෂපාතී සහ විනිවිදභාවය සහිත'

2001 අප්‍රේල් 23 වන දින, ඝාතනයෙන් මාස හයකට පසු, විමර්ශනය අධීක්ෂණය කළ මහේස්ත්‍රාත් විනිසුරු විග්නරාජා, ප්‍රගතියක් නොමැතිකම ගැන කෝපයට පත්ව, පොලිස් නියෝජිතයාගෙන් මෙසේ අසා තිබුණි: ‘පොලිසියට, සෙබළුන්ට සහ උසාවිවලට විමර්ශනය කර සම්බන්ධ පුද්ගලයින් අත්අඩංගුවට ගැනීමට නොහැකි නම්, නීතිය හා සාමය පවත්වාගෙන යාම පිළිබඳ මහජනතාවගේ විශ්වාසය විනාශ නොවන්නේද?’ [156]

නඩුවට සම්බන්ධ නීතිඥයෙකු ඇතුළු බොහෝ නිරීක්ෂකයින්ට අනුව, ඊපීඩීපී සහ ආරක්ෂක හමුදා අතර ඇති කුමන්ත්‍රණය සහ රාජ්‍ය ආරක්ෂක හමුදා සහ ඔවුන්ගේ නියෝජිතයින් ආරක්ෂා කිරීමට රජයට ඇති කැමැත්ත සැලකිල්ලට ගත් විට නිමලරාජන්ගේ ඝාතනය සම්බන්ධයෙන් ස්වාධීන හා අපක්ෂපාතී පරීක්ෂණයක් කිසි විටෙකත් සිදු නොවූ බව පෙනී යයි. වින්දිතයින් වෙනුවෙන් පෙනී සිටි නීතිඥයෙකු විමර්ශනය අතරතුර පැවසූ පරිදි, “ඕනෑම පක්ෂයක සෑම රජයක්ම ආරක්ෂක හමුදා ආරක්ෂා කළ යුතු යැයි සිතන අතර ... ඊපීඩීපී යනු රාජ්‍ය හමුදා සමග වැඩ කරන පැරාමිලිටරි කණ්ඩායමකි.”[157]

ශ්‍රී ලංකාවේ සිදු කළ කරුණු සෙවීමේ සංචාරයකින් අනතුරුව, ‘2000 ඔක්තෝබර් සිට 2002 ජනවාරි දක්වා කාලය තුළ කොළඹ සහ යාපනයේ බලධාරීන් විසින් පොලිසියේ කටයුතු අවහිර කරන ලද’බව ජාත්‍යන්තර සංවිධානයක් වන දේශ සීමා රහිත වාර්තාකරුවෝ (RSF) නිගමනය කර ඇත. එම කාලය තුළ සැකකරුවන් කිහිප දෙනෙකු ම යාපනයේ නිදහසේ සැරිසරනු දක්නට ලැබුණු බව RSF වෙත දැනගැනීමට ලැබුණු අතර, නිමලරාජන් දෙමළ ජාතිකයෙකු වූ නිසා ඔහු එල්ටීටීඊයට සම්බන්ධ යැයි සැලකෙන බැවින්, පොලිසිය සහ හමුදාව ඔවුන්ගේ සතුරෙකු ඝාතනය කළේ කවුරුන්ද යන්න සොයා ගැනීමට කාලය ගත නොකරන බව ඔවුන්ට දැනගැනීමට ලැබී තිබුණි. [158] එම වාර්තාවේ ම නිගමනය වූයේ නිමලරාජන් විසින් යාපනය අර්ධද්වීපය පුරා සිදුවන සිදුවීම් ශ්‍රී ලංකා සහ ජාත්‍යන්තර මාධ්‍ය ආයතන කිහිපයකට ස්වාධීනව වාර්තා කිරීම මෙම ඝාතනයට හේතුව වූ බවයි. එමෙන්ම විමර්ශනයේ දී සටහන් වූ ඔහුට ලැබී තිබුණු මරණ තර්ජන ගැන ද මේ වාර්තාවේ දැක්වුණි. 2002 සටන් විරාමය පිළිබඳ පොලිස් පරීක්ෂණ සම්බන්ධයෙන් කරුණුසොයා බැලූ එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරුවෙකු මෙයට එකඟ වෙමින්, රජය බොහෝ දේශපාලන ඝාතන ඵලදායී ලෙස විමර්ශනය කිරීමට අපොහොසත් වී ඇති බවත්, ‘දේශපාලන ඝාතන පිළිබඳ බරපතල පරීක්ෂණ සඳහා පොලිසියට ඇති රුචිය

[155] එහිම, 1175 ඡේදය.

[156] 2001 අප්‍රේල් 23 වන දින යාපනය මහේස්ත්‍රාත් අධිකරණ නඩු විභාගය: MCJ2023 පිටු 88.

[157] 2025 පෙබරවාරි 14 වන දින නීතිඥ කේ.එල්. රත්නවේල් සමග සම්මුඛ සාකච්ඡාවක්.

[158] දේශසීමා නොමැති වාර්තාකරුවන්ගේ, ‘ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යවරයාට විවෘත ලිපිය’, 2022 ඔක්තෝබර් 19, මෙතැනින් ලබා ගත හැකිය: https://rsf.org/en/open-letter-sri-lankan-prime-minister

බොහෝ දුරට නැති වී ඇති බවත්... මෙම නඩු හැසිරවීමට ඉතා අපහසු බවත්' දැක්වූවේය.[159]

පවතින අධිකරණ වාර්තාවලට අනුව, රාජ්‍ය ආයතන සහ රජයට පක්ෂපාතී පැරාමිලිටරි බලකාය වන ඊපීඩීපී සංවිධානයේ සහයෝගය ලබා ගැනීමට අපොහොසත් වීම විමර්ශනයට බාධාවක් වූ සැලකිය යුතු සාධකයක් බව පැහැදිලිය. ඉහත විමර්ශන වාර්තාවේ විස්තර කර ඇති පරිදි, ඊපීඩීපී සංවිධානය පොලිස් ඉල්ලීම් සහ අධිකරණ නියෝගවලට අනුකූල වීම ප්‍රමාද කරමින් සහ දිගින් දිගටම මග හැරීම සිදු කළේය. ඝාතනයෙන් වසර එකහමාරකට වැඩි කාලයකට පසු, 2002 ජූනි මාසයේදී, ඊපීඩීපී සංවිධානයේ යාපනය කාර්යාලයට ඔවුන්ගේ සාමාජිකයින්ගේ ලේඛනයක්, ගිනි අවි ඇතුළු දැනට එහි තබා ඇති ආයුධ පිළිබඳ සම්පූර්ණ විස්තර ඉදිරිපත් කරන ලෙසත්, පොලිසිය කරුණු විමසීමට උත්සාහ කරන පුද්ගලයින් වෙත ප්‍රවේශය ලබා දෙන ලෙසත් නියෝග කරන ලදී.[160] එසේ වෙතත්, ඊපීඩීපී සංවිධානය විසින් මුලින් ආයුධ ලැයිස්තුව ලබා දීම ප්‍රතික්ෂේප කළ අතර, අධිකරණය විසින් කරුණු විමසීමට නියෝග කර තිබූ සාමාජිකයින් දහනව දෙනාගෙන් හය දෙනෙකු පමණක් ඉදිරිපත් කරමින්, ඔවුන්ගේ සාමාජිකයින් ගණනාවක් වෙත ප්‍රවේශය ලබා දීම ප්‍රතික්ෂේප කළේය.

හමුදාවට ද මීට වඩා සහයෝගයෙන් කටයුතු කළ හැකිව තිබූ බව ද පැහැදිලිය. විමර්ශනයේ දී පෙනී ගියේ රාත්‍රී ඇඳිරි නීතිය අතරතුර ඝාතනය සිදු වූ බවයි. ඒ අවස්ථාවේ සියලු සංචරණයන් පාලනය කරමින් අසල ප්‍රදේශයේ ඇත්ත වශයෙන්ම නම් කර ඇති නැත්නම් ලැයිස්තු ගත කර ඇති සෙබළුන් අවම වශයෙන් 30 දෙනෙකු ස්ථානගත කර සිටි බවට හා ඔවුන්ගේ අනුදැනුමකින් තොරව ඝාතකයින්ට එම ප්‍රදේශය හරහා යාමට ඇති ඉඩකඩ අතිශයින් අඩු බව අධිකරණ වාර්තාවේ දක්වා තිබුණි. එහෙත්, මහේස්ත්‍රාත්වරයා විසින් හමුදාපතිවරයාට නියෝගයක් නිකුත් කළ ආකාරයට, අසල මුරපොලවල් සහ ආරක්ෂක මුරපොලවල් ආරක්ෂා කළ සෙබළුන් කිහිප දෙනෙකු හඳුනාගෙන ඔවුන්ගෙන් කරුණු විමසීමට පොලිසියට මාස ගණනාවක් ගත විය. ඝාතනය සිදු වූ රාත්‍රියේ හමුදා නිලධාරීන් ප්‍රතිවාර දැක්වූයේ කුමන තත්වයන් යටතේද යන්න පැහැදිලි කිරීමට විමර්ශනයට නොහැකි විය. අසල පිහිටි මුරපොලවල් දෙකක සේවය කළ සෙබළුන් විසින් පසුව තහවුරු කරන ලද්දේ පිපිරීමේ ශබ්දය ඇසුණු බවයි. බලසේනා මූලස්ථානයට සම්බන්ධ වීමෙන් පසුව පමණක් එක් සෙබල කණ්ඩායමක් එම ස්ථානයට ගිය බව දක්වා ඇත.[161] නිමලරාජන්ගේ මස්සිනා වූ ඇන්ටන් ජෙගදාස් පෝල්, සිද්ධිය වූ ස්ථානයේ සිට ඉක්මනින් තුන්වැනි මුරපොලකට ගොස් සෙබලුන් කණ්ඩායමකට ඔහු සමග එන ලෙස ඒත්තු ගැන්වීමට සමත් වූ නමුත්, ඔවුන් ප්‍රදේශය වැටලීම හෝ සෝදිසි කිරීම මග හැර තිබුණි.

නිමලරාජන් ඝාතනයට දින කිහිපයකට පෙර සහ පැය කිහිපයකට පෙර හමුදා නිලධාරීන් ඔහුගේ නිවසට ගොස් ඇති බව වාර්තා වූ අතර, එහිදී ඔවුන් ඔහු එල්ටීටීඊ සංවිධානයට සහාය දක්වන පියවර ගෙන ඇති බවට (අසත්‍ය ලෙස – ඔහු එයට විරෝධය පළ කළේය) චෝදනා කළහ. මෙම චෝදනාකරුවන් කවුරුන්ද යන්න හෝ ඔවුන්ගෙන් කිසිවෙකු ඉන් ටික කලකට පසු සිදු වන ප්‍රහාරයකට සූදානම් වෙමින් නිමලරාජන්ගේ නිවසේ සැලැස්ම ඇගයීමට ලක් කළේ ද යන්න හඳුනා ගැනීමට කිසිදු උත්සාහයක් ගෙන නොමැති බව පෙනෙන අතර, ඔහුගේ පියාගේ වාර්තාවට අනුව, එක් තුවක්කුකරුවෙකු 'වේගයෙන්' සහ කිසිම පැකිලීමකින් තොරව, ඉදිරිපස දොරෙන් කෙළින්ම නිමලරාජන්ගේ අධ්‍යයන කාමරයට ගොස් තිබේ. ඝාතනය සිදු වූ දින රාත්‍රියේ සිදු වූ අසාමාන්‍ය ලෙස දීර්ඝ කරන ලද විදුලි කප්පාදුව, ප්‍රහාරයට පහසුකම් සැලසීමට උත්සාහ කරන බලවේග විසින් නිර්මාණය කර ඇත්දැයි සොයා බැලීමට කිසිදු උත්සාහයක් ගෙන ඇති බවක් නොපෙනේ.

ඇත්ත වශයෙන්ම සලකා බලන විට, ඝාතනයට නියෝග කිරීම හෝ පෙළඹවීම සම්බන්ධයෙන් හෝ වගකිව යුතු අය වැළැක්වීමට, ඔවුන් සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට හෝ ඔවුන්ට දඬුවම් කිරීමට පියවර නොගැනීම සම්බන්ධයෙන් වන රාජ්‍ය හෝ පැරාමිලිටරි හමුදාවන්හි ජ්‍යෙෂ්ඨ

[159] අධිකරණ විරෝධී, සාරාංශ හෝ අත්තනෝමතික මරණ දණ්ඩනය පිළිබඳ විශේෂ වාර්තාකරුගේ වාර්තාව, E/CN.4/2006/53/Add.5, 2006 මාර්තු 27, 34 ඡේදය.

[160] විනිසුරු විග්නරාජාගේ නියෝගය, 2002 ජූනි 5: MCJ2023 පිටු 108–109.

[161] රාජකාරියේ යෙදී සිටි සෙබළුන් 10 දෙනෙකුගෙන් ලබාගත් ප්‍රකාශවල රහස් පොලිස් සාරාංශය: MCJ2003 පිටු 282.

සාමාජිකයින්ගේ වගකීම ගවේෂණය කිරීමට කිසිදු අර්ථවත් උත්සාහයක් ගෙන ඇති බවට කිසිදු ඇඟවීමක් නොමැත. මෙහි ප්‍රධාන සැකකරුවන් රජයට අනුබද්ධ පැරාමිලිටරි කණ්ඩායමක් වන ඊපීඩීපී සාමාජිකයින් බව ඉක්මනින්ම පැහැදිලි වුවද කිසිම පියවරක් නොගැනීම සිදු වී ඇත. ඊපීඩීපී සංවිධානයේ ඇතැම් පහළ මට්ටමේ සාමාජිකයන් ඝාතනයට සම්බන්ධ වී ඇත්ද, නැතහොත් සමහර විට ඝාතනයට ආධාර සහ අනුබල දී තිබේද යන්න (උදාහරණයක් ලෙස ප්‍රවාහනය හෝ එය සිදු කිරීමට වෙනත් ක්‍රම සැපයීමෙන්) ෙතහවුරු කර ගැනීම කෙරෙහි විමර්ශනයේ අවධානය යොමු වී තිබුණි. 2002 මාර්තු මාසයේ දී[162] ජෙගන් නමින් හැඳින්වෙන සැකකරු ඉදිරිපත් කරන ලෙස අධිකරණය විසින් ඊපීඩීපී මහලේකම් ඩග්ලස් දේවානන්දට නියෝග කරන ලද නමුත් ඔහු හෝ අණදෙන නිලධාරීන්ගේ දාමයේ අනෙක් අය ප්‍රශ්නවලට පිළිතුරු දීමට කැඳවනු නොලැබුනේ මන්දැයි පැහැදිලි නැත.

ඊපීඩීපී, හමුදාව සහ පොලිසියේ පාර්ශ්වයෙන් ප්‍රමාදයක් ඇති බවට ඇති තරම් සාක්ෂි තිබුණ ද, නිමලරාජන්ගේ ඝාතනය දේශීය මාධ්‍ය සහ ජාත්‍යන්තර නිරීක්ෂකයින්ගේ අවධානය දිනාගත් ඉහළ පෙළේ විමර්ශනයක් වූ බැවින් බලධාරීන් යමක් කරන බව පෙන්වමින් සිටියෝය. 2002 ජනවාරි මාසයේ සිට රජයේ වෙනසක් සිදු වූ පසු විමර්ශනය වඩාත් ඵලදායී වූ බවත්, ඉහත විමර්ශනයේ කාලානුක්‍රමික වාර්තාවෙන් විවිධ කාලවලදී කාර්යශීලීත්වය වැඩි වූ අවස්ථා තිබූ බවත් දේශසීමා රහිත වාර්තාකරුවන් ප්‍රකාශ කර සිටියි. කෙසේ වෙතත්, විමර්ශනය පිළිබඳ අධිකරණ වාර්තා කියවන විට, විමර්ශනය මගින් බොහෝ අවස්ථාවල දී ඇතැම් වැදගත් සාක්ෂි ලුහුබැඳීම මග හැර ඇති බවට වන හැඟීම වළක්වා ගත නොහැක. විමර්ශනය අතරතුර පොලිසිය අධිකරණයට නිතිපතා වාර්තා ලබා දී ඇති නමුත්, ඇතැම් දේ ගැන කරුණු නොසොයා, හිඩැස් සහ නොගැලපීම් සහිතව මෙන් ම පැහැදිලි කිරීම් රහිතව කරුණු ඉදිරිපත් කර ඇත්තේ ඇයි යන්න සම්බන්ධයෙන් ගැටලු මතු වේ. උදාහරණයක් ලෙස, ඊපීඩීපී පක්ෂයේ ජ්‍යෙෂ්ඨ චරිතයක් වන නැපෝලියන් නමින් හැඳින්වෙන පුද්ගලයා 2001 දී විනිසුරුවරයා විසින් ඝාතනය සම්බන්ධයෙන් සැකකරුවෙකු ලෙස නම් කරන ලද අතර, වින්දිතයාගේ නීතිඥවරයා විසින් ඔහුව 'වැදගත් සාක්ෂිකරු'[163] ලෙස හඳුන්වනු ලැබුණි. කෙසේවෙතත්, ඔහු සැකකරු වීම සඳහා ඇති හේතුව සහ ඝාතනයේදී ඔහු සම්බන්ධ වී ඇතැයි සැක කරන භූමිකාව, අනිත් සැකකරුවන් සඳහා අවම වශයෙන් අඩක් සෘජුව ෙසඳහන් වන පරිදිවත්, අධිකරණ වාර්තාවේ කිසිසේත්ම පැහැදිලිව සඳහන් නොවේ. නැපෝලියන් සම්බන්ධ නැති බවට රහස් පොලිසිය දැඩි ලෙස විශ්වාස කිරීමට හෝ ඔහු අත්අඩංගුවට ගැනීම මග හැර සිටීම සම්බන්ධයෙන් පියවර ගැනීමට ඔවුන් අපොහොසත් වීම සම්බන්ධයෙන් කිසි විටෙකත් හේතු දක්වා නොමැත. ඉහත විමර්ශන වාර්තාවේ සඳහන් කළ පරිදි, නැපෝලියන්ට තමාටම තීරණය කිරීමට හැකි වන පරිදි අධිකරණය ඉදිරියේ පෙනී සිටීමට අවස්ථාවක් ලබා නොදීම ගැන විනිසුරු විග්නරාජා දැඩි ලෙස අසතුටට පත් විය.

විමර්ශනය අතරතුර වින්දිතයින් වෙනුවෙන් පෙනී සිටි නීතිඥයෙකු පවසන පරිදි, නඩුව වටා ඇති පීඩනය හේතුවෙන්, රජය විමර්ශනයේ අවධානය සැබෑ අපරාධකරුවන්ගෙන් ඉවතට ගෙන යාමට මංමුලා සහගත ලෙස උත්සාහ කරමින් සිටියේය : "මෙවැනි දෙයක් සිදු වූ සෑම අවස්ථාවකම ක්‍රියාත්මක වන ක්‍රමය වූයේ, පොලිසිය පරිධියේ සිටින පුද්ගලයින් හෝ සම්බන්ධයක් නොමැති පුද්ගලයින් අත්අඩංගුවට ගැනීම සහ අපරාධයට ඔවුන්ට කිසිදු සම්බන්ධයක් නොමැති වුවද ඔවුන් දිගු කාලයක් රඳවා තබා ගැනීමයි, එවිට ඔවුන් අත්අඩංගුවට ගත් බව ඔවුන්ට පැවසිය හැකිය, පසුව කලබලය සමථයකට පත් වූ පසු ඔවුන් නිදහස් කරනු ලැබේ."[164]

මෙම දේශපාලන සන්දර්භය පිළිබඳව එයට සම්බන්ධ සියලු දෙනා දැනුවත්ව සිටි බවට තවත් ඇඟවීමක් ලෙස, සැකකරුවන් වෙනුවෙන් පෙනී සිටි නීතිඥයෙකු 2002 සැප්තැම්බර් මාසයේදී අධිකරණයට පැමිණිලි කළේ, එවැනි ඝාතන සිදු වූ සෑම අවස්ථාවකම, විවිධ දේශපාලන පක්ෂ ඒවා තම වාසියට යොදා ගැනීමට උත්සාහ කළේ 'සිද්ධිය

162 අතිරේක විනිසුරු එලන්ගෝගේ නියෝගය, 2002 මාර්තු 15: MCJ2023 පිටු 11, 107, 296.

163 අධිකරණ නියෝගය, 2001 නොවැම්බර් 27: MCJ2003 පිටු 289; 2002 නොවැම්බර් 11 දින නඩු විභාගයකදී නීතිඥ රෙමීඩියස් විසින් මහේස්ත්‍රාත්වරයාට සිදු කළ ඉදිරිපත් කිරීම: MCJ2003 පිටු172.

164 නීතිඥ කේ.එල්. රත්නවේල් සමග සම්මුඛ සාකච්ඡාව, 2025 පෙබරවාරි 14

උපයෝගී කරගනිමින් ඡන්ද ලබා ගැනීම සඳහා' බවයි.[165] මිනීමැරුම් පරීක්ෂණ දින නියමයක් නොමැතිව කරගෙන යා නොහැකි බව සිහිපත් කරමින්, වැඩිදුර ක්‍රියාමාර්ගවලින් වරදකරුවෙකු නොවන බව සෑහීමකට පත් වූ විට චූදිතයෙකු නිදහස් කිරීමේ යුතුකම ඔහු විනිසුරුවරයාට මතක් කළේය. විමර්ශනයේ අධිකරණ වාර්තාවෙන් මතුවන තවත් කරුණක් වන්නේ නීතිපතිවරයා විසින් ඉටු කරන ලද කාර්යභාරයයි. ශ්‍රී ලංකා නීති පද්ධතිය තුළ, අපරාධ වරදක් සම්බන්ධයෙන් පුද්ගලයෙකුට අධිචෝදනා ගොනු කළ යුතුද යන්න තීරණය කිරීමේ සුවිශේෂී අයිතිය නීතිපතිවරයා සතුව පවතියි. විධායකයේ මැදිහත්වීමකින් තොරව මෙන් ම කරුණු සහ නීතිය පිළිබඳ වෛෂයික විශ්ලේෂණයක් මත පදනම්ව, කිසිදු අගතියකින් හෝ බලපෑමකින් තොරව, මෙම බලය ක්‍රියාත්මක කළ යුතුය.[166] නීතිපතිවරයා පොලිස් පරීක්ෂණ සම්බන්ධයෙන් කිසිදු අධීක්ෂණ පාලනයක් ක්‍රියාත්මක නොකරන නමුත් සංකීර්ණ විමර්ශනවලදී රහස් පොලිසිය ඔහුලේ උපදෙස් ලබා ගැනීම සාමාන්‍ය සිරිතක් වේ.[167] විනිසුරු විනයාගරාජා මහතාට පෙනී ගොස් තිබුණේ, නීතිපතිවරයා පරීක්ෂණයට මැදිහත්වීමක් සිදු කිරීමට උත්සාහ කරන බවයි. එක් අවස්ථාවක ඔහු පවසා සිටියේ, 'පොලිසිය පරීක්ෂණ වාර්තා නීතිපතිට පමණක් ලබාදී, මෙම අධිකරණයට ලබා නොදීම පිළිගත නොහැකි' බවයි.[168] අවසානයේ, විමර්ශනය අවසන් වන විට, පොලිසිය සහ අධිකරණය කිසිවෙකුට චෝදනා එල්ල කළ හැකිද යන්න සම්බන්ධයෙන් නීතිපතිවරයාගෙන් උපදෙස් බලාපොරොත්තුවෙන් සිටි අතර පිළිතුරක් - සෘණාත්මක පිළිතුරක්, ලබා දීමට වසර 10 කට වඩා ගත වීමේ ප්‍රතිඵලයක් ලෙස ඔවුන් ඇප මත නිදහස් වූහ. නිමලරාජන් නඩුවේ දී නීතිපතිවරයා තිරය පිටුපස සිට ඉටු කළ භූමිකාව අධිකරණ වාර්තාවලින් පැහැදිලි නැතත්, රාජ්‍ය මැදිහත්වීම සැක කරන නඩුවලදී භූමිකාවේ ස්වාධීනත්වය පිළිබඳව බොහෝ දෙනෙක් ප්‍රශ්න කරනු ලබන්නේ, නීතිපති දෙපාර්තමේන්තුව රාජ්‍යයේ ප්‍රධාන නීතිඥවරයා ලෙස මෙන් ම රාජ්‍ය නිලධාරීන්ට එරෙහිව නඩු පවරන අභියාචකයා ලෙසද ක්‍රියා කරන බැවිනි. රාජ්‍ය ක්‍රියාකාරීන් වෙනුවෙන් නඩු පවරන්නා ලෙස එකවර කටයුතු කරයි.[169]

**'නිසි පියවර'**

මරණයට පසු දින එනම් 2000 ඔක්තෝබර් 20 වන දින මයිල්වාගනම් නිමලරාජන්ගේ මරණය පිළිබඳ විධිමත් විමර්ශනයක් ආරම්භ වූ අතර, විමර්ශනය අධීක්ෂණය කළ මහේස්ත්‍රාත්වරයා එදිනම අපරාධ ස්ථානයට ගොස් තිබුණි. කෙසේ වෙතත්, ප්‍රදේශයේ මුරපොලවල් පාලනය කරන ආරක්ෂක හමුදා සහ එහිදී භාවිත වූ ආයුධ සම්බන්ධයෙන් ඊපීඩීපී සංවිධානයෙන් සාක්ෂි ලබා ගැනීම වැනි තීරණාත්මක පියවර, සිදුවීමෙන් මාස හෝ වසර ගණනාවකට පසුවත් ගෙන නොතිබුණි. ඝාතනයෙන් මාස හයකට වැඩි කාලයක් ගත වන තෙක් ම සමහර අසල්වැසියන්, මිතුරන් සහ එකට වැඩ කළ අයගෙන් කරුණු විමසා තිබුණේ නැත. ප්‍රහාරය සඳහා භාවිතා කරන ලද උණ්ඩ කොපුවක් සහ අත්බෝම්බයක කොටසක් ඇතුළු භෞතික සාක්ෂි, එම ස්ථානයේ සහ පොලිසිය සතුව තිබී හමු වූ නමුත්, ඒවා විශ්ලේෂණය සඳහා යැවීමට මාස දෙකකට වඩා වැඩි කාලයක් ගත විය. ඉහත විස්තර කර ඇති පරිදි, 2002 අගෝස්තු මාසයේ දී වින්දිතයා වෙනුවෙන් පෙනී සිටි නීතිඥයෙකු විසින් විමර්ශනය මුලින් එවකට පැවති දේශපාලන තත්වයන් හේතුවෙන් ඇණහිට තිබූ බවත්, මේ වන විට නැවත ආරම්භ කර ඇත්තේ හුදෙක් ජාත්‍යන්තර

[165] 1979 අපරාධ නඩු විධාන සංග්‍රහයේ 186 සහ 456 වගන්ති උපුටා දක්වමින් සැකකරුවන් වෙනුවෙන් පෙනී සිටි පොන් වෙට්‍රිවේල් 2002 සැප්තැම්බර් 3 සහ 2003 සැප්තැම්බර් 23 යන දිනවල අධිකරණය ඇමතීම: MCJ2023 පිටු 155-156 සහ 208.

[166] 'The role of the Attorney General of Sri Lanka and the Rule of Law', හිටපු නීතිපති පාලිත ප්‍රනාන්දු විසින් 2016 නොවැම්බර් 13 වන දින සන්ඩේ ටයිම්ස් පුවත්පතට කරන ලද කතාවේ සංස්කරණය කරන ලද අනුවාදය, මෙතැනින් ලබා ගත හැකිය: https://www.sundaytimes.lk/161113/sunday-times-2/the-role-of-the-attorney-general-of-sri-lanka-and-the-rule-of-law-216616.html

[167] එහිම

[168] විනිසුරු විග්නරාජන්ගේ නියෝගය, 2001 මාර්තු 27: MCJ2023 පිටු 82.

[169] 2009 දී තවත් ඉහළ පෙළේ මාධ්‍යවේදියෙකු වූ ලසන්ත වික්‍රමතුංග ඝාතනය සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශනයක දී, 2025 පෙබරවාරි මාසයේදී, ප්‍රධාන සැකකරුවන් තිදෙනෙකු, බුද්ධි අංශ නිලධාරීන් දෙදෙනෙකු සහ පොලිස් පරීක්ෂකවරයෙකු නිදහස් කිරීමට ගත් තීරණය ආපසු හැරවීමට නීතිපති රණසිංහට සිදුවිය: https://economynext.com/sri-lankas-attorney-general-makes-u-turn-in-row-over-emblematic-case-204916/ ශ්‍රී ලංකාවේ නීතිපතිවරයාගේ භූමිකාව සහ කාලයත් සමග එහි දේශපාලනීකරණය පිළිබඳ සවිස්තරාත්මක ඓතිහාසික විශ්ලේෂණයක් සඳහා, වගවීමකින් තොර අධිකාරිය: ශ්‍රී ලංකාවේ දඬුවම් නොලැබීමේ අර්බුදය, ජාත්‍යන්තර නීතිවේදීන්ගේ කොමිසම, 2012 නොවැම්බර්, 3 පරිච්ඡේදය බලන්න. http://www.humanrights.asia/wp-content/uploads/2018/07/The-Final-Report-of-the-IIGEP.pdf. 2008 අප්‍රේල් 14 දිනැති, බරපතල මානව හිමිකම් උල්ලංඝනයන් විමර්ශනය කිරීම සහ විමර්ශනය කිරීම සඳහා වූ ජාතික විමර්ශන කොමිසමේ කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා පිහිටුවන ලද, ජාත්‍යන්තර ස්වාධීන ප්‍රමුඛ පුද්ගලයින්ගේ අවසාන වාර්තාව ද බලන්න, එය සත්‍යය සෙවීමට සහාය වීමට දේශපාලන කැමැත්තක් නොමැතිකම නිගමනය කිරීමට ප්‍රධාන හේතුවක් ලෙස නීතිපතිවරයාගේ භූමිකාවේ ඇති උනන්දුව පිළිබඳ ගැටුම හඳුනාගෙන ඇත: http://www.humanrights.asia/wp-content/uploads/2018/07/The-Final-Report-of-the-IIGEP.pdf.

පීඩනයේ ප්‍රතිඵලයක් ලෙස බවත් දක්වමින් අධිකරණයේ දී චෝදනාවක් ඉදිරිපත් කළේය.

අධිකරණ වාර්තාවලට අනුව, විමර්ශනය භාර මහේස්ත්‍රාත් විනිසුරු විග්නරාජා, විමර්ශනයේ වේගය පිළිබඳව වඩ වඩාත් කලකිරීමට පත් වූ බව පැහැදිලිය. ඝාතනයෙන් සතියකට පසු, 2000 නොවැම්බර් 1 වන දින නිකුත් කරන ලද තීරණයක දී, නිමලරාජන් ඝාතනය කර ඇති බව ඔහු නිගමනය කළ අතර, තවදුරටත් විමර්ශනය කිරීමට, හා සැකකරුවන් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමට පොලිසියට නියෝග කළේය. ඊළඟ මාස සහ අවුරුදු කිහිපය තුළ ඔහු මෙම උපදෙස් බොහෝ වාරයක් පුනරුච්චාරණය කරමින්, පොලිසියේ අක්‍රියතාව හෝ ප්‍රමාදය පිළිබඳව නිතර නිතර අවවාද කරමින් සහ නිශ්චිත විමර්ශන පියවර නොගත්තේ මන්දැයි විමසීම සිදු කළේය. අදාළ දින රාත්‍රියේ අවට රාජකාරියේ යෙදී සිටි සියලුම සෙබලුන්ගෙන් කරුණු විමසීම වැනි පියවර ගන්නා ලෙස ඔහු ඉල්ලා නොසිටියේ නම්, එය අර්ධ වශයෙන්වත් ඉටු නොවීමට ඉඩ තිබුණි: 2001 මැයි මාසයේදී එවැනි කරුණු විමසීම් සිදු කර ඇත්දැයි ඔහු පොලිසියෙන් විමසූ විට, බොහෝ සෙබලුන් වෙනත් රාජකාරි ස්ථාන වෙත ගොස් ඇති බව පැවසුනු අතර, හමුදා මූලස්ථානය හරහා මෙම සෙබලුන් සොයා ගත හැකි බව ඔවුන්ට මතක් කර දිය යුතු වූයේ ද විනිසුරුවරයාටය. [170]

2004 අගෝස්තු මාසයේදී විනිසුරු විග්නේරාජ මහතා මෙම නඩුව තම අධිකරණයේ නඩු ලැයිස්තුවෙන් ඉවත් කළ පසු, විමර්ශනය අවසන් වූ නමුත් 2021 දක්වා නඩුව නිල වශයෙන් අවසන් කිරීම සිදු නොවුණි.

විමර්ශන පියවර ගැනීමේ ප්‍රමාදයන් සහ විමර්ශනයට ගත වූ සමස්ත කාලය, විමර්ශනයේ ඵලදායීතාවයට සැලකිය යුතු බලපෑමක් ඇති කළ බව පැහැදිලිය. තීරණාත්මක අධිකරණ වෛද්‍ය සාක්ෂි ලබා ගැනීමේ අවස්ථා අහිමි වී; වින්දිතයා ජීවත් වූ ප්‍රදේශය පාලනය කරන හමුදා සහ පොලිස් නිලධාරීන් සොයා ගැනීම දුෂ්කර වී; ඊපීඩීපී සාමාජිකයින් සොයා ගැනීමට නොහැකි වූ අතර සමහරු දේශපාලනඥයන් බවට පත්ව සිටියහ. 2000 දී ඊපීඩීපී සතුව තිබූ බවට විශ්වාස කරන ආයුධ 2002 සටන් විරාමයේදී හමුදාවට භාර දී තිබුණි. මෙවැනි ප්‍රමාදයන් සහ නොසැලකිලිමත්කම් ශ්‍රී ලංකාවේ අපරාධ යුක්ති විනිශ්චය පද්ධතිය විසින් මෙවැනි නඩු හසුරුවා ඇති ආකාරයෙහි සාමාන්‍ය ලක්ෂණයක් සේ දැකිය හැකිය. 2015 දී ප්‍රකාශයට පත් කරන ලද එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කාර්යාලයේ ශ්‍රී ලංකාව පිළිබඳ විමර්ශනයෙන් හෙළි වූයේ, ශ්‍රී ලංකාවේ මානව හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ බොහෝ නඩු අධිකරණ පද්ධතිය තුළ රැඳී ඇති බවත්, ඒවා නිරන්තරයෙන් කල් දැමීම සිදු වන බවත්, ඝාතන නඩු මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් ආරම්භ කිරීමේ ආරම්භක අදියරවලින් ඔබ්බට යාම කලාතුරකින් සිදු වූ බවත් පොලිස් විමර්ශන සීමා සහිත වූ බවත්ය.[171]

## ‘සම්පූර්ණ, ඵලදායී සහ විශ්වසනීය’

විමර්ශනය පුරාවටම බහුවිධ අසාර්ථකත්වයන් සිදුවී ඇති බව යාපනය මහේස්ත්‍රාත් අධිකරණ වාර්තාවෙන් පැහැදිලි වේ. ඕනෑම මිනීමැරුම් විමර්ශනයක දී සම්මතව සැලකෙන තීරණාත්මක මූලික පියවර අනුගමනය කර නොතිබීම මෙන්ම, පැවති සාක්ෂි සම්බන්ධයෙන් වැඩිදුර විමසීම් සිදු කර නොතිබීම, විමර්ශනය මෙහෙයවන විනිසුරුවරයාගේ පැහැදිලි කලකිරීමට හේතු වී තිබුණි. නඩුවට සම්බන්ධ නීතිඥයෙකුට අනුව, සාමාන්‍ය මිනීමැරුම් නඩුවකදී පොලිසිය අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටි, හමුදා හෝ පැරාමිලිටරි හමුදා සම්බන්ධ වූ නිමලරාජන් ඝාතනය වැනි සුවිශේෂ නඩුවලදී අනුගමනය කර නොතිබුණි. මෙවැනි නඩුවලදී, පොලිසියේ ලැදිකම් බෙදී ගොස් ඇති අතර ඝාතනය සම්බන්ධ දේශපාලන තත්වය ඔවුන්ට බලපා ඇත. සැබවින්ම මෙයට සම්බන්ධ වූවන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් දැඩි උනන්දුවක් පැවති අතර නිසි පරීක්ෂණයක් සිදු නොකෙරුණි. [172] පවතින අධිකරණ වාර්තාවෙන් නිගමනය කරන ලද විමර්ශනයේ ප්‍රධාන අසාර්ථකත්වයන් කිහිපයක් පහත දැක්වේ.

[170] 2001 මැයි 30 වන දින විනිසුරු විග්නරාජා අධිකරණයේදී දුන් නියෝගය: MCJ2023 පිටු 92.

[171] ශ්‍රී ලංකාව පිළිබඳ OHCHR විමර්ශන වාර්තාව, A/HRC/30/CRP.2, 2025 සැප්තැම්බර් 16, ඡේද 1226-1228.

[172] 2025 පෙබරවාරි 14 වන දින නීතිඥ කේ.එල්. රත්නවේල් සමග සම්මුඛ සාකච්ඡාව.

## අපරාධ ස්ථානය ආරක්ෂා කිරීමට, සෝදිසි කිරීමට සහ වාර්තා කිරීමට අපොහොසත් වීම

අපරාධ ස්ථානයක් තුළ සොයාගත් ඕනෑම සාක්ෂියක අඛණ්ඩතාව සහ සම්භවය ආරක්ෂා කිරීම සඳහා වහාම සුරක්ෂිත කිරීම, ඉන්පසු නිසි ලෙස වාර්තා කිරීම සහ සාක්ෂි නැවත ලබා ගැනීම, පොලිස් කටයුතුවල මූලික අංග වන අතර විමර්ශනයක සාර්ථක ප්‍රතිඵලය සඳහා අත්‍යවශ්‍ය වේ. නිමලරාජන්ගේ ඝාතනය සම්බන්ධයෙන් සලකා බලන විට, අපරාධ ස්ථානය සුරක්ෂිත කිරීමට කිසිදු උත්සාහයක් ගෙන නොමැති බව පෙනෙන අතර කොපමණ පිරිසක් දේපළට ඇතුළු වූවාද, ඔවුන් ගිය ස්ථාන, ඔවුන් ස්පර්ශ කළ දේ හෝ ඔවුන් සාමාන්‍යයෙන් කළ දේ සම්බන්ධයෙන් වාර්තා කර නොමැත. අපරාධ ස්ථානය සෝදිසි කළේ කවදාද හෝ කවුරුන් විසින්ද යන්න පිළිබඳ වාර්තාවක් ද සකස් කර නැත. ඇත්ත වශයෙන්ම දැඩි සෝදිසි කිරීමක් සිදු වූ බවට කිසිදු ඇඟවීමක් නොමැත. තව ද, පසුව සමාලෝචනය සඳහා ඉඩ සැලසෙන පරිදි අපරාධ ස්ථානයේ මුල් ඡායාරූප ලබාගෙන නොමැති බව ද පෙනේ. එසේම, එහි අඛණ්ඩතාව ආරක්ෂා කිරීමට හෝ එහි සම්භවය තහවුරු කිරීමට, එම ස්ථානයේ තිබී හමු වූ සාක්ෂි නිසි ලෙස ප්‍රතිසාධනය කර පටිගත කිරීමක් කර නොතිබුණි. සැබැවින් ම සලකා බලන විට, තීරණාත්මක සාක්ෂි විකෘති කළ හෝ නැති වූ අවස්ථා ගණනාවක් සම්බන්ධයෙන් අධිකරණ වාර්තා නිදසුන් සපයයි.[173]

## අපරාධ ස්ථානය පිළිබඳ සම්පූර්ණ අධිකරණ වෛද්‍ය විශ්ලේෂණයක් සිදු කිරීමට අපොහොසත් වීම

අධිකරණයට ඉදිරිපත් කරන ලද පොලිස් වාර්තාවල වින්දිතයාගේ නිවස සම්බන්ධයෙන් සිදු කරන ලද අධිකරණ වෛද්‍ය පරීක්ෂණයක් පිළිබඳ කිසිදු සඳහනක් නොමැත. නිමලරාජන් වැටී සිටියේ කොහේද සහ කෙසේද යන්න සහ කුමන අවස්ථාවක ද යන්න හඳුනා ගැනීමට, උණ්ඩ, උණ්ඩ කොටස් සහ කොපු හෝ ආවරණ කොටස් සොයා ගන්නා ලද්දේ කොතැනද යන්න සම්බන්ධයෙන් තක්සේරු කළ යුතුව තිබුණි. අපරාධ ස්ථානයේ දැඩි ලෙස ලේ තැවරී තිබූ බව බහුවිධ වාර්තා මගින් සනාථ කරයි. වෙඩි තැබීම සිදු වූ අවස්ථාවේ වින්දිතයා සහ ප්‍රහාරකයා සිටියේ කොහේදැයි දැන ගැනීම උපකාරී වන්නේ එමගින් කොපමණ පිරිසක් සම්බන්ධ වී ඇත්දැයි පෙන්විය හැකි වන නිසාය. විශේෂයෙන් වින්දිතයාගේ හිස දරුණු ලෙස බිඳී ගොස් තිබූ බැවින්, ප්‍රහාරකයන්ගෙන් කිසිවෙකු මත රුධිරය හෝ මොළයේ ද්‍රව්‍ය විසිරී තිබේද යන්න දැන ගැනීමට ද එය උපකාරී වේ. මේ නිසා ඕනෑම සැකකරුවෙකු විසින් එදින පැළඳ සිටි ඇඳුම් සහ සපත්තු හඳුනාගෙන අල්ලා ගැනීමට උත්සාහයක් දැරීමට හේතු විය යුතුව තිබුණි.

ඇඟිලි සලකුණු එකතු කර විශ්ලේෂණය සඳහා යවන ලද බව 2000 නොවැම්බර් මාසයේදී අධිකරණ වාර්තාවේ සඳහන් වන නමුත් එම ඇඟිලි සළකුණු ලබා ගත්තේ කොහෙන්ද යන්න එහි හරියටම සඳහන් නොවේ. එසේම, ඉන් පසුව ඇඟිලි සලකුණු සම්බන්ධ වාර්තාවක් ඉදිරිපත් කර ඇති බවක් නොපෙනේ. (ඩීඑන්ඒ සාම්පල එකතු කිරීම පිළිබඳව අධිකරණ සටහන්වල කොතැනකවත් සඳහනක් නොමැති අතර කෙසේ වෙතත් මෙය පුදුමයට කරුණක් නොවන්නේ එවකට එම ක්‍රියා පටිපාටිය ශ්‍රී ලංකාවේ ළඳරු අවධියේ පැවතීම හා අතර එය මිල අධික වීම යැයි සැලකිය හැකිය.[174]) කෙසේ වෙතත්, ලේ තැවරුණු ඉදිරිපස දොරේ සහ නිමලරාජන්ගේ අධ්‍යයන කාමරයේ දොරේ අධිකරණ වෛද්‍ය පරීක්ෂණ සිදු කරන ලද්දේ නම්, කිසියම් ප්‍රහාරකයෙකු එයින් එක දොරක් හෝ ස්පර්ෂ කළා ද යන්න තීරණය කිරීමට උපකාරී වනු ඇත. ඒ හා සමානව, රුධිරයෙන් හෝ වෙනත් ආකාරයකින් වන පා සලකුණු හෝ සපත්තු සලකුණු සඳහා අභ්‍යන්තර බිම පරීක්ෂා කළ යුතුව තිබුණි. නමුත් එවැනි පරීක්ෂණයක් හෝ විශ්ලේෂණයක් නොතිබුණි.

ප්‍රධාන විසිත්ත කාමරයේ පුපුරා ගිය අත් බෝම්බය නිවස ඇතුළ සිට හෝ පිටත සිට විසි කළාද යන්නත් විමර්ශනයෙන් තහවුරු නොවීය. අත්බෝම්බය නිවස තුළ සිට විසි කළේ නම්, එය ඇතුළත තිබී සොයාගත් අත්බෝම්බ ලීවරය සමග ගැලපෙනු ඇත. එසේම සිවිලිමේ කොටසක් පහළට

[173] මෙය කිසිසේත්ම සුවිශේෂී නොවන බව පෙනේ. 2002 සිට සිදු කරන ලද අපරාධ සම්බන්ධයෙන් CID විමර්ශන වාර්තා සහ අනෙකුත් ලේඛන කිහිපයක් සමාලෝචනය කිරීමෙන් පසුව, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කාර්යාලයේ ශ්‍රී ලංකාව පිළිබඳ විමර්ශනය 2015 දී නිගමනය කළේ, අපරාධ දර්ශන නිසි ලෙස ලේඛනගත කිරීමට සහ සාක්ෂි වාර්තා කිරීමට පොලිසිය අපොහොසත් වීමෙන් අපරාධ විමර්ශන අඩපණ වී ඇති බවයි. තීරණාත්මක සාක්ෂි නැති වූ හෝ විකෘති කරන ලද අවස්ථා, උණ්ඩ සහ කොපු වැනි ප්‍රධාන සාක්ෂි එකතු කර නොතිබූ සහ දුරකථන වාර්තා ඉල්ලා නොතිබූ අවස්ථා විමර්ශනය ලේඛනගත කර ඇත: ශ්‍රී ලංකාව පිළිබඳ OHCHR විමර්ශන වාර්තාව, A/HRC/30/CRP.2, 2025 සැප්තැම්බර් 16, 1236 ඡේදය බලන්න.

[174] බලන්න https://www.sundaytimes.lk/990411/plusm.html.

වැටීමෙන් නිසා නැඟුනු දුහුවිල්ලෙන් එය විසි කළ පුද්ගලයා වැකී ගොස් තිබිය හැකිය. තව දුරටත්, පිපිරීමෙන් ප්‍රහාරකයින්ට තුවාල සිදුවී තිබේද, නැතහොත් බිඳුනු ජනෙල්වල වීදුරු කැබලි නිසා ප්‍රහාරකයින්ට හෝ ඔවුන්ගේ ඇඳුම්වලට හානි වී තිබේද යන්න පිළිබඳව කිසිදු සාක්ෂියක් ගැන සොයා බලා නොතිබුණි. පසුදා සොයා ගන්නා (පහත බලන්න) ලද අතහැර දැමූ බයිසිකලයේ ආසනය, පැඩල් හෝ හැන්ඩ්ල්බාර් වීදුරු කැබලි, දූවිලි, ලේ පැල්ලම් හෝ පුපුරණ ද්‍රව්‍ය අපද්‍රව්‍ය සඳහා කිසි විටෙකත් පරීක්ෂා කර ඇති බවක් නොපෙනේ.

## අවට ප්‍රදේශය ආරක්ෂා කිරීමට, සෝදිසි කිරීමට සහ විශ්ලේෂණය කිරීමට අපොහොසත් වීම

ඝාතනය සිදු වූ වහාම එම ස්ථානය වට කිරීමට හෝ අවට ප්‍රදේශය සෝදිසි කිරීමට කිසිදු පියවරක් ගෙන නොමැත. දේපළෙන් පිටත ආරක්ෂා කිරීමට අපොහොසත් වීම නිසා ප්‍රහාරකයින්ගේ සංඛ්‍යාව සහ ඔවුන්ගේ පාවහන් හඳුනා ගැනීමට ගත් සියලු උත්සාහයන් වැළැක්විණි: ඇතුළට දිව ගිය දෙදෙනා හැර, තවත් ප්‍රහාරකයෙකු හෝ ප්‍රහාරකයන් පිටත රැඳී සිටියාද යන්න කිසි විටෙකත් තහවුරු කර නොමැත. මේ අතර, ඒ අවස්ථාවේ ක්‍රියාත්මක වෙමින් පැවති ඇඳිරි නීතිය සහ ප්‍රදේශයේ බහුලව හමුදා රැඳී සිටීම හේතුවෙන් ප්‍රහාරකයින්ට අනාවරණය නොවී එම ස්ථානයෙන් පලා යාමට නොහැකි බව සාක්ෂිකරුවන් කිහිප දෙනෙකු විශ්වාස කළහ. අත්බෝම්බ පිපිරීම මගින් අනතුරු ඇඟවීම ලැබුණු අවස්ථාවේ, ආරක්ෂක රාජකාරියේ යෙදී සිටි අය ප්‍රහාරකයින් අල්ලා ගැනීමට ක්ෂණික, ක්‍රියාකාරී උත්සාහයක් ගත්තේ නම් එය සාර්ථක වනු ඇති බව බොහෝ දෙනෙක් විශ්වාස කළහ.[175]

## පශ්චාත් මරණ පරීක්ෂණයේ සොයාගැනීම් පිළිබඳව පසු විපරම් කිරීමට අපොහොසත් වීම

ඝාතනයට පසු දින ලියන ලද පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවේ, වින්දිතයාගේ වෙඩි උණ්ඩ තුවාලවල ප්‍රමාණය, එක් තුවාලයක් වටාවෙඩිබෙහෙත් පැවතීම, ඒවායේ ඇතුල්වීමේ සහ පිටවීමේ ස්ථාන සහ ඒ අනුව ඒවායේ ගමන් පථ මෙන්ම වින්දිතයාගේ ශරීරයේ දක්නට ලැබුණු සැලකිය යුතු රුධිර පැල්ලම් සම්බන්ධයෙන් විස්තර කර ඇත. විවිධ ප්‍රමාණයේ ඇතුල්වීමේ තුවාල සඳහා, උණ්ඩයේ කොටස් දෙකටම සිදු වූ දේ, එයින් කොටසක් පමණක් පිටතට පැමිණියේද යන්න ඇතුළුව පැහැදිලි කිරීම් සෙවිය යුතුව තිබුණි. කෙසේ වුවත් භාවිතා කරන ලද ගිනි අවිය හෝ ගිනි අවි පිළිබඳව උණ්ඩ තුවාල වලින් තහවුරු කළ හැකි දේ සහ එවැනි ආයුධ ළඟ තබාගෙන සිටිය හැකි අය කවුද යන්න තහවුරු කිරීමට ගත් උත්සාහයක් පිළිබඳ වාර්තාවක් නොමැත.

## බයිසිකලය සම්පූර්ණයෙන් විමර්ශනය කිරීමට අපොහොසත් වීම

ඝාතනයට පසු දින නිමලරාජන්ගේ නිවසේ සිට මීටර් 500 ක් දුරින් දුම්රිය මාර්ගය අසල ලඳු කැලෑ ප්‍රදේශයකදී ප්‍රදේශවාසීන් විසින් අතහැර දැමූ බයිසිකලයක් සොයා ගන්නා ලදී. ඒ අවස්ථාවේ පොලිසිය විසින් එය රැගෙන ගොස් ඇතත්, ඒ ගැන අධිකරණ වාර්තාවල මුලින්ම දක්නට ලැබෙන්නේ මාස පහකට පසුවය. බයිසිකලය සහ ඝාතනය අතර කිසිදු සම්බන්ධයක්[176] සොයා නොගත් බව මුල දී පොලිසිය විසින් ප්‍රකාශ කර සිටි නමුත්, නමුත් විමර්ශනය ඉදිරියට නොයන අවස්ථාව වන විට එයට වැඩි වැදගත්කමක් ලැබී ඇති බව පෙනේ. ඝාතනය සිදු වූ අවස්ථාවේ බයිසිකලය භාරව සිටි බවට සැකපිට සැකකරුවන් දෙදෙනෙකු වසරක් පුරා අත්අඩංගුවේ තබාගෙන සිටියද, මෙම බයිසිකලය සහ අපරාධය අතර සම්බන්ධයක් පැහැදිලිව තහවුරු කර ගැනීමට පොලිසියට නොහැකි විය. එසේම කලින් සඳහන් කළ පරිදි, අපරාධ ස්ථානයේ දී සාක්ෂි දූෂණය වී ඇත්දැයි පරීක්ෂා කිරීම සඳහා බයිසිකලය පිළිබඳ සම්පූර්ණ අධිකරණ වෛද්‍ය පරීක්ෂණයක් කිසි විටෙකත් සිදු කර ඇති බවක් නොපෙනේ. තවද, මෙම සැකකරුවන් දෙදෙනාගෙන් (හෝ වෙනත් සැකකරුවෙකුගේ) ඇඟිලි සලකුණු බයිසිකලයේ නිරීක්ෂණය කරන ලද පැහැදිලිව පෙනෙන ඇඟිලි සළකුණු සමග සංසන්දනය කිරීමට ගත් කිසිදු උත්සාහයක් විස්තර

175 2000 ඔක්තෝබර් 31 වන දින ග්‍රාම සේවක හෙවත් ග්‍රාම පරිපාලක වයිරමුත්තු සන්තිරරාජා විසින් සහ 2001 අප්‍රේල් 26 වන දින යාපනය අපරාධ වැළැක්වීමේ ඒකකය භාර නිලධාරී ආර්යවංශ විසින් අධිකරණය ඉදිරියේ ලබා දුන් සාක්ෂි බලන්න: MCJ2023 පිටු 73 සහ 87.

176 විමර්ශනය භාරව සිටි යාපනය පොලිස් නිලධාරියා 2001 අප්‍රේල් 23 වන දින මහේස්ත්‍රාත්වරයාට දැනුම් දුන් පරිදි.

කිරීමට අධිකරණ වාර්තාව අසමත් වේ. එමෙන් ම, ඇසට නොපෙනෙන ඇඟිලි සළකුණු සොයා ගැනීමට තවදුරටත් ගත් කිසිදු උත්සාහයක් පිළිබඳ වාර්තාවක් නොමැත. කෙසේ වෙතත්, ඇඟිලි සලකුණු සම්බන්ධයෙන් දිනයක් නියම කළ නොහැකි වූ බැවින්, ඝාතනය සිදු වූ රාත්‍රියේ බයිසිකලය පැදවූයේ කවුරුන්ද යන්න ඇඟිලි සලකුණකින් ඔප්පු කළ නොහැකි වන අතර මෙම සාක්ෂියෙන් පමණක් මෙම බයිසිකලයේ ගමන් කරන්නෙකු සහ ඝාතනය අතර සම්බන්ධයක් ඔප්පු කළ නොහැකි විය.

## බැලිස්ටික් සාක්ෂි ලබා ගැනීමට, ප්‍රමාණවත් ලෙස පරීක්ෂා කිරීමට සහ පසු විපරම් කිරීමට අපොහොසත් වීම

සමස්තයක් වශයෙන්, විමර්ශනය අතරතුර පුපුරන ද්‍රව්‍ය සාක්ෂි නවයක් (P1–P9) ලැයිස්තුගත කර ඇත, නමුත් අයිතම සමූහයක් වූ තුන්වන නඩු භාණ්ඩය, (P3), අධිකරණයට ඉදිරිපත් කිරීමේදී ව්‍යාකූල සහ එක් එක් තැන වෙනස් ආකාරයෙන් ලෙස විස්තර කර ඇත (පෙනී යන ආකාරයට උණ්ඩ කොටස් තුනක් හෝ සම්පූර්ණ උණ්ඩ සහ කැබලි කරන ලද උණ්ඩ කොටස් මිශ්‍රණයක්). වෙඩි පහර තුනක් එල්ල වී ඇති අතර එක් උණ්ඩයක් පැලී ගොස් ඇත. එම ස්ථානයේ තිබී හමු වූ හිස් කොපු (බහුවචන) [177]සහ ඝාතනයෙන් පසු දින සොයාගත් මිමී 9 උණ්ඩ දෙකක්[178] පිළිබඳව අධිකරණ වාර්තාවේ සඳහන් වේ. මාස හයකට පසු ලබා දුන් සාක්ෂි ප්‍රකාශයක, නිමලරාජන් ඝාතන විමර්ශනයේ දී සොයාගත් උණ්ඩ ආවරණයක් සහ සම්පූර්ණ උණ්ඩයක් ඔහුගේ බෑණනුවෙකුට ලබා දීම පිළිබඳව ද සඳහනක්, දැක්වුන ද එය පැහැදිලිවම සාවද්‍ය විය.[179] මෙම අයිතම අතර අතිච්ඡාදනයක් තිබේද, එසේ නම් කොපමණ වේද, නැතහොත් (P3) පිළිබඳ විස්තරය සාවද්‍යද යන්න පැහැදිලි නැති අතර එම අවස්ථාවේ දී පොලිසිය අධිකරණ වාර්තාවට ඇතුළත් කර තිබූ ඇතැම් අයිතම නැවත සොයාගැනීමට වන උත්සාහයන් මග හැර තිබුණි.

කිසිදු ප්‍රකාශිත හේතුවක් නොමැතිව, අපරාධ ස්ථානයෙන් ලබාගත් බැලිස්ටික් සාක්ෂි වසරකට ආසන්න කාල පරතරයක් තුළ කොටස් දෙකක් ලෙස විශ්ලේෂණය සඳහා යැවීම සිදු වී ඇත. ඝාතනය සිදු වූ රාත්‍රියේ හමුදාව විසින් සොයා ගෙන පසුව පොලිසියට භාර දුන් නඩු භාණ්ඩ දෙක - (P1) ග්‍රෙනේඩ් ලීවරය සහ (P2) හිස් මිමී 9 කොපුවක් - හැරුණු විට (P3) අඩංගු නඩු භාණ්ඩ හරියටම කවදා, කවුරුන් විසින් හෝ කොහේදී සොයා ගන්නා ලද්දේද යන්න පිළිබඳ වාර්තාවක් නොමැත. මෙම නඩු භාණ්ඩ නැවත ලබා ගත් පසු ඒවා සම්බන්ධයෙන් කටයුතු කළ ආකාරය පැහැදිලි කිරීම සඳහා අඛණ්ඩතාවයේ දාමය පිළිබඳ වෙනත් කිසිදු ඇඟවීමක් ලිඛිතව දක්වා හෝ ඡායාරූපගත කර නොමැති අතර, එය ඕනෑම අධිකරණ වෛද්‍ය විශ්ලේෂණයක ශක්‍යතාවයට සහ සාක්ෂි සම්බන්ධයෙන් වන එහි ගුණාත්මක භාවයට බරපතල ලෙස බලපාන අසාර්ථකත්වයකි.

ලැයිස්තුගත කර ඇති සියලුම බැලිස්ටික් සාක්ෂි අවසානයේ මූලික ආකාරවලින් විශ්ලේෂණය කළ ද, මෙම අයිතම කිසිවක් ඇඟිලි සලකුණු සඳහා - ( ඩීඑන්ඒ සාක්ෂි අත්හැර) පවා පරීක්ෂා කර නොමැති බව පෙනීයයි. මෙම ආකාරයේ පරීක්ෂණ මගින් අයිතම නිශ්චිත ගිනි අවිවලට හෝ එක් එක් සැකකරුවන්ට සම්බන්ධ කිරීම කළ හැක් වන්නේ, සෑම අයිතමයක්ම ප්‍රහාරකයෙකු විසින් ස්පර්ශ කර තිබිය යුතු නිසාය. බැලිස්ටික් විශ්ලේෂණයෙන් උගත් තොරතුරු කිසි විටෙකත් අර්ථවත් ආකාරයකින් භාවිතා කළ බවට කිසිදු සලකුණක් නොමැත. උදාහරණයක් ලෙස, අත් බෝම්බ ලීවරය පැමිණි රට වැනි විස්තර වැදගත් විය හැකි නමුත් ඇතැම් අයිතම හමුදාවෙන්, ඊපීඩීපීයෙන් හෝ වෙනත් කණ්ඩායමකින් පැමිණීමට වැඩි ඉඩක් තිබේද යන්න සොයා ගැනීමට මෙවැනි තොරතුරු භාවිතා නොකළ බව පෙනේ.

එක් උණ්ඩයක් කැබලි වූයේ මන්දැයි හෝ එය වෙඩි තැබූ විට හෝ වෙඩි වැදුණු විට සිදු වූවාද යන්න පිළිබඳව කිසිදු පැහැදිලි කිරීමක් වාර්තා කිරීමක් සිදු කිරීමට හෝ

[177] 2022 සැප්තැම්බර් 19 වන දින සහ 2003 ජූලි 25 වන දින නැවතත් මහේස්ත්‍රාත්වරයාට ඉදිරිපත් කළ පරීක්ෂක ද සිල්වාගේ වාර්තාවල සඳහන් කර ඇත: MCJ2023 පිටු 158 සහ 201.

[178] ඝාතනයට පසු දින පොලිසිය මහේස්ත්‍රාත්වරයාට දැනුම් දුන් බව අධිකරණ වාර්තාවේ සඳහන් වේ: 'ඒ පරීක්ෂණයෙන් පසුවයි; ඔහු මට පෙන්වූයේ ඔහු 9mm උණ්ඩ දෙකක් ගත් බවයි': MCJ2023 පිටු 54.

[179] ඝාතනයෙන් මාස 6 කට පසු අසල්වැසියෙකු විසින් ලබා දුන් ප්‍රකාශයෙන් මෙය මතු විය: MCJ2023 පිටුව 268. (නිමලරාජන් පවුල පවසන්නේ ඔහුගේ බෑණනුවන්ට මෙම සාක්ෂි කිසිදා නොලැබුණු බවයි.)

පැහැදිලිවම උත්සාහ කර නොමැති අතර - භාවිතා කළ ගිනි අවිය සහ සමහර විට එහි පෙර හිමිකරු හඳුනා ගැනීමට එවන් තොරතුරුඋපකාරී විය හැකිව තිබුණි. දෝෂ සහිත උණ්ඩය වෙඩික්කරු මත පතිත වී ඇති ගිනි අවි අපද්‍රව්‍ය ප්‍රමාණයට බලපෑවේ කෙසේද යන්න පිළිබඳව ප්‍රශ්න මතු කළ යුතු අතර, - එය දෙවැනි වෙඩි තැබීම වූ නිසා - එම ස්ථානයේ කැබලි වූ සහ කැබලි නොවූ උණ්ඩ දෙකක්ම තිබීම මගින් අවම වශයෙන් ගිනි අවි දෙකක් භාවිතා කළ බව පෙන්නුම් කරයි.

විමර්ශනයේ දී පසු කාලීනව, ඝාතනය සිදු වූ අවස්ථාවේ ඊපීඩීපී සංවිධානය සතුව තිබූ ආයුධ සොයා ගැනීම සිදු විය. මහේස්ත්‍රාත්වරයා සෝදිසි වරෙන්තුවක් නිකුත් කිරීමෙන් අනතුරුව 2002 අගෝස්තු මාසයේදී, යාපනයේ ඊපීඩීපී කාර්යාලයෙන් මිමී 9 පිස්තෝලයක් (P4) ජීව උණ්ඩ හයක් සමග අත්අඩංගුවට ගන්නා ලදී.[180] ඉන්පසුව, මිමී 9 පිස්තෝල පහක් (P5–P9) ලබා ගෙන ඇති අතර, ඒවා ඊපීඩීපී සතුව පැවති නමුත් 2002 දී සටන් විරාම ගිවිසුමේ කොටසක් ලෙස ශ්‍රී ලංකා හමුදාවට භාර දී තිබුණි. මේවා පරීක්ෂා කර, එම ස්ථානයේ තිබී හමු වූ කොපුවක් (P2) ඔස්සේ මේවා වෙඩි තැබීමට සඳහා භාවිත කරන ලද බව බැහැර කරන ලදී. කෙසේ වෙතත්, එම ස්ථානයේ තිබී සොයාගත් බැලිස්ටික් අවශේෂ සොයා ගන්නා ලද පිස්තෝලවලින් (P4-P9) පැමිණි ඒවා නොවන බවත් ඒවා ඇත්ත වශයෙන්ම සබ් මැෂින් තුවක්කුවකින් තැබූ වෙඩි බව ද අධිකරණ වෛද්‍ය විශ්ලේෂණයෙන් නිගමනය විය.[181] එහෙත් විමර්ශනයේ දී සබ් මැෂින් තුවක්කුවක් සෙවීමට කිසිදු පැහැදිලි උත්සාහයක් ගෙන නොමැති අතර, වින්දිතයාගේ තුවාල හා අපරාධ ස්ථානය සම්බන්ධයෙන් එවැනි ආයුධයක් භාවිතා කිරීමේ බලපෑම සලකා බැලූ බවක් නොපෙනේ.

## ඝාතනයට පෙර නිකුත් කරන ලද මරණ තර්ජන හෝ ඒ ආශ්‍රිත දුරකථන ඇමතුම් පිළිබඳ සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ ගැන වැඩිදුර සොයා බැලීමට අපොහොසත් වීම.

නිමලරාජන්ගේ පවුලේ සාමාජිකයන් කිහිප දෙනෙකු සහ තවත් අය ඔහුගේ ඝාතනයට පෙර ඊපීඩීපී සංවිධානය විසින් ඔහුට කරන ලද මරණ තර්ජන ඇතුළු තර්ජන පිළිබඳව සඳහන් කරමින් ප්‍රකාශ ලබා දුන්හ.[182] මෙයට තර්ජනාත්මක දුරකථන ඇමතුම් ඇතුළත් විය. ලංකා ටෙලිකොම් කළමනාකොරීත්වය විසින් නිමලරාජන්ට පවසා තිබුණේ අංක සොයා ගැනීමට නොහැකි බවයි. කෙසේ වෙතත්, ඔහුගේ ක්‍රියාකාරකම් ගැන සලකා බලන විට, ඔහුගේ දුරකථන ඇමතුම්වලට සවන් දීම හා ඒවාට බාධා කිරීමට සිදු කර තිබීමට බොහෝ දුරට ඉඩ ඇති අතර, මේ සම්බන්ධයෙන් පරීක්ෂා කළ යුතුව තිබුණි. නිමලරාජන් විසින්ම ඔහුගේ ඇමතුම් පටිගත කර තිබේද යන්න සහ තර්ජනාත්මක ඇමතුම්වල ඒවායේ මූලාශ්‍රය සොයා ගත හැකි කිසියම් තොරතුරක් ඇතුළත් වී තිබේද යන්න සොයා බැලීමට පොලිසිය උත්සාහ කළ යුතුව තිබුණි. ඔහුට එරෙහි තර්ජන ඊපීඩීපී සංවිධානයෙන් ආරම්භ වූ බවට චෝදනා එල්ල වී තිබූ නිසා, එම පක්ෂයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයින් සැකකරුවන් ලෙස සලකා ප්‍රශ්න කිරීමට පොලිසිය පෙළඹවිය යුතුව තිබුණු. නමුත් එහි ඉහළ පෙළේ සාමාජිකයින් කිසි විටෙකත් විමර්ශනයට ලක් නොවීම පුදුමයට කරුණක් වේ.

### ඝාතනය සිදු වූ අවස්ථාවේ ලැබුණු දුරකථන ඇමතුමක් විමර්ශනය කිරීමට අපොහොසත් වීම

නිමලරාජන්ගේ පවුලේ අය ප්‍රකාශ කළ ආකාරයට ප්‍රහාරකයින් ඔහුව ඝාතනය කිරීමට නිවසට ඇතුළු වන විට ඔහු ලැබුණු දුරකථන ඇමතුමකට කතා කරමින් සිටි බවයි. මෙම ඇමතුම ලැබුණු වේලාව අනුව, එය ප්‍රහාරයට සම්බන්ධ විය හැකි අතර ඇති අතර, ඔහු නිවසේ සිටින බව තහවුරු කිරීමට සහ ඔහුව රඳවා තබා ගැනීමට නැත්නම් අවධානය වෙනතකට යොමු කිරීමට හෝ ප්‍රහාරකයින්ට ඔවුන් ඇතුළු වූ විට වහාම සොයා ගත හැකි නිශ්චිත ස්ථානයක ඔහුව ස්ථානගත කිරීමේ සැලසුමකට පවා එය සම්බන්ධ විය හැකිය. මෙම ඇමතුම සොයා ගැනීමට හෝ ඇමතුම ලබා දුන්

180 මේවා 1999 දී යාපනය ආරක්ෂක හමුදා ආඥාපතිවරයා විසින් නිකුත් කර ඇති බවට ඊපීඩීපී නිලධාරියෙකු සාක්ෂි දුන් අතර, සියලුම පළාත් සභා නායකයින්ට තුවක්කු ලබා දී ඇති අවස්ථාවක මෙය සිදු කර ඇති බව විත්තියේ නීතිඥයෙකු පැහැදිලි කළේය: MCJ2023 පිටු 363.

181 රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ වාර්තාව, 2003 අප්‍රේල් 25: MCJ2023 පිටු 326.

182 නිමලරාජන්ගේ බිරිඳ පොලිසියට පැවසුවේ ඝාතනයට වසරකට පෙර, සන්නද්ධ සංවිධානයක සාමාජිකයෙකු ලෙස තමා හඳුන්වා ගත් අයෙකු විසින් තමාට තර්ජනය කරන ලද බවත්, ඇගේ සැමියා ඔහුගේ සංවිධානයට එරෙහිව වාර්තා ඉදිරිපත් කරන බැවින් සුදු ඇඳුමින් සැරසී සිටීමට කාලය පැමිණ ඇති බවත්ය. ශ්‍රී ලංකාවේ, සුදු පැහැය අවමංගල්‍ය කටයුතු සමග සම්බන්ධ වේ.

පුද්ගලයා හඳුනා ගැනීමට ගත් උත්සාහයක් පිළිබඳ වාර්තාවක් නොමැත.

**හඳුනාගත් සැකකරුවන් සම්පූර්ණයෙන් විමර්ශනය කිරීමට අපොහොසත් වීම**

විමර්ශනය අතරතුර සැකකරුවන් කිහිප දෙනෙකු විධිමත් ලෙස හඳුනාගනු ලැබුව ද, අවසානයේ කිසිවෙකුට කිසිදු අපරාධයක් සම්බන්ධයෙන් චෝදනා එල්ල වීම සිදු නොවුණි. ඝාතනය සම්බන්ධයෙන් ඔවුන් සිදු කළ බවට සැක කෙරුණු භූමිකාව, අධිකරණ වාර්තාවෙන් බොහෝ අවස්ථාවල දී සම්පූර්ණයෙන්ම පැහැදිලි නොවන අතර සමහර අවස්ථාවල එය කිසිසේත් ම පැහැදිලි නොවේ. උදාහරණයක් ලෙස, ඉහත විස්තර කර ඇති පරිදි, සැකකරුවකුව සිටි නැපෝලියන් සම්බන්ධයෙන් මෙය සිදු වී තිබේ. මහේස්ත්‍රාත්වරයා විසින් ඔහු සැකකරුවෙකු බවට හඳුනාගෙන කැඳවනු ලැබූ නමුත් කිසි විටෙකත් ක්‍රියාශීලීව ඔහු සම්බන්ධයෙන් කරුණු සෙවීම සිදු කර නොමැත.[183] තවත් හඳුනාගත් සැකකරුවන් පස් දෙනෙකු අත්අඩංගුවට ගෙන මාස දෙකත් දොළහත් අතර කාලයක් රඳවා තබාගෙන ඇප මත මුදා හැරීම සිදු විය. පොලිස් පරීක්ෂක ද සිල්වා වාර්තා කළේ, එක් එක් අය විසින් අධිකරණයට ස්වේච්ඡාවෙන් ප්‍රකාශයක් සිදු කිරීම අවශ්‍ය බවයි. කෙසේ වෙතත්, අධිකරණ වාර්තාවෙන් තීරණය කළ හැකි පරිදි, ඔවුන්ගෙන් කිසිවෙකු ඝාතනයට සම්බන්ධ බව පිළිගෙන නොමැත.

**තර්ජනය කිරීම් සහ පහරදීම්වලට ලක් වූ බවට සමහර සැකකරුවන් විසින් කරන ලද චෝදනා සම්බන්ධයෙන් පසු විපරම් කිරීමට හෝ ඔවුන්ගේ තුවාල සාක්ෂි ලෙස තක්සේරු කිරීමට අපොහොසත් වීම.**

2002 පෙබරවාරි සිට කාලය ආවරණය කරන ලද 2015 ශ්‍රී ලංකාව පිළිබඳ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලයේ විමර්ශනයෙන්, ශ්‍රී ලංකාවේ අපරාධ යුක්ති විනිශ්චය පද්ධතිය තුළ වධහිංසා පැමිණවීම සහ අයුතු ලෙස සැලකීම බහුලව සිදුවන බවත්, රට පුරා පොලිස් ස්ථානවලින් නඩු නිතිපතා වාර්තා වන බවත් සොයා ගන්නා ලදී.[184] රඳවාගෙන සිටින සැකකරුවන්ගෙන් අවම වශයෙන් තිදෙනෙකු වන ජෙගන්, [185] මුරලි[186] සහ අත්පුතන්[187] පැමිණිලි කර සිටියේ, පොලිසිය විසින් සිදු කළ තර්ජන සහ ප්‍රචණ්ඩත්වය හේතුවෙන්, ඔවුන්ට ව්‍යාජ පාපොච්චාරණ අත්සන් කිරීමට බල කළ කෙරුණු බවත්, පසුව ඔවුන් එය ඉල්ලා අස්කර ගත් බවත්ය. මෙම ප්‍රකාශවලින් දෙකක් සිංහල භාෂාවෙන් වූ අතර, අදාළ සැකකරුවන්ට එය අවබෝධ වී නොතිබුණි. කෙසේ වෙතත්, විමර්ශනයේදී මෙය සැලකිල්ලට ගත්තා ද, සැලකිල්ලට ගනු ලැබුවේ නම් එය සිදු වූයේ කෙසේද යන්නවත් පැහැදිලි නැත. සැකකරුවන් ස්වාධීන වෛද්‍යවරයෙකු විසින් වෛද්‍ය පරීක්ෂාවට ලක් කළ යුතු බවට මහේස්ත්‍රාත්වරයා විසින් නියෝග කළ අතර, සමහරුන්ට පහරදීම නිසා ඇති වූ බවට සැලකෙන තුවාල ඇති බව සොයා ගන්නා ලදී. පැහැදිලිවම මෙහි දී ඔවුන්ගේ පිළිගැනීම්වල විශ්වසනීයත්වය සහ එම නිසා විමර්ශනයේ අඛණ්ඩතාව පිළිබඳව ප්‍රශ්න මතු කළ යුතුව තිබුණු නමුත් ඝාතනයට රාජ්‍ය ක්‍රියාකාරීන්ගේ විය හැකි සම්බන්ධයක් යෝජනා කරන සාක්ෂි තිබිය දී පවා මෙම ගැටලුකාරී තැන් සැලකිල්ලට ගත්තේද යන්න හෝ සැලකිල්ලට ගත්තේ නම් ඒ කෙසේද යන්න පවා පැහැදිලි නොවේ. 2002 අප්‍රේල් මාසයේදී ජෙගන් පරීක්ෂාවට ලක් කළ අවස්ථාවේ දී, මාස 6 කට වඩා පැරණි පිළිස්සුම් කැළලක් ඇතුළු පැරණි කැළැල් ඇති බව දක්නට ලැබුණු විට, නිමලරාජන් ඝාතනය අවස්ථාවේ සිදු වූ අත්බෝම්බ පිපිරීමක් ආසන්නයේ සිටීම නිසා මෙම කැළැල් ඇති වූයේ ද යන්න පිළිබඳව කිසිදු ඇගයීමක් සිදු කර නොමැති බව පෙනේ.

183 2001 නොවැම්බර් 26 දින නඩු විභාගය: MCJ2023 පිටු 104.

184 ශ්‍රී ලංකාව පිළිබඳ OHCHR විමර්ශන වාර්තාව, A/HRC/30/CRP.2, 2015 සැප්තැම්බර් 16, 533 ඡේදය.

185 2001 අප්‍රේල් 28 දින ගන්නා ලද ප්‍රකාශය: MCJ2023 පිටු 271.

186 2002 අගෝස්තු 2 වන දින අධිකරණය අමතමින්, මුරලි ලෙස හඳුන්වන සැකකරු වන ඩේවිඩ් මයිකල් කොලින්: MCJ2023 පිටු 139-144.

187 සැකකරු වෙනුවෙන් නීතිඥවරයා විසින් යාපනය මහේස්ත්‍රාත් අධිකරණයට සිදු කළ ඉදිරිපත් කිරීම, 2003 සැප්තැම්බර් 23: MCJ2023 පිටු 206-207, සහ මහේස්ත්‍රාත්වරයාට ලබා දුන් ප්‍රකාශය, 2003 ඔක්තෝබර් 30: MCJ2023 පිටුව 221.

# 5. විමර්ශනය කිරීමට අපොහොසත් වීම: ඇඟවුම්

## 5.1 සමහර සැකකරුවන් විසින් සිදු කරන ලද වෙනත් අපරාධ පිළිබඳ චෝදනා

නිමලරාජන් විමර්ශනයේදී නම් කරන ලද සැකකරුවන් කිහිප දෙනෙකු ඔහුගේ ඝාතනයට පෙර හෝ පසුව වෙනත් බරපතල අපරාධ සම්බන්ධයෙන් සැකකරුවන් බවට පත් වී සිට අතර, අවසානයේ නඩු දෙකක දී ඔවුන් චූදිතයන් සේ තීන්දු කිරීම සිදු විය ලදී.

**සෙබස්තියන් රමේෂ් නොහොත් නැපෝලියන්; ඩේවිඩ් මයිකල් කොලින් නොහොත් මුරලි – පැහැර ගැනීම සහ වධහිංසා පැමිණවීම**

**1998:** නිමලරාජන්[188] ඝාතනයට වසර දෙකකට පෙර නැපෝලියන් සහ මුරලි යන සැකකරුවන්ට ඊපීඩීපී සාමාජිකයෙකු පැහැරගෙන ගොස් වධහිංසා පැමිණවීමට සම්බන්ධයෙන් චෝදනාවක් ගැන වාර්තා වූ අතර, ඒ පිළිබඳව ක්‍රියාමාර්ග ගෙන ඇති බවක් නොපෙනුණි.

**සෙබස්තියන් රමේෂ් හෙවත් සෙබස්තියන් නැපෝලියන්; නඩරාජා මාතානරාජා - මිනීමැරුම් දෙකක්**

**2001 නොවැම්බර් 28:** නාරන්තනි ඝාතන සිද්ධියේදී ඊපීඩීපී සංවිධානය විසින් දෙමළ දේශපාලන ක්‍රියාකාරීන් දෙදෙනෙකු ඝාතනය කිරීම සහ මැතිවරණ අපේක්ෂකයින් 4 දෙනෙකු ඇතුළු තවත් 21 දෙනෙකු තුවාල ලැබීම සිදු විය. සැකකරුවෙකු වූ නැපෝලියන් සිද්ධියට අදාළව චෝදනා ලැබූ එක් අයෙකු වූයේය. නාරන්තනි සිද්ධියේ ඔහුගේ භූමිකාව සම්බන්ධයෙන් තවත් ඊපීඩීපී සාමාජිකයෙකු වූ මතනරාජා සමග, පසුව ශ්‍රී ලංකාවේ දී මරණ දඬුවම නියම කරන ලදී; විදේශයන්හි සැඟවී සිටියදී පවා ඔවුන් තම පක්ෂයේ සාමාජිකයන් ලෙස සිටි බව ඊපීඩීපී නායකයා පැවසූ බව වාර්තා වේ.[189]

**කන්දසාමි ජෙගතීස්වරන් හෙවත් ජෙගන් හෙවත් කිරුබා - ලිංගික අතවර**

2004: මාර්තු 26 වැනි දින, සැකකරු කන්දසාමි ජෙගතීස්වරන් විසින් කීට්ස් හි දී, පාසල නිම වී නිවසට යමින් සිටි වයස අවුරුදු 12 ක පාසල් දැරියක් පඳුරු සහිත වනාන්තරයකට ඇදගෙන ගොස් ලිංගික අතවර කර ඇති බව මාධ්‍ය වාර්තාවල සඳහන් විය.[190]

**2012:** මාර්තු මාසයේ සිදු වූ ඝාතනයකට මාස තුනකට පෙර (පහත), මාධ්‍ය වාර්තාවල සඳහන් වූයේ කන්දසාමි ජෙගතීස්වරන් "ඩෙල්ෆ්ට් හි දී තුවක්කුවක් ("ප්ලාස්ටික් පිස්තෝලයක්") එල්ල කර තරුණියක් බිය ගැන්වීමට සහ දූෂණය කිරීමට උත්සාහ කළ" බවයි.[191] ප්‍රවෘත්තියේ සඳහන් වන ආකාරයට, "ලක්ෂ්මීට පහර දීමට දින දෙකකට පෙර සැකකරු තවත් තරුණියන් දෙදෙනෙකු අපයෝජනය කිරීමට උත්සාහ කළ බව ගම්වාසීන් පවසයි." ඔහුට ඩෙල්ෆ්ට්

[188] https://www.tamilnet.com/art.html?catid=13&artid=2296. මුරලි 2005 දෙසැම්බර් 12 වන දින එල්ටීටීඊය විසින් ඝාතනය කරන ලද බව පෙනේ. බලන්න: https://www.satp.org/other-data/srilanka-na-easternprovince/shot-dead_2005

[189] https://tamildiplomat.com/naranthanai-convicts-still-members-epdp-arrested-bring-challenges-douglas-devananda/

[190] https://www.tamilnet.com/art.html?catid=13&artid=11586

https://www.tamilnet.com/art.html?catid=13&artid=11629

[191] https://www.sundaytimes.lk/120401/News/nws_045.html: 2012 අප්‍රේල් 1 වන දින, තවමත් නිදැල්ලේ සිටින සන්නද්ධ කාඩර්වරුන් සම්බන්ධයෙන් ගම්වැසියන් කෝපයට පත් වී සිටියහ.

පොලිස් ස්ථානයේ දිනපතා වාර්තා කර අත්සන් කරන ලෙස දැනුම් දී ඇති බව ප්‍රකාශ වී තිබේ.

**2012:** මාර්තු 3 වැනි දින කන්දසාමි ජෙගතීස්වරන් විසින් ඩෙල්ෆ්ට් හි දී 12 හැවිරිදි ලක්ෂිනි ජේසුරාසා දැරිය දූෂණය කර මරා දැමීය. වෙළඳපොළට මාළු මිලදී ගැනීමට ගිය ඇය ආපසු පැමිණ නොතිබුණි. ඇගේ පවුලේ අය සහ හිතමිතුරන් ඇයව සොයා පොලිස් ස්ථානට ගිය අවස්ථාවේ දී වනාන්තරයේ දර එකතු කරමින් සිටියදී කෝවිලක් අසල කුඩා දැරියකගේ මළ සිරුරක් දුටු බව වාර්තා කිරීමට කාන්තාවක් පොලිස් ස්ථානයට පැමිණ සිටියාය. එම ස්ථානයට ගිය විට, පවුලේ අයට ලක්ෂිනිගේ බයිසිකලය සහ හිසෙහි සහ මුහුණේ එක් පැත්තක ලේ සහිත ඇගේ සිරුර දක්නට ලැබුණි. ඇගේ යට ඇඳුම් මළසිරුර අසල තිබූ අතර පශ්චාත් මරණ පරීක්ෂණයෙන් පසුව තහවුරු වූයේ ඇය යෝනි මාර්ගයෙන් සහ ගුද මාර්ගයෙන් දූෂණයට ලක් වී බවත් ඇගේ අත්වල සපා කෑමේ සලකුණු ඇති බවත්ය.[192] ඇසින් දුටු සාක්ෂිකරුවන්ට මළ සිරුර අසල ලේ තැවරුණු ගලක් මෙන් ම හිස් මත්පැන් බෝතලයක්, දේශීය සිගරට් සහ මුදල් දක්නට ලැබුණි.[193] තම ප්‍රදේශයේ කිසිවෙකුට මත්පැන් විකිණීමට බලපත්‍රයක් නොමැති බව ප්‍රාදේශීය ප්‍රජාව දැන සිටි අතර, මත්පැන් නීති විරෝධී ලෙස අලෙවි කරන ලද ප්‍රජාවේ සිටි එක ම කාන්තාව විසින් තහවුරු කළේ එදින ඊපීඩීපී සාමාජිකයෙකු ඇයගෙන් මත්පැන් මිලදී ගත් බවයි.

මෙම අවස්ථාවේ දී පවුලේ අය සහ හිතමිතුරන් පොලිසිය මත විශ්වාසය නොතබා ඉක්මනින් ක්‍රියා කර තමන්ගේම විමර්ශනයක් සිදු කළහ. ඔවුන් ලක්ෂිනී වෙළඳපොළේ සිට වනාන්තරයට දෙසට ගිය බව සිතන මග ඔස්සේ ආපසු යමින්, ගෙයින් ගෙට ගොස් යමක් දුටුවාදැයි විමසීම් සිදු කළහ. එක් කාන්තාවක් පවසා තිබුණේ ලක්ෂිනී පසුපස ඊපීඩීපී පක්ෂයේ සාමාජිකයෙකු වන අයෙකු යනු දුටු බවයි. ඔහු ජීවත් වන ස්ථානය ප්‍රදේශයේ ජනතාව දැන සිටි නිසා ඔවුන් කෙලින්ම ඔහුගේ නිවසට ගිය විට, ලේ වැකුණු ගිය සරමක් ඇඳගෙන ඔහු සිය බිරිඳ අසල බිම වාඩි වී සිටිනු දක්නට ලැබුණි. ඊපීඩීපී පක්ෂය සඳහා ප්‍රදේශය භාර කන්දසාමි ජෙගතීස්වරන් ලෙස ඔහු හඳුනාගනු ලැබුණු අතර යමෙකු පොලිසියට දුරකථන ඇමතුමක් දීමෙන් අනතුරුව, ඔවුන් පැමිණ කන්දසාමි ජෙගතීස්වරන් ඔවුන්ගේ වාහනයෙන් පොලිස් ස්ථානයට ගෙන ගොස් තිබේ, මෙහිදී විරෝධතා දැක්වීමට පොලිස් ස්ථානයට ගිය ප්‍රදේශවාසීන්ට පොලිසිය විසින් පහර දී කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කළේය. ඉන්පසු දිනවලදී පොලිස් ස්ථානයෙන් පිටත විරෝධතා වර්ධනය වූ අතර පසුව මේ විරෝධතා, ලක්ෂිනිගේ දේහය තබා තිබූ රෝහලට අසලට ගෙන යාමෙන් අනතුරුව, මේවාට සහයෝගීතාවයෙන් කඩ සාප්පු සහ බස් රථ පවා එදිනෙදා කටයුතු කිරීම නවත්වා තිබුණි. ඩෙල්ෆ්ට් දූපතේ ජනතාව බලධාරීන්ට මෙතරම් අභියෝගයක් එල්ල කිරීම කෙතරම් අසාමාන්‍යද යන්න පිළිබඳව මරිසා ද සිල්වා එකල *ග්‍රවුන්ඩ්වීව්ස්* හි ලියමින් ප්‍රකාශ කර සිටියාය.

ඇසින් දුටු සාක්ෂි ලබා ගැනීමේදී පොලිසිය විසින් සිදු කරන ලද ප්‍රමාදය පිළිබඳව ද ඇය අදහස් දක්වමින්, "මෙම සිදුවීමෙන් මාසයකට ආසන්න කාලයක් තුළ ඇත්ත වශයෙන්ම බාහිර දේශපාලන බලවේග ක්‍රියාත්මක නොවන්නේ නම්,ඇසින් දුටු සාක්ෂිකරුවන් හතර දෙනෙකුගේ ප්‍රකාශ ලබා ගැනීමට පොලිසියට නොහැකි වූයේ මන්ද යන පැහැදිලි ප්‍රශ්නය මෙය මතු කරයි," ඇය තවදුරටත් පවසන්නේ: "දූෂණයට ලක් කිරීමට තැත් කළ බවට චෝදනා ලැබූ පුද්ගලයෙකුට "වේවැල් පහරක්" වැනි සුළු දඬුවමකින් අනතුරුව නැවත ප්‍රජාවට ඇතුළු වීමට ඉඩ දෙනු ලැබීම වූදිතයා භාවිතා කරන බව පෙනෙන දේශපාලන බලපෑම ගැන හොඳින් ගෙනහැර දක්වන බවයි. ඒ වෙනුවට, ඔහු නිසි ක්‍රියා පටිපාටියට යටත් කර තිබුණා නම්, ලක්ෂිනි අදටත් ජීවතුන් අතර සිටින්නට ඉඩ තිබුණු' බව ඇති වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත.[194]

මෙම මාධ්‍ය වාර්තාවෙන් පෙන්නුම් කරන පරිදි, නිමලරාජන් ඝාතනයට කන්දසාමි ජෙගතීශ්වරන් සම්බන්ධ බව ප්‍රදේශවාසීන් හොඳින් දැන සිට තිබේ:

ගම්වැසියන් පැවසුවේ ජෙගතේශ්වරන් හිටපු ඊපීඩීපී අණදෙන නිලධාරියෙකු වූ නැපෝලියන්ගේ දකුණු අත වූ අතර යාපනයේ පදිංචි මාධ්‍යවේදී **මෛල්වාගනම්**

[192] 2017 අප්‍රේල් 10 වන දින, 12 හැවිරිදි දැරියක් දූෂණය කර ඝාතනය කිරීම සම්බන්ධයෙන් හිටපු ඊපීඩීපී සාමාජිකයෙකුට මරණ දඬුවම නියම විය, Tamil Guardian, https://www.tamilguardian.com/content/former-epdp-member-sentenced-death-rape-and-murder-12-year-old

[193] https://www.sundaytimes.lk/120401/News/nws_045.html

[194] 2012 පෙබරවාරි 4 වන දින මරීසා ද සිල්වා, යාපනයේ දී වයස අවුරුදු 13 ක දැරියක් පැරාමිලිටරි භට පිරිසක් අතවරයට ලක් කිරීම. https://groundviews.org/2012/04/02/the-rape-of-a-13-year-old-and-paramilitary-presence-in-jaffna/

නිමල්රාජන් ඝාතනයේ සැකකරුවෙකු ද වූ බවයි. ඉහත සඳහන් කළ සිදුවීම් දෙකට අමතරව, මෙම සිදුවීමට දින දෙකකට පෙර ඔහු තවත් තරුණියන් දෙදෙනෙකුට අතවර කිරීමට උත්සාහ කළ බව ගම්වැසියන් කියා සිටියහ. අපරාධකරුට එරෙහිව පැමිණිලි කිහිපයක් ඉදිරිපත් කිරීමෙන් පසුව පවා පොලිසියේ අක්‍රියතාව ගැන ගම්වැසියන් කෝපයට පත්ව සිටි අතර, යම් දේශපාලන බලපෑමක ප්‍රතිඵලයක් ලෙස ඔහු පොලිසියෙන් නිදහස් කර ඇති බවත්, ඒසේ නිදහස් කිරීම නිසා ඔහුට මෙම දරුණු අපරාධය කිරීමට හැකි වූ බවත් ගම් වැසියන් ප්‍රකාශ කර ඇත. [195]

2017 අප්‍රේල් මාසයේදී අවසානයේ කන්දසාමි ජෙගතීස්වරන් ඝාතනය සහ දූෂණය සම්බන්ධයෙන් වරදකරු බවට පත් කරනු ලැබූ අතර, එය අර්ධ වශයෙන් වින්දිතයාගේ ශරීරයේ තිබී සොයාගත් ශුක්‍රාණුවල ජාන පරීක්ෂණ සහ ඔහුගේ DNAවලට ගැළපෙන බව පදනම් වෙමින් සිදු කෙරිණි.

උසාවි ක්‍රියාවලිය අතරතුර, ලක්ෂිනීගේ පවුලේ අය වෙත නැවත නැවතත් පැමිණි එවකට යාපනයේ පක්ෂයේ ප්‍රධානියා වූ කන්දසමයි කමලේන්ද්‍රන් (පසුව ඔහු මිනීමැරුම් චෝදනාවට ලක් විය) ඇතුළු ඊපීඩීපී නිලධාරීන්, සහ පොලිසිය (සීඅයිඩී) විසින් නඩුව ඉවත් කරන ලෙස ඉල්ලා සිටීම සිදු විය. [196]

## 5.2 නිමලරාජන්ගේ නඩුව: විශ්ව අධිකරණ බලය පදනම් කරගෙන ශ්‍රී ලංකාවෙන් පිටත සිදු වන විමර්ශන

නිමලරාජන් ඝාතනය පිළිබඳ විමර්ශනයේදී ශ්‍රී ලංකාවේ කිසිවෙකුට ඔහුගේ ඝාතනය සම්බන්ධයෙන් චෝදනා එල්ල නොවූවත්, අපරාධ නඩු පැවරීමට සහ සිවිල් යුද්ධය අතරතුර බරපතල මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් සම්බාධක තන්ත්‍ර භාවිතා කිරීමට වෙනත් තැන්වල එය සිදු කිරීම පියවර ගෙන ඇත. 2021 දී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරයා අනතුරු ඇඟවූයේ ශ්‍රී ලංකාව අතීතයේ සිදු වූ උල්ලංඝනයන් සම්බන්ධයෙන් කටයුතු කිරීමට අපොහොසත් වීම ඔස්සේ මානව හිමිකම් උල්ලංඝනයන් නැවත නැවත සිදුවීමේ අවදානම සැලකිය යුතු ලෙස ඉහළ නංවා ඇති බවත්, වෙනත් කරුණු අතර, විශ්වීය අධිකරණ බලයේ මූලධර්මය යටතට තවත් නඩු ගෙන ඒම සම්බන්ධයෙන් සලකා බලන ලෙස තුන්වන රාජ්‍යයන්ගෙන් ඉල්ලා සිටින බවත්ය.[197] මෙම මූලධර්මයට අනුව, යම් රාජ්‍යයකට ජාත්‍යන්තර නීතිය යටතේ - මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ, යුද අපරාධ, ජන සංහාරය සහ වධහිංසා පැමිණවීම වැනි - ඇතැම් බරපතල අපරාධ සම්බන්ධයෙන් සැක කරන පුද්ගලයින්ට එරෙහිව අපරාධය සිදු වූ ස්ථානය හෝ අපරාධය සහ ඔවුන්ගේ රට අතර ඇති ඕනෑම සම්බන්ධයක් නොසලකා නඩු පැවරිය හැකිය.[198] විශ්වීය අධිකරණ බලය පිළිබඳ මූලධර්මයට අනුව සමහර අපරාධ කෙතරම් දරුණුද යත්, සෑම රාජ්‍යයක්ම යුක්තිය ඉටු වන බව දැකීමට උනන්දුවක් දක්වන අතර එය අපරාධ සිදු වූ රාජ්‍යයට පමණක් අදාළ ගැටලුවක් නොවේ.[199]

මානව හිමිකම් උල්ලංඝනය කිරීම්වලට සම්බන්ධ බවට චෝදනා ලැබ පසුව විදේශයන්හි සොයා ගන්නා ලද ශ්‍රී ලාංකිකයින්ට එරෙහිව ITJP සහ අනෙකුත් පාර්ශ්ව විසින් වසර ගණනාවක් පුරා ඕස්ට්‍රේලියාව, බ්‍රසීලය, චිලී, කොලොම්බියාව, ඇමරිකා එක්සත් ජනපදය, ජර්මනිය, ස්විට්සර්ලන්තය සහ සිංගප්පූරුව ඇතුළු රටවල් ගණනාවක විශ්වීය අධිකරණ බලය පදනම් කරගත් අපරාධ පැමිණිලි ගොනු කර ඇත. එක් අවස්ථාවකදී, හමුදාපතිවරයෙකු ලෙස ඔහුගේ පෙර භූමිකාව සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද චෝදනාවලින් අනතුරුව රාජ්‍ය තාන්ත්‍රිකයෙකු ඉවත් කිරීම සිදු විය.[200]

කෙසේ වෙතත්, එක්සත් රාජධානියේ පමණක් අඛණ්ඩ අපරාධ පරීක්ෂණයක් පවත්වා ඇති අතර, එම කාලය තුළ ශ්‍රී ලංකාවේ දේශපාලන ඝාතන සම්බන්ධයෙන් පුද්ගලයින් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත. 2017 දී, ITJP සහ Redress විසින් එක්සත් රාජධානියේ මෙට්‍රොපොලිටන්

195 https://groundviews.org/2012/04/02/the-rape-of-a-13-year-old-and-paramilitary-presence-in-jaffna/

196 ITJP රහස්‍ය ප්‍රකාශය W300.

197 ශ්‍රී ලංකාවේ සංහිඳියාව, වගවීම සහ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම, මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලයේ වාර්තාව, එක්සත් ජාතීන්ගේ ලේඛනය A/HRC/46/20, 2021 ජනවාරි 27, ඡේදය 61(c).

198 බොහෝ රාජ්‍යයන් අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමට පෙර, සැකකරු තම භූමිය තුළ පදිංචිය හෝ සිටීම වැනි යම් සම්බන්ධතාවයක් අවශ්‍ය කරයි.

199 බලන්න Redress, විශ්ව අධිකරණ බලය: https://redress.org/universal-jurisdiction/.

200 මෙම උත්සාහයන් කිහිපයක සාරාංශයක් සඳහා 'විශ්වීය අධිකරණ බලය - ශ්‍රී ලංකාවට යුක්තිය සාක්ෂාත් කර ගැනීමට ඇති දුෂ්කරම මාර්ගය' බලන්න, ඇන්ඩ්‍රියාස් ෂුලර්, ජස්ට් සිකියුරිටි, **2021** පෙබරවාරි **24**, ලබා ගත හැක්කේ: https://www.justsecurity.org/74941/universal-jurisdiction-the-most-difficult-path-to-achieve-justice-for-sri-lanka/

පොලිසියේ ත්‍රස්ත විරෝධී විධානය යටතේ යුද අපරාධ සහ මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ විමර්ශනය කරන විශේෂඥ ඒකකයකට යොමු කිරීමක් සිදු විය. එක්සත් රාජධානියේ සිදු කරන ලද පළමු අත්අඩංගුවට ගැනීම, විශේෂයෙන් නිමලරාජන්ගේ ඝාතනය සම්බන්ධයෙන් විය. 2022 පෙබරවාරි 25 වැනි දින, මෙට්‍රොපොලිටන් පොලිස් යුද අපරාධ කණ්ඩායම විසින් 2000 දශකයේ මුල් භාගයේ ශ්‍රී ලංකා සිවිල් යුද්ධයට සම්බන්ධ යුද අපරාධ චෝදනා සම්බන්ධයෙන් 'ක්‍රියාශීලී පරීක්ෂණයක්' ලෙස හැඳින්වූ ක්‍රියාත්මක වීමක් සිදු කිරීමෙන් අනතුරුව, එංගලන්තයේ නෝර්තැම්ප්ටන්ෂයර් හි දී නම් නොකළ 48 හැවිරිදි පුද්ගලයෙකු නිමලරාජන් ඝාතනය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් බව නිවේදනය කළේය.[201] යුද අපරාධ කණ්ඩායම ප්‍රසිද්ධ ආයාචනයක් නිකුත් කරමින් කියා සිටියේ ඔවුන් තම පරීක්ෂණ දිගටම සිදු කරගෙන යන බවත්, විමර්ශනයට සහාය විය හැකි නඩුව පිළිබඳ සෘජු තොරතුරු ඇති ඕනෑම අයෙකුට සවන්දීමට උනන්දුවෙන් සිටින බවත්ය.[202] මෙට්‍රොපොලිටන් පොලිසිය ඔවුන්ගේ සුපුරුදු ක්‍රියා පටිපාටිවලට අනුකූලව, සැකකරු නම් කර නොමැති අතර, දේශීය ශ්‍රී ලාංකික මාධ්‍ය විසින් වාර්තා කළේ ශ්‍රී ලංකාවේ විමර්ශනය අතරතුර රට හැර එක්සත් රාජධානියට ගොස් ඇති බව පුද්ගලයෙකු සැකකරු ලෙස හඳුනාගෙන ඇති බවයි. මෙම පුද්ගලයා නැපෝලියන් ලෙස හඳුන්වන සෙබස්තියන් රමේෂ් වන අතර මෙම වාර්තාවේ විස්තර කර ඇති පරිදි, 2002 දී නිමලරාජන් ඝාතනය සම්බන්ධයෙන් යාපනය මහේස්ත්‍රාත් අධිකරණය අත්අඩංගුවට ගෙන අධිකරණය හමුවට පමුණුවන ලෙස නියෝග කර තිබුණි.

ඉන්පසුව, 2023 නොවැම්බර් 21 වන දින, මෙට්‍රොපොලිටන් පොලිසිය දකුණු ලන්ඩනයේදී, හැට ගණන්වල පසුවන, නම් නොකළ තවත් ශ්‍රී ලාංකිකයෙකු අත්අඩංගුවට ගත්තේය.[203] මෙවර අත්අඩංගුවට ගැනීම 2001 අගභාගයේ යාපනයේ නාරන්තනි හි පැවති දේශපාලන රැලියක් අතරතුර සිදු වූ බව කියන අපරාධයක් සම්බන්ධයෙන් සිදු බව ප්‍රකාශ වූ අතර, එහිදී දෙදෙනෙකු මිය ගොස් තවත් අය බරපතල තුවාල ලබා තිබුණි. ප්‍රහාරයෙන් වසර පහළොවකට පසු, සැකකරුවන් හතර දෙනෙකුට ශ්‍රී ලංකාවේදී චෝදනා එල්ල කර නඩු විභාගයට භාජනය කිරීමෙන් පසු 2016 දෙසැම්බර් මාසයේදී යාපනය මහාධිකරණය ඔවුන්ගෙන් තිදෙනෙකු වැරදිකරුවන් බව තීරණය කළේය. දඬුවම් නියම කිරීමේදී, විනිසුරුවරයා විසින් තිදෙනාටම මරණ දඬුවම මෙන්ම දිගු සිර දඬුවම් සහ දඩ නියම කර තිබුණි.[204] නිමලරාජන් විමර්ශනයේ සැකකරුවෙකු ලෙස නම් කර රටින් පිටව ගොස් ඇති බව වාර්තා වන නැපෝලියන් ලෙස හඳුන්වන සෙබස්තියන් රමේෂ් මේ වරදකරුවන්ගෙන් එක් අයෙකු විය. නාරන්තානි සිද්ධියට අදාළ අපරාධ නඩු කටයුතු සිදුවන අවස්ථාවේ පවා නැපෝලියන් ශ්‍රී ලංකාවෙන් පිටත සිටි අතර, ඔහු සහ තවත් සැකකරුවෙකු වන හිටපු ඊපීඩීපී පාර්ලිමේන්තු මන්ත්‍රී නඩරාජා මතනරාජා යන දෙදෙනාම ඔවුන් අධිකරණයේ පෙනී නොසිටී නඩු විභාග කළ බව දැක්වෙයි (අධිකරණයේ පෙනී නොසිටී නඩු විභාග කිරීමට ශ්‍රී ලංකාවේ අවසර දී ඇත).[205] දෙදෙනාම විදේශගතව සිටින බව අධිකරණයට දැනුම් දී තිබීම නිසා දඬුවම් නියම කිරීමේදී විනිසුරුවරයා ජාත්‍යන්තර අත්අඩංගුවට ගැනීමේ වරෙන්තුවක් නිකුත් කළ බව වාර්තා වේ.[206] මෙම වැරදිකරුවන්ගෙන් එක් අයෙකු හෝ එක්සත් රාජධානියේ දී සොයා ගතහොත්, ඔවුන්ට පනවා ඇති මරණ දඬුවම මෙන්ම ඔවුන් අධිකරණයේ පෙනී නොසිට ඔවුන් වරදකරුවන් බවට පත්කර සිටීම ද ඔවුන් ශ්‍රී ලංකාවට පිටුවහල් කිරීම සඳහා වන ප්‍රධාන බාධාවක් විය හැකිය: මරණ දඬුවම ක්‍රියාත්මක නොකරන බවට ලිඛිත සහතිකයක් නොලැබුනහොත් හැර මරණ දඬුවමට මුහුණ දිය හැකි කෙනෙකු එක්සත් රාජධානිය පිටුවහල් නොකරනු ඇත.[207]

201 'වසර 22 කට පෙර ශ්‍රී ලංකාවේදී බීබීසී මාධ්‍යවේදියා ඝාතනය කළ බවට සැක කෙරෙන පුද්ගලයා එක්සත් රාජධානියේදී අත්අඩංගුවට ගැනීම අයිතිවාසිකම් කණ්ඩායම් සාදරයෙන් පිළිගනී', 2022 පෙබරවාරි 25 වන දින මාධ්‍ය නිවේදනය, ලබා ගත හැක්කේ: https://redress.org/news/rights-groups-welcome-arrest-in-the-uk-of-suspected-killer-of-bbc-journalist-in-sri-lanka-22-years-ago/

202 පළමු අත්අඩංගුවට ගැනීමෙන් පසු අභියාචනය මෙහි ප්‍රතිනිෂ්පාදනය කරන ලදී: https://telo.org/man-arrested-by-mets-war-crimes-team-as-part-of-sri-lankan-murder-investigation/

https://news.met.police.uk/documents/ter008-2022-ctp-sri-lanka-war-crimes-appeal-tamil-translation-dot-pdf-441507

203 Trial International, විශ්ව අධිකරණ බලය පිළිබඳ වාර්ෂික සමාලෝචනය 2024, පිටුව 117, ලබා ගත හැක්කේ:https://trialinternational.org/wp-content/uploads/2024/04/UJAR-2024_digital.pdf; 'එක්සත් රාජධානියේ ශ්‍රී ලංකා යුද අපරාධ විමර්ශනයේ දෙවන අත්අඩංගුවට ගැනීම, ඇමරිකා එක්සත් ජනපදයේ ශ්‍රී ලංකා දෙමළ සංගමය, ලබා ගත හැකිය: https://sangam.org/second-arrest-inn-uks-sri-lanka-war-crimes-investigation/

204 'Jaffna High Court Judge imposes double-death sentence', ඩේලි මිරර් (ශ්‍රී ලංකාව), 2016 දෙසැම්බර් 8, මෙතැනින් ලබා ගත හැක: https://www.pressreader.com/sri-lanka/daily-mirror-sri-lanka/20161208/282522953094096

205 https://www.parliament.lk/members-of-parliament/directory-of-members/viewMember/344

206 'Jaffna High Court yesterday issued Interpol arrest warrant on Napoleon and Mathanarajah of EPDP', දෙමළ රාජ්‍ය තාන්ත්‍රික, 2024 ඔක්තෝබර් 27, මෙතැනින් ලබා ගත හැකිය: https://tamildiplomat.com/jaffna-high-court-yesterday-issue-interpol-arrest-warrant-napoleon-mathanarajah-epdp/.

207 EPDP https://www.cps.gov.uk/legal-guidance/extradition-from-uk

එක්සත් රාජධානියේ මෙට්‍රොපොලිටන් පොලිසිය සඳහන් කළේ ශ්‍රී ලාංකිකයන් දෙදෙනා අත්අඩංගුවට ගැනීම 2001 එක්සත් රාජධානියේ ජාත්‍යන්තර අපරාධ අධිකරණ පනතේ 51 වන වගන්තිය යටතේ සිදු කර ඇති බවයි. ඒ ඔස්සේ එක්සත් රාජධානියට ලෝකයේ ඕනෑම තැනක යුද අපරාධ, මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ සහ ජන සංහාර සම්බන්ධයෙන් නඩු පැවරීමට ඉඩ සලසා දෙයි. එවැනි අපරාධ සිදු කළ පුද්ගලයින් එක්සත් රාජධානියේ සිටින බවට එල්ල වන චෝදනා සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම සඳහා විශේෂඥ කුසලතා ඇති කැපවූ යුද අපරාධ කණ්ඩායම එක්සත් රාජධානිය විසින් මෙට්‍රොපොලිටන් පොලිස් ත්‍රස්ත විරෝධී විධානය තුළ ස්ථාපිත කර තිබේ.[208]

අත්අඩංගුවට ගැනීමෙන් අනතුරුව සැකකරුවන් දෙදෙනාම පොලිස් ඇප මත මුදා හරින ලද අතර, වැඩිදුර පරීක්ෂණ පැවැත්වෙන තෙක් ඔවුන් දෙදෙනාටම චෝදනා එල්ල වී ඇත්දැයි නොදනියි. දෙවන අත්අඩංගුවට ගැනීමෙන් පසුව, විමර්ශනයට සහාය විය හැකි තොරතුරු ඇති ඕනෑම අයෙකුට ඔවුන් හා සම්බන්ධ වන ලෙස පොලිසිය නව අයාචනයක් නිකුත් කළ අතර 2024 ජූනි මාසයේ සිට මෙට්‍රොපොලිටන් පොලිසිය විසින් වැඩිදුර තොරතුරු ප්‍රසිද්ධ කර නොමැත.[209] ප්‍රකාශ වන පරිදි, විමර්ශන විවෘතව පවතින අතර සැකකරුවන් දෙදෙනා පොලිස් ඇප මත සිටිති.[210]

නීතිය ක්‍රියාත්මක කරන ආයතන සාමාන්‍යයෙන් විමර්ශනවල ප්‍රගතිය පිළිබඳ තොරතුරු ප්‍රසිද්ධ නොකරන අතර, වෙනත් රටක සිදු වූ බව කියන අපරාධ විමර්ශනය කිරීමේදී, අන්‍යෝන්‍ය නීති ආධාර ඉල්ලා සිටීම සඳහා ස්ථාපිත මාර්ග හරහා එම රටේ අදාළ ජාතික බලධාරීන්ගෙන් සහයෝගය ඉල්ලා සිටීම සාමාන්‍ය පිළිවෙතයි. එම රටේ විමර්ශනවල ප්‍රතිඵලයක් ලෙස දැනටමත් වැදගත් සාක්ෂි එහි රඳවා තබා ගැනීමට හැකි වීම මෙයට පැහැදිලි හේතුවයි. අන්‍යෝන්‍ය නීති ආධාර සඳහා වන විධිමත් ඉල්ලීම් යවා තිබේද, නැත්නම් ප්‍රතිචාර ලැබී තිබේද යන්න නොදන්නා නමුත් එක්සත් රාජධානියේ බලධාරීන් පවසා ඇත්තේ ඔවුන් ශ්‍රී ලංකා බලධාරීන් සමග දිගටම සම්බන්ධ වී සිටින බවයි.[211]

ශ්‍රී ලංකාවේ යුද්ධය අවසානයේ සිදු වූ උල්ලංඝනයන් සම්බන්ධයෙන් වගවීම සඳහා එක්සත් රාජධානියේ බලධාරීන් තවමත් ක්‍රියාකාරීව සම්බන්ධ වී සිටින බව පෙන්නුම් කරමින්, ශ්‍රී ලංකා සිවිල් යුද්ධයේදී බරපතල මානව හිමිකම් උල්ලංඝනයන් සහ නීති විරෝධී ඝාතන ඇතුළු අනෙකුත් උල්ලංඝනයන් සම්බන්ධයෙන් වගකිව යුතු පුද්ගලයින් හතර දෙනෙකුට සම්බාධක පනවන බව 2025 මාර්තු මාසයේදී එක්සත් රාජධානියේ රජය නිවේදනය කළේය.[212] මේ අය අතර ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ හමුදාපතිවරුන් තිදෙනෙකු සහ පසු කාලීනව ශ්‍රී ලංකා හමුදාව සමග කටයුතු කළ තවත් පැරාමිලිටරි කණ්ඩායමකට නායකත්වය දුන් හිටපු එල්ටීටීඊ හමුදාපතිවරයෙකු සිටිති. සම්බාධකවලට එක්සත් රාජධානියේ සංචාරක තහනම් පැනවීම සහ වත්කම් තහනම් කිරීම ඇතුළත් වේ. නිවේදනයක් නිකුත් කරමින් විදේශ ලේකම් ඩේවිඩ් ලැමී මෙසේ පවසා ඇත: 'සිවිල් යුද්ධයේදී සිදු වූ සහ අදටත් ප්‍රජාවන්ට බලපෑමක් ඇති කරන මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සහ අපයෝජනයන් සඳහා වගවීම සෙවීම ඇතුළුව ශ්‍රී ලංකාවේ මානව හිමිකම් සඳහා එක්සත් රාජධානිය කැපවී සිටී.'.[213]

208 යුද අපරාධ කණ්ඩායමේ ක්‍රියාකාරිත්වය පිළිබඳ මෙම විස්තරය සහ එය අනුගමනය කරන මාර්ගෝපදේශ බලන්න: https://www.cps.gov.uk/publication/war-crimescrimes-against-humanity-referral-guidelines

209 ශ්‍රී ලංකාවේ යුද අපරාධ විමර්ශනයේ දෙවන අත්අඩංගුවට ගැනීමෙන් පසු පොලිසිය තොරතුරු සඳහා ආයාචනයක් 2024 ජූනි 4, මෙතැනින් ලබා ගත හැකිය: https://www.breaking.co.uk/uk-law-enforcement/4-june-2024-1740-police-appeal-for-information-following-second-arrest-in-sri-lanka-war-crimes-investigation-the-appeal-comes-after-a-second-uk-based-person-was-arrested-as-part-o-17642.html

210 2024 දෙසැම්බර් මාසයේදී, යුද අපරාධ කණ්ඩායමේ රහස් පරීක්ෂකයෙකු නිමලරාජන්ගේ ඝාතනය පිළිබඳ විමර්ශනය අඛණ්ඩව පවතින බවත්, කණ්ඩායම 'තවත් සාක්ෂිකරුවන් හඳුනා ගැනීම සඳහා සිවිල් සමාජය සහ ශ්‍රී ලාංකික ප්‍රජාව සමඟ දිගටම කටයුතු කරන' බවත් පැවසූ බව මාධ්‍යවේදීන් ආරක්ෂා කිරීමේ කමිටුව වාර්තා කළේය. මෙතැනින් ලබා ගත හැකිය: https://cpj.org/data/people/mylvaganam-nimalarajan/

211 Trial International සමග Redress සහ වෙනත් පාර්ශ්ව, විශ්ව අධිකරණ බලය වාර්ෂික සමාලෝචනය 2024, පිටුව 117: https://redress.org/storage/2024/04/UJAR-2024_digital.pdf.

212 'ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධය අතරතුර මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සහ අපයෝජන සඳහා එක්සත් රාජධානියේ සම්බාධක, "විදේශ, පොදුරාජ්‍ය මණ්ඩලීය සහ සංවර්ධන කාර්යාලයේ මාධ්‍ය නිවේදනය, 2025 මාර්තු 24, මෙතැනින් ලබා ගත හැකිය: https://www.gov.uk/government/news/uk-sanctions-for-human-rights-violations-and-abuses-during-the-sri-lankan-civil-war

213 එහිම. ඇමරිකා එක්සත් ජනපදය සහ කැනඩාව ඇතුළු අනෙකුත් රටවල් ද මානව හිමිකම් බරපතල ලෙස උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් ඉහළ පෙළේ ශ්‍රී ලාංකික නිලධාරීන්ට සම්බාධක පනවා ඇත.

# 6. අනෙකුත් මාධ්‍යවේදීන් සහ මාධ්‍ය සේවකයින් ඝාතනය කිරීම

2002 මැයි මාසයේදී, ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහස පිළිබඳව වාර්තා කරමින්, '2000 දී ඝාතනය කරන ලද මාධ්‍යවේදී නිමලරාජන්ගේ ඝාතකයින්ට නිසි දඬුවම් නොලැබීම තවමත් වෘත්තිය පුරා අඳුරු සෙවනැල්ලක් සේ වැටී ඇති බව' දේශසීමා නොමැති වාර්තාකරුවන් (RSF) සඳහන් කර ඇත.[214] 2004 දී තවත් මාධ්‍යවේදීන් ඝාතනයන් ආරම්භ විය (රූපසටහනබලන්න). 2007 අප්‍රේල් 30 වන දින ප්‍රවෘත්ති යාවත්කාලීන කිරීමක දී, පෙර දින යතුරුපැදියකින් පැමිණි ඝාතකයෙකු විසින් *උදයන්* මාණ්ඩලික වාර්තාකරු සෙල්වරාජා රජීවර්ණම් මංසන්ධියකදී වෙඩි තබා ඝාතනය කරන ලද බව වාර්තා කරමින්, RSF මෙසේ නිරීක්ෂණය කර ඇත: 'ශ්‍රී ලංකාවේ මාධ්‍යවේදීන් ඝාතනය කරන පුද්ගලයින්ට කොතරම් ආරක්ෂාවක් දැනෙනවාද යත්, ඔවුන් ඔවුන්ගේ පෙර ඝාතනවල සංවත්සර සැමරීම සඳහා නව ඝාතන සිදු කරති.'[215] නිමලරාජන්ගේ මිතුරෙකු සහ *ටැමිල්නෙට්* කර්තෘවරයෙකු වූ තාරකි ලෙස හඳුන්වන ධර්මරත්නම් සිවරාම් පැහැරගෙන ගොස් වෙඩි තබා ඝාතනය කිරීම සහ ඊට පෙර වසරේ එනම් 2005 අප්‍රේල් 29 වන දින උදයන් පුවත්පතේ සේවකයින් දෙදෙනෙකු ඝාතනය කිරීම සහ පුවත්පත් කාර්යාලයට අහඹු ලෙස වෙඩි උණ්ඩ 40 කට අධික වෙඩි වර්ෂාවක් එල්ල කරමින් තවත් අයට බරපතල තුවාල සිදු කිරීම යන කරුණු සම්බන්ධයෙන් RSF විසින් මෙම ලිපියෙන්,  දක්වා ඇත. මේ ගැන ප්‍රාදේශීය මාධ්‍යවේදීන් නැවතත්, ඊපීඩීපී සංවිධානය සැක කළහ.[216]

නිමලරාජන්ට පෙර දකුණේ සිදු වූ සිදුවීම්  ඇතුළු අනෙකුත් මාධ්‍යවේදීන් ඝාතන සිදු වී  තිබුණද, 2014 දී යාපනය මාධ්‍ය සමාජය (JPC) විසින් නිමලරාජන්ගේ ඝාතනය 'මාධ්‍යවේදීන් ඝාතනය කිරීමේ ප්‍රවණතාවයක' ආරම්භය ලෙස හඳුනා ගෙන ඇත. 2014 දී බොරු චෝදනා මත අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම, මරණ තර්ජන සහ ඝාතන තැත් කිරීම් හේතුවෙන් මාධ්‍යවේදීන් 'බියෙන් තැතිගෙන' සිටින බවත්, බොහෝ දෙනෙක් රටින් පලා යන බවත් ජේපීසී ප්‍රකාශයේ සඳහන් විය; එසේ ම 'මේ දක්වා,' 'ශ්‍රී ලංකා රජය මෙම සිදුවීම්වලට දිගු නිහඬතාවයකින් ප්‍රතිචාර දක්වා ඇති' බව ජේපීසී ප්‍රකාශයේ දක්වා තිබුණි.[217] වසරකට පසුව, නිමලරාජන්ගේ ඝාතනය 'දෙමළ මාධ්‍යවේදීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට වේදිකාව සකසන' බවට ඔවුන් නැවත නැවතත් අවධාරණය කළ අතර, 'විවිධ පාර්ශවයන් බලයට පැමිණ පරීක්ෂණ පවත්වන බව පෙන්වීමට කොමිෂන් සභා නිර්මාණය කර ඇති', නමුත් 'ඒ වෙනුවට සිදු වී ඇත්තේ මියගිය හෝ අතුරුදහන් වූවන්ගේ හිතුමිතුරන් ප්‍රකාශ සහ සාක්ෂි විනාශ කර දැමීමයි. අද දක්වාම, එම කොමිෂන් සභාවලට හෝ ඒවායේ වාර්තාවලට සිදුවූයේ කුමක්දැයි අපට දැනගත නොහැකි වී ඇත.' 'මාධ්‍යවේදීන් ඝාතනය කිරීම සහ පැහැර ගැනීම් සම්බන්ධයෙන් එකම ආරක්ෂක යාන්ත්‍රණයන් සමග සිදු කරනු ලබන පරීක්ෂණ කෙරෙහි අපට කිසිදා විශ්වාසය තැබිය නොහැක' යන අනතුරු ඇඟවීම සමගින්, ජේපීසී නිසි පරීක්ෂණයක් ඉල්ලා

[214] https://www.tamilnet.com/art.html?catid=13&artid=6889

[215] Reporters Without Borders, ප්‍රවෘත්ති, 2007අප්‍රේල් 30: https://rsf.org/en/young-reporter-tamil-newspaper-murdered-jaffna

[216] එයම, සහ https://www.tamilguardian.com/index.php/content/another-tamil-journalist-killed-commemorate-earlier-killings

[217] https://www.tamilguardian.com/index.php/content/journalists-protest-against-media-repression-north

සිටියේය. එබැවින් අපක්ෂපාතී ජාත්‍යන්තර මාධ්‍ය සංවිධානවල අධීක්ෂණය යටතේ පරීක්ෂණ සිදු කිරීම සඳහා වන අපගේ ඉල්ලීම් පැහැදිලි කිරීමට අපි කැමැත්තෙමු.'[218]

2015 දී ශ්‍රී ලංකාව පිළිබඳ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලයේ විමර්ශන වාර්තාවේ (OISL) 2002 සිට සිදු කරන ලද බරපතල මානව හිමිකම් උල්ලංඝනයන් අතර මාධ්‍යවේදීන් ඝාතනය කිරීම ගැන සඳහන් කර තිබුණි. ශ්‍රී ලංකාවේ ඝාතනයට ලක් වූ මාධ්‍යවේදීන් සහ මාධ්‍ය සේවකයින් සංඛ්‍යාව ලෝකයේ ඉහළම අගයන් අතරට පැමිණ ඇති බව විශේෂ විමර්ශන කණ්ඩායම සඳහන් කර ඇති අතර ප්‍රකාශනයේ නිදහසට දැඩි සීමාවන් පැනවී ඇත. මහ කොමසාරිස් කාර්යාලයේ සොයා ගැනීම පහත පරිදි වේ:

... ශ්‍රී ලංකාවේ මාධ්‍යවේදීන්ට එරෙහි ප්‍රහාර පුළුලව ව්‍යාප්තව දීර්ඝ කාලයක් පුරා සිදු වෙමින් පවතින අතර, OISL හි අනිවාර්ය ආවරණය වූ කාල සීමාව පුරාම සහ ඉන් පසුව ද අඛණ්ඩව සිදු වෙමින්, රජයේ ප්‍රතිපත්ති හෝ පුද්ගලයින් විවේචනය කිරීම සඳහා ප්‍රසිද්ධ බවට නිශ්චිත මාධ්‍ය නැවත නැවතත් ක්‍රමානුකූලව ඉලක්ක කරනු පෙනේ. අවස්ථා කිහිපයකදී, මාධ්‍ය සේවකයින්ට එරෙහිව නැවත නැවතත් එල්ල වන ප්‍රහාර නොතකා ප්‍රමාණවත් ආරක්ෂක පියවරයන් ලබා දී නොමැති අතර ඔවුන්ගේ ඝාතන පිළිබඳ විමර්ශනවල සුළු හෝ ප්‍රගතියක් දක්නට නොලැබුණි.[219]

මාධ්‍යවේදීන් ආරක්ෂා කිරීමේ කමිටුව විසින් (CPJ) මෑතකදී නිමලරාජන්ගේ නම සඳහා වූ එහි ඇතුළත් කිරීම යාවත්කාලීන කළේය. '2025 මුල් භාගයේ දී, ශ්‍රී ලංකා වේ අලුතින් තේරී පත් වූ රජයේ මාධ්‍ය අමාත්‍ය නලින්ද ජයතිස්ස, නිමලරාජන් වෙනුවෙන් යුක්තිය ඉටු කරයිද යන්න පිළිබඳව අදහස් දැක්වීමට සීපීජේ විසින් යවන ලද කෙටි පණිවිඩවලට ප්‍රතිචාර දක්වා නැත.'.[220]

ශ්‍රී ලංකාවේ මාධ්‍යවේදීන් ඝාතනය කිරීම හුදකලා නොවන බවත්, දේශපාලනිකව අභිප්‍රේරිත, වාර්ගිකව ඉලක්ක කරගත් ප්‍රචණ්ඩත්වයේ රටාවක කොටසක් බවත්, බොහෝ විට රාජ්‍ය ආරක්ෂාව සහ දඬුවම් නොලැබීම භුක්ති විඳි ඊපීඩීපී වැනි පැරාමිලිටරි කණ්ඩායම් සමග සම්බන්ධ වී ඇති බවත්, එම කණ්ඩායම් තව දුරටත් එසේ කරමින් සිටින බවත්යඉහත ඉදිරිපත් කර ඇති කාලානුක්‍රමය ප්‍රබල ලෙස පෙන්නුම් කරයි. 2007 දී RSF විසින්, නිරීක්ෂණය කරන ආකාරයට, මිනීමරුවන් නව ඝාතන සිදු කරමින් 'සංවත්සර සැමරීම' යනු දඬුවම් නොලැබීමේ සංස්කෘතියක අඳුරු පිළිබිඹුවකි, එය තවදුරටත් ප්‍රචණ්ඩත්වයට ධෛර්යයක් ලබා දෙයි. යාපනය මාධ්‍ය සමාජයේ (JPC) ප්‍රකාශයන් ඉතා වැදගත් ය: ඒවා යුක්තිය නොමැතිකම පමණක් නොව, සාක්ෂි විනාශ කිරීම සහ ව්‍යාජ කොමිෂන් සභා හරහා සත්‍යය ක්‍රියාකාරීව මර්දනය කිරීම ද අවධාරණය කරයි. සීපීජේ යාවත්කාලීන කිරීම මගින් ඉස්මතු කරන්නේ 2025 දී, නව පරිපාලනයක් යටතේ පවා, නිමලරාජන්ගේ නඩුව නැවත විවෘත කිරීමට හෝ විසඳීමට කිසිදු අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවයි - එය අඛණ්ඩ දණ්ඩ විමුක්තියේ භයානක ලකුණකි.

[218] https://www.tamilguardian.com/index.php/content/jaffna-press-club-calls-inquiry-killings-and-disappearances-tamil-journalists

[219] Report of the OHCHR Investigation on Sri Lanka, A/HRC/30/CRP.2, 16 September 2015, පරිච්ඡේද 257 සහ 260.

[220] https://cpj.org/data/people/mylvaganam-nimalarajan/

# 2000 ඔක්තෝබර් 19 වන දින සිදු වූ මයිල්වඟානම් නිමලරාජන් ඝාතයෙන් අනතුරුව ශ්‍රී ලාංකික මාධ්‍යවේදීන් සහ මාධ්‍ය සේවකයින් 44 දෙනෙකු ඝාතනය කිරීම:



අයියතුරෙයි නඩේසන්

මුද්රිත හා ගුවන් විදුලි මාධ්යවේදියෙකි; 2004.05.31 වැනි දින වෙඩි තබා ඝාතනය කරන ලදී,



ධර්මරත්නම් සිවරාම් (තාරකී)

මුද්රිත මාධ්යවේදී සහ ටැමිල්නෙට් හි ජ්යෙෂ්ඨ කර්තෘ; පැහැරගෙන ගොස් ඇත, මළ සිරුර පසුදා - 2005.04.29 වැනිදා සොයා ගන්නා ලදී, හිසට වෙඩි වැදී ඇත.



ඩේවිඩ් සෙල්වරත්නම්

පුවත්පත් කාර්යාලයේ ආරක්ෂක නිලධාරියෙකි; 2005.08.29 වන දින අත්බෝම්බ ප්රහාරයකින් මිය ගියේය.



බාලා නඩකන්දසාමි අයියර් බාල්රාජ්

මුද්රිත මාධ්යවේදී ; 16.08.2004 වැනි දින වෙඩි තබා ඝාතනය කරන ලදී,



කන්නමුත්තු අර්සකුමාර් [අර්සකුමාර් කන්නමුත්තු]

පුවත්පත් බෙදාහැරීමේ සේවක; 2005.06.29 වැනි දින වෙඩි තබා ඝාතනය කරන ලදී



යෝගකුමාර් ක්රිෂ්ණපිල්ලෙයි

පුවත්පත් බෙදාහරින්නෙකි; 30.09.2005 වැනි දින වෙඩි තබා ඝාතනය කරන ලදී



ලංකා ජයසුන්දර

ඡායාරූප මාධ්යවේදී; රැකියාවේ යෙදී සිටිය දී k11.12.2004 වැනි දින ග්රේනේඩ් ප්රහාරයකින් ඝාතනයට ලක් විය



රිලන්ගි සෙල්වරාජා

රූපවාහිනී සහ ගුවන් විදුලි නිවේදිකා සහ විචාරක; 2005.08.12 වැනි දින වෙඩි තබා ඝාතනය කරන ලදී. ඇයත් සමග දේශපාලන ක්රියාකරුවෙකු වූ ඇගේ ස්වාමිපුරුෂයා ද ඝාතනය කරනු ලැබිණි



එල්. එම්. ෆලීල්/ නෙට්පිට්ටිමුනායි ෆලීල්:

කතුවරයෙකි; 02.12.2005 වැනි දින වෙඩි තබා ඝාතනය කරන ලදී

## 2005



නවරත්නම් පුවත්පත්

බෙදාහරින්නෙකි, 22.12.2005 වැනි දින වෙඩි තබා ඝාතනය කරන ලදී

## 2006



සුබ්‍රමනියම් සුගිතරාජා

මුද්‍රිත මාධ්‍යවේදියෙකි; 24.01.2006 වැනි දින වෙඩි තබා ඝාතනය කරන ලදී



රාජරත්නම් රන්ජිත් කුමාර්

පුවත්පත් සංසරණ අධීක්ෂකවරයෙකි; 02.05.2006 වැනි දින වෙඩි තබා ඝාතනය කරන ලදී



එස්. ටී. ඝනනාතන්

ප්‍රවෘත්ති සහ තොරතුරු මධ්‍යස්ථානයක හිමිකරුවෙකි, 01.02.2006 වැනි දින වෙඩි තබා ඝාතනය කරන ලදී



සම්පත් ලක්මාල් ද සිල්වා

නිදහස් වාර්තාකරුවෙකි; 01.07.2006 වැනි දින වෙඩි තබා ඝාතනය කරන ලදී.



බැස්ටියන් ජෝර්ජ් සගයාතාස් (සුරේෂ්)

පුවත්පත් සංසරණ කළමනාකරුවෙකි; 02.05.2006 වැනි දින වෙඩි තබා ඝාතනය කරන ලදී



මරිදාසන් මනෝරාජ්

පුවත්පත් බෙදා හරින්නෙකි; 01.08.2006 වැනි දින ක්ලේමෝ පිපිරීමකින් මිය ගියේය.



සතාසිවම් බාස්කරන්:

පුවත්පත් නියෝජිතයෙකු සහ රියදුරෙකි; 15.08.2006 වැනි දින වෙඩි තබා ඝාතනය කරන ලදී



සින්නතම්බි සිවමහරාජා

පුවත්පත් කළමනාකාර අධ්‍යක්ෂවරයෙකි; 20.08.2006 වැනි දින වෙඩි තබා ඝාතනය කරන ලදී

## 2007



එස්. රවීන්ද්‍රන්

පුවත්පත් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරුවෙකි; 12.02.2007 වැනි දින වෙඩි තබා ඝාතනය කරන ලදී.



සෙල්වරාජා රජීවර්නම්

මුද්‍රිත මාධ්‍යවේදී; 29.04.2007 වැනි දින වෙඩි තබා ඝාතනය කරන ලදී.



සුබ්‍රමනියම් රාමචන්ද්‍රන්

පුවත්පත් වාර්තාකරුවෙකි; 15.02.2007 වැනි දින අතුරුදහන් විය.



සහදේවන් නිලක්ෂන්

ශිෂ්‍ය මාධ්‍යවේදියෙකි; 01.08.2007 වැනි දින වෙඩි තබා ඝාතනය කරන ලදී.



චන්ද්‍රබෝස් සුදාකර්

ප්‍රකාශකවරයෙක්, සංස්කාරකවරයෙකු සහ මාධ්‍යවේදියෙකි; 16.04.2007 වැනි දින වෙඩි තබා ඝාතනය කරන ලදී.



ඇන්තනිපිල්ලෙයි ෂෙරින් සිත්තයිරන්ජන්

පුවත්පත් බෙදා හැරීමේ නියෝජිතයෙකි; 05.11.2007 වැනි දින අතුරුදහන් වී ඇත.

## 2007



වඩිවේල් නිමලරාජ්

පුවත්පත් සෝදුපත් බලන්නෙකි; 17.11.2007 වැනි දින අතුරුදහන් වී ඇත.



ඉසයිවිෂි චෙම්පියන් (සුභාජිනී)

ගුවන් විදුලි වාර්තාකාරියකි; 2007.11.27 වැනි දින ශ්‍රී ලංකා ගුවන් හමුදා ගුවන් විදුලි මධ්‍යස්ථානයට සිදු කළ බෝම්බ හෙලීමෙන් මිය ගියාය.



ටී. ධර්මලිංගම්

ගුවන්විදුලි කාර්මික ශිල්පියෙකි; 2007.11.27 වැනි දින ශ්‍රී ලංකා ගුවන් හමුදා ගුවන් විදුලි මධ්‍යස්ථානයට සිදු කළ බෝම්බ හෙලීමෙන් මිය ගියේය.



ඩබ්ලිවු. ගුණසිංහ

මාධ්‍යවේදියෙකි; 05.12.2007 වැනි දින මහාමාර්ගයේ දී මගී බස් රථයක් තුළ සිදු වූ බෝම්බ පිපිරීමකින් මිය ගියේය.



ඩබ්ලිවු. ගුණසිංහ

ගුවන්විදුලි කාර්මික ශිල්පියෙකි; 2007.11.27 වැනි දින ශ්‍රී ලංකා ගුවන් හමුදා ගුවන් විදුලි මධ්‍යස්ථානයට සිදු කළ බෝම්බ හෙලීමෙන් මිය ගියේය.

## 2008



පරනිරූපසිංහම් දේවකුමාර්

රූපවාහිනී වාර්තාකරු, 28.05.2008 වැනි දින පිහියෙන් ඇන ඝාතනය කරන [සටහන. ඔහු සමග මෝටර් සයිකලයේ ගමන් කරමින් සිටි පුද්ගලයා ද ඝාතනය කරන ලදී]



මොහොමඩ් රස්මි මහරූෆ්

රූපවාහිනී වාර්තාකරුවෙකි; 06.10.2008 වැනි දින මරාගෙන මැරෙන බෝම්බකරුවෙකු විසින් ඝාතනය කරන ලදී.
[සටහන. අවම වශයෙන් 27 දෙනෙකු මිය ගොස් අවම වශයෙන් 80 දෙනෙකු තුවාල ලැබූ අතර, මිය ගිය අයගෙන් කෙනෙකි. ]



රාසියා ජෙයන්තිරන්

මාධ්‍යවේදී සහ හිටපු උප කර්තෘ; අපැහැදිලි තත්වයන් යටතේ ඝාතනය කරන ලදී, 2008 ඔක්තෝබර් පමණ.



ලසන්ත වික්‍රමතුංග

පුවත්පත් කතෘ හා මාධ්‍යවේදී; 08.01.2009 වැනි දින වෙඩි තබා ඝාතනය කරන ලදී.



නල්ලියා මහේෂ්වරන්

වාර්තාකරුවෙක් හා පුවත්පත් බෙදා හැරීමේ සම්බන්ධීකාරකවරයෙකි; 06.03.2009 වැනි දින මෝටාර් ප්‍රහාරයකින් ඝාතනය කරන ලදී.



ජෙයරාජා සුසිතර (සුගන්දන්)

පුවත්පත් මුද්‍රණයන්ත්‍ර ක්‍රියාකරු; 25.04.2009 වැනි දින ස්නයිපර් ප්‍රහාරයකින් ඝාතනය කරන ලදී.



පුනියමූර්ති සත්‍යමූර්ති මුද්‍රිත,

රූපවාහිනී සහ ගුවන්විදුලි වාර්තාකරු; 2009.02.12 වැනි දින රාජකාරී කටයුතුවල යෙදී සිටිය දී ශ්‍රී ලංකා කාලතුවක්කු ප්‍රහාරයකින් මිය ගියේය.
[සටහන: ඔහුගේ මරණයට එක් හේතුවක් වූයේ තුවාල ලැබීමෙන් පසු සුදුසු වෛද්‍ය ප්‍රතිකාර නොලැබීමයි]



මරියනායගම් ඇන්ටන් බෙනඩික්ට්

පුවත්පත් බෙදාහරින්නෙකි; 2009 මාර්තු පමණ මෝටාර් ප්‍රහාරයකින් ඝාතනය කරන ලදී.



මාරි අරුලප්පන් ඇන්ටෝනිකුමාර් (ඇන්ටනි කෘෘස්)

වාර්තාකරුවෙක් සහ පුවත්පත් බෙදාහරින්නෙකි; 14.05.2009 වැනි දින හමුදා වෙඩිපහරවලින් ඝාතනයට ලක් විය.



සසි මාතන්

පුවත්පත් බෙදා හරින්නෙකි; 05.03.2009 වැනි දින මෝටාර් ප්‍රහාරයකින් ඝාතනය කරන ලදී.



රාජ්කුමාර් මේරි ඩෙන්සි

පුවත්පත් ග්‍රැෆික් නිර්මාණකාරියකි; 09.04.2009 වැනි දින හමුදා ෂෙල් වෙඩි ප්‍රහාරයකින් මිය ගියේය.



සන්කර්සිවන් සිවදර්ශන්

පුවත්පත් ග්‍රැෆික් නිර්මාණ ශිල්පියෙකි. හමුදා වෙඩිපහරවලින් 14.05.2009 දින මරණයට පත්විය

## 2009



**තිරුකුලසිංහම් තවබාලන්**

ගුවන්විදුලි මාධ්‍යවේදියෙක් සහ ඡායාරූප ශිල්පියෙකි; 2009 මැයි පමණ ශ්‍රී ලංකා හමුදාව විසින් ඝාතනය කරන ලද බවට විශ්වාස කෙරේ.

## 2010



**ප්‍රගීත් එක්නැලිගොඩ**

කාටුන්ශිල්පීයෙක් හා තීරු ලිපි රචකයෙකි; 24.01.2010 වැනිදා අතුරුදහන් වී ඇත.



**ඉසයි ප්‍රියා (ශෝභා / ශෝභනා ධර්මරාජා)**

වාර්තාකාරියක හා ප්‍රවෘත්ති නිවේදිකාවකි; 18/19.05.2009 වැනි දින වෙඩි තබා ඝාතනය කරන ලදී
[සටහන. ඡායාරූප සාක්ෂි ඔස්සේ ඇය ලිංගික අතවරයකට ලක්ව ඇති බව බොහෝ දෙනෙකු විශ්වාස කළහ.]

මූලාශ්‍රය:

1. ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වන මාධ්‍යවේදීන් (JDS) http://www.jdslanka.org/index.php/ killed-media-workers
2. Suren Karthikesu, Witness of War, 2024

# 7. සමාලෝචනය හා නිර්දේශ

## නිර්දේශ

ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධයේ මුල් වසරවලදී ඝාතනයට ලක් වූ ප්‍රමුඛ දෙමළ මාධ්‍යවේදියෙකු වන නිමලරාජන් මයිල්වාගනම්ගේ සිද්ධිය, රටේ අපරාධ යුක්ති විනිශ්චය පද්ධතිය තුළ ගැඹුරින් මුල් බැසගත් ව්‍යුහාත්මක දණ්ඩමුක්තිය නිරූපණය කරන අතර විශේෂයෙන් රාජ්‍ය ක්‍රියාකාරීන් සම්බන්ධ විය හැකි තැන්වල බරපතල මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සිදු කරන්නන් ආරක්ෂා කිරීම දිගටම සිදුවේ.

ඔහුගේ ඝාතනය සහ යුක්තිය සුරක්ෂිත කිරීමට නිරන්තරයෙන් අසමත් වීම මගින් ශ්‍රී ලංකාවේ අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියට රාජ්‍ය මැදිහත්වීමක් ඇති බවට සැක කරන අපරාධවල දී, බොහෝ අවස්ථාවල විමර්ශනය කිරීමට සහ නඩු පැවරීමට නොහැකි වූ සහ අකැමැති වූ පුළුල් රටාවක් නිදර්ශනය කරයි. දශක ගණනාවක් තිස්සේ දේශීය හා ජාත්‍යන්තරව නිරීක්ෂණය කළ ද, එවැනි අවස්ථාවන්හි දී යුක්තිය ඉටු කිරීමට ශ්‍රී ලංකා බලධාරීන් නිරන්තරයෙන් අපොහොසත් වී ඇත. මෙම අසාර්ථකත්වය අහම්බයක් නොවන අතර - එය ක්‍රමානුකූල වේ. මෙම රටාව පිළිබඳව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් යාන්ත්‍රණයන්, ශ්‍රී ලංකා සිවිල් සමාජ සංවිධාන සහ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන විසින් පුළුල් ලෙස ලේඛනගත කර ඇත.

## නඩු පවරන්නන්ගේ ස්වාධීනත්වය සහ නීතිපතිවරයාගේ කාර්යභාරය

ශ්‍රී ලංකාවේ නීතිපතිවරයා, රජයේ ප්‍රධාන නීති උපදේශකවරයා මෙන් ම ජාතික මට්ටමින් අපරාධ වැරදි සම්බන්ධයෙන් නඩු පැවරීමේ ප්‍රාථමික අධිකාරිය ලෙස ද්විත්ව භූමිකාවක් ඉටු කරයි. මෙම ද්විත්ව භූමිකාවන්, විශේෂයෙන් සන්නද්ධ හමුදා සහ පොලිසියේ සාමාජිකයින් ඇතුළු රාජ්‍ය ක්‍රියාකාරීන් සම්බන්ධ විමර්ශන සහ නඩු පැවරීම් සන්දර්භය තුළ, දේශීය හා ජාත්‍යන්තර නීති නිරීක්ෂකයින් විසින් නිරන්තර විවේචනයට ලක් කර ඇත.

නීතිපති දෙපාර්තමේන්තුව ව්‍යුහාත්මකව විධායක අංශය තුළ පිහිටා ඇති අතර රජයේ බහුවිධ ආයතන සඳහා නීති උපදේශකයෙකු ලෙස සේවය කරයි. එබැවින්, එයට විමර්ශනය කිරීමට හෝ නඩු පැවරීමට අවශ්‍ය විය හැකි ස්වාධීන ක්‍රියාකාරීත්වය හෝ ආයතනික වශයෙන් වෙන් වී තිබීමක් නොමැත. ජාත්‍යන්තර නීතිය යටතේ බරපතල මානව හිමිකම් උල්ලංඝන කිරීම් සහ අපරාධ සම්බන්ධයෙන් කෙරෙන විමර්ශනවල සහ නඩු පැවරීම්වල විශ්වසනීයත්වය සහ අපක්ෂපාතීත්වය මූලික වශයෙන් යටපත් කරන සහජ වශයෙන් ම උනන්දුව පිළිබඳ ගැටුමකි මෙහි ප්‍රතිඵලය විය හැකිය.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරිය, ශ්‍රී ලංකාව පිළිබඳ 2021 වාර්තාවේ (A/HRC/46/20) මෙසේ සඳහන් කර ඇත:

වත්මන් පද්ධතිය තවමත් සිය වගවීම ඉටු කිරීමට අසමත් තැනක සිටියි. නීතිපති දෙපාර්තමේන්තුව බරපතල මානව හිමිකම් නඩු ඵලදායී ලෙස විභාග කිරීමට නැවත නැවතත් අසමත් වී ඇති අතර, බොහෝ විට පූර්ව කොමිෂන් සභා සහ විමර්ශන මගින් විශ්වාසදායක සොයාගැනීම් තිබියදීත් ප්‍රමාණවත් සාක්ෂි නොමැති බව සඳහන් කරයි. ස්වාධීන සහ විශේෂිත නඩු පවරන ආයතනයක් අවශ්‍ය වේ.

ඒ හා සමානව, ජාත්‍යන්තර නීතිවේදීන්ගේ කොමිසම (ICJ) මානව හිමිකම් සහ ජාත්‍යන්තර අපරාධ බරපතල ලෙස උල්ලංඝනය කිරීම් විමර්ශනය කිරීම සහ නඩු පැවරීම සඳහා නීතිපතිවරයාගෙන් ස්වාධීනව නඩු පැවරීමේ බලතල සහිත ස්වාධීන ආයතනයක් වන විශේෂ උපදේශක කාර්යාලයක් පිහිටුවීම නිරතුරුවම නිර්දේශ කර ඇත.

නීතිපතිවරයා විධායකය සමග ඇති ආයතනික සම්බන්ධතාවය සැලකිල්ලට ගෙන, රාජ්‍ය නියෝජිතයන් විසින් සිදු කරන ලදැයි කියන අපරාධ සම්බන්ධයෙන් නඩු පැවරීම සඳහා මෙම කාර්යාලය මත යැපීම ජාත්‍යන්තර ස්වාධීනත්වයේ සහ අපක්ෂපාතීත්වයේ ප්‍රමිතීන් සපුරාලීමට අපොහොසත් වීමකි. නඩු පවරන්නන්ගේ අකර්මන්‍යතාවය දණ්ඩමුක්තියේ රටාවකට දායක වී ඇති අතීත සංකේතාත්මක සිද්ධීන් සම්බන්ධයෙන් මෙම උත්සුකය විශේෂයෙන් කැපී පෙනේ.

නීතිපතිවරයා විසින් නීතිමය නියෝජනයක් සිදු කළ යුතු පුද්ගලයන් හෝ ආයතනවලට චෝදනා එල්ල වන විට, ප්‍රතික්ෂේප කිරීමේ හෝ ආයතනික වෙන්වීමේ මූලධර්මය නිරීක්ෂණය කළ යුතුය. ශ්‍රී ලංකාවේ නීති ව්‍යුහය තුළ එවැනි යාන්ත්‍රණයක් නොමැතිකම හේතුවෙන්, සාධාරණ හා ස්වාධීන පරීක්ෂණවල අවශ්‍යතා සපුරාලීමට පවතින නඩු පවරන ව්‍යුහය ප්‍රමාණවත් නොවේ. අධිකරණ පද්ධතිය කෙරෙහි මහජන විශ්වාසය නැවත ඇති කිරීමට පමණක් නොව, ශ්‍රී ලංකාවේ බැඳී ඇති ජාත්‍යන්තර නීතිමය බැඳීම් ඉටු කිරීමට ද ප්‍රතිසංස්කරණ අවශ්‍ය වේ. ස්වාධීන නඩු පවරන අධිකාරියක් නොමැති විට, අතීත අපයෝජනයන් පිළිබඳ ආමන්ත්‍රණය කිරීමට ගන්නා ඕනෑම උත්සාහයක් නීත්‍යානුකූලව සහ සදාචාරාත්මකව දුර්වල වනු ඇත.

මීට අමතරව, වසර ගණනාවක් පුරා අනුප්‍රාප්තික රජයන් මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් පරීක්ෂණ කොමිෂන් සභා කිහිපයක් කැඳවා ඇති අතර, ඒවා කලාතුරකින් නඩු පැවරීම් සිදු කිරීමට හෝ වන්දි ගෙවීමට හේතු වී ඇත. මෙම ආයතන බොහෝ විට යුක්තියේ මෙවලම් ලෙස නොව දේශපාලන අපගමනය සඳහා වන මෙවලම් ලෙස උපයෝගී කරගෙන තිබේ.

නිමලරාජන් විමර්ශනය, මෙම පුළුල් වගවීම පිළිබඳ අර්බුදයේ සංකේතයක් සේ පවතියි. දේශපාලනික වශයෙන් පෙළඹවීමක් ලැබූ අපරාධ සම්බන්ධයෙන් කඩිනම්, පරිපූර්ණ සහ විශ්වසනීය පරීක්ෂණ පැවැත්වීමට ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතියට ධාරිතාව, කැමැත්ත, ස්වාධීනත්වය සහ අපක්ෂපාතීත්වය නොමැති බව එයින් පෙන්නුම් කෙරේ.

## විශ්ව අධිකරණ බලය

මෙම විමර්ශනය විශ්වීය අධිකරණ බලයේ ප්‍රවේශය අවධාරණය කරයි: නීති විරෝධී ඝාතන වැනි බරපතල ජාත්‍යන්තර අපරාධ සඳහා වගකිව යුතු අයට, අපරාධ සිදු වූ ස්ථානය කුමක් වුවත්, ඔවුන් සොයාගත් ඕනෑම තැනක නඩු පැවරීමේ හැකියාව ඇත. දේශීය පිළියම් ප්‍රත්‍යක්ෂ වශයෙන් ලබා ගත නොහැකි හෝ අකාර්යක්ෂම වන ශ්‍රී ලංකාවේ සන්දර්භය තුළ, විශ්වීය අධිකරණ බලය යටතේ ස්වාධීන ජාත්‍යන්තර විමර්ශන සහ නඩු පැවරීම් සඳහා පහසුකම් සැලසීමේ ජාත්‍යන්තර ප්‍රජාවේ කාර්යභාරය තීරණාත්මකය. මේ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට රාජ්‍යයන්ට යුතුකමක් පවතන අතර. දේශසීමා නිසා යුක්තිය නොමග යැවීම හෝ දේශපාලන අභිමතය පරිදි ප්‍රමාද කිරීම නොකළ යුතුය. නිමලරාජන්ගේ විමර්ශනය දණ්ඩමුක්තිය අවසන් කිරීම සඳහා වන ගෝලීය කැපවීම පිළිබඳ පරීක්ෂණයකි.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ හිටපු මහ කොමසාරිස් නවී පිල්ලේ තහවුරු කළ පරිදි:

යුක්තිය සම්බන්ධයෙන් කල් ඉකුත්වන දිනයක් නොමැත … බරපතල මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සිදු කරන අය වහාම නොවුනත්, සහ ඔවුන් කොතැනක සිටියත් අවසානයේ දී වගකිව යුතු බවට පත් කරන බව දැන සිටිය යුතුය.[221]

[221] නවී පිල්ලෙ, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය, 2014 පෙබරවාරි 24

දඬුවම් නොලැබීමේ චක්‍රය බිඳ දැමීමට, වින්දිතයින්ට යුක්තිය ඉටු කිරීමට සහ අනාගත උල්ලංඝනයන් වැළැක්වීමට තිරසාර ජාත්‍යන්තර පීඩනය අත්‍යවශ්‍ය වේ.

එවැනි පියවර රහිත වූ විට, නිමලරාජන් සහ තවත් බොහෝ දෙනෙකුගේ ඝාතන දඬුවම් නොලබා පවතිනු ඇති අතර, දේශපාලන ප්‍රචණ්ඩත්වයට ඉඩ සලසන ව්‍යුහයන් නොවෙනස්ව පවතිනු ඇත.

# ශ්‍රී ලංකා රජයට නිර්දේශ

## 1. ජාත්‍යන්තර සහභාගීත්වයෙන් යුත් ස්වාධීන විමර්ශන යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම.

නිමලරාජන් **මෛල්වාගනම්** ඝාතනය ඇතුළු බරපතල ගැටුම් ආශ්‍රිත උල්ලංඝනයන් විමර්ශනය කර නඩු පැවරීම සඳහා රජය වහාම ස්වාධීන සහ අපක්ෂපාතී ආයතනයක් ස්ථාපිත කළ යුතුය. මෙම යාන්ත්‍රණය විමර්ශනයන්හි විමර්ශකයින්, අභිචෝදකයින් සහ විනිසුරුවන් ඇතුළු ජාත්‍යන්තර ක්‍රියාකාරීන් මෙන්ම නඩු පැවරීමේ තීරණ ද ඇතුළත් විය යුතු වේ. [222] විශ්වසනීයත්වය සහ ඵලදායීතාවය සහතික කිරීම සඳහා එවැනි යාන්ත්‍රණයකට පැහැදිලි ජනවරමක් සහ තීරණ ගැනීමේ අධිකාරියක් තිබීම අත්‍යවශ්‍යය. [223] ශ්‍රී ලංකාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ 2015 වාර්තාව අතීතයේ දී අවධාරණය කර ඇත්තේ තනිකරම දේශීය විසඳුමක් ප්‍රමාණවත් නොවන බවයි. [224] එවැනි යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමේදී, රජය යාන්ත්‍රණය සැලසුම් කිරීමේදී වින්දිතයින් සහ සිවිල් සමාජයෙන් උපදෙස් ලබා ගත යුතු අතර, ග්වාතමාලා CICIG[225] හෝ සිරියාව[226] සඳහා IIIM වැනි සම්පූර්ණයෙන්ම ජාත්‍යන්තර විනිශ්චය සභාවක්, හෝ ශ්‍රී ලංකා රජය සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය (UN) අතර සහයෝගීතාවයෙන් සංවර්ධනය කරන ලද දෙමුහුන් අධිකරණයක් හෝ ECOWAS හි සහාය ඇතිව පිහිටුවන ලද ගැම්බියානු අධිකරණය වැනි ආකෘති සලකා බැලිය යුතුය. [227] ප්‍රධාන අංගයක් විය යුත්තේ එවැනි යාන්ත්‍රණයක ස්වාධීනත්වය සහ දේශපාලන බලධාරීන්ගෙන් සහ බලපෑමෙන් එය ස්වාධීන වීමයි.

## 2. විශේෂ උපදේශක ස්වාධීන කාර්යාලයක් පිහිටුවීම

ශ්‍රී ලංකා රජය විසින් පහත දැක්වෙන කරුණු සිදු කළ යුතුය:

- බරපතල මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සහ ජාත්‍යන්තර අපරාධ විමර්ශනය කර නඩු පැවරීම සඳහා පැහැදිලි වරමක් සහිත ස්වාධීන විශේෂ උපදේශක කාර්යාලයක් පිහිටුවීම.
- මෙම කාර්යාලය නීතිපති දෙපාර්තමේන්තුවෙන් සහ අනෙකුත් විධායක ආයතනවලින් ක්‍රියාකාරීව සහ ආයතනිකව ස්වාධීන බව සහතික කිරීම.
- එහි ස්වාධීනත්වය සහ කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා ප්‍රමාණවත් නෛතික අධිකාරියක්, අයවැය සම්පත් සහ ආරක්ෂණ යාන්ත්‍රණ අදාළ කාර්යාලයට ලබා දීම.
- කාර්යාලය සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වගවීමේ යාන්ත්‍රණයන් පිළිබඳ හොඳම භාවිතයන්ට අනුකූලව, සිවිල් සමාජය, වින්දිතයින්ගේ කණ්ඩායම් සහ ජාත්‍යන්තර නීති විශේෂඥයින් සමග උපදේශන ක්‍රියාවලියක නිරත වීම.
- අධිකරණ පද්ධතිය පිළිබඳ මහජන විශ්වාසය නැවත ඇති කිරීමට පමණක් නොව, ශ්‍රී ලංකාවේ බැඳී ඇති ජාත්‍යන්තර නීතිමය බැඳීම් ඉටු කිරීමට ද එවැනි ප්‍රතිසංස්කරණ අවශ්‍ය වේ. ස්වාධීන නඩු පවරන අධිකාරියක් නොමැති විට, අතීත අපයෝජනයන් ආමන්ත්‍රණය කිරීමට ගන්නා ඕනෑම උත්සාහයක්

---

[222] එහිම, පරිච්ඡේද 1214.

[223] IIGEP ශ්‍රී ලංකාවෙන් ඉවත් වීම සැලකිල්ලට ගනිමින්, https://frontline.thehindu.com/world-affairs/article30195299.ece

[224] ශ්‍රී ලංකාව පිළිබඳ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලයේ විමර්ශන වාර්තාව, UN document A/HRC/30/CRP.2, 2015 සැප්තැම්බර් 16, පරිච්ඡේදය 1246.

[225] https://www.cicig.org/uploads/documents/mandato/cicig_acuerdo_en.pdf

[226] https://www.geneva-academy.ch/geneva-humanrights-platform/events/detail/82-accountability-in-syria-the-role-of-the-international-impartial-and-independent-mechanism

[227] https://www.icj.org/gambia-west-african-states-agree-on-court-for-jammeh-era-crimes/

නීත්‍යානුකූලව සහ සදාචාරාත්මකව දුර්වල ලෙස පවතිනු ඇත.

3. විදේශීය නීති ක්‍රියාවලීන් සහ විශ්ව අධිකරණ විමර්ශන

**සමග සහයෝගයෙන් කටයුතු කිරීම.** විශ්වීය අධිකරණ බලය යටතේ සිදුවන සාහසික අපරාධ විමර්ශනය කරන විදේශීය බලධාරීන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම ඔස්සේ ශ්‍රී ලංකාව ජාත්‍යන්තර නීතිය යටතේ ඇති බැඳීම්වලට සම්පූර්ණයෙන්ම අනුකූල විය යුතුය. නිමලරාජන් සහ නාරන්තනි විමර්ශනවලදී එක්සත් රාජධානියේ බලධාරීන්ගෙන් ලැබෙන අධිකරණ සහයෝගීතා ඉල්ලීම්වලට ප්‍රමාදයකින් තොරව ප්‍රතිචාර දැක්වීම සහ එවැනි ක්‍රියාවලීන්ට බාධා කිරීමෙන් හෝ දේශපාලනීකරණය කිරීමෙන් වැළකී සිටීම ද මෙයට ඇතුළත් වේ.

4. ජාත්‍යන්තර වගවීමේ යාන්ත්‍රණයන් සමග සම්බන්ධ වීම

රජය විසින් එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකා වගවීමේ ව්‍යාපෘතිය (SLAP) සහ බරපතල මානව හිමිකම් සහ මානුෂීය නීති උල්ලංඝනයන් සම්බන්ධයෙන් වගවීම සඳහා ස්ථාපිත කර ඇති අනෙකුත් යාන්ත්‍රණයන් සමග පූර්ණ සහයෝගයෙන් කටයුතු කිරීමෙන් යුක්තිය සඳහා සැබෑ කැපවීම පෙන්නුම් කළ යුතුය. මෙයට තොරතුරු වෙත ප්‍රවේශය ලබා දීම, සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව සහතික කිරීම සහ ජාත්‍යන්තර විමර්ශනවල ස්වාධීනත්වයට ගරු කිරීම ඇතුළත් වේ.

5. 2000 වසරේ සිට සිදු වූ සියලුම මාධ්‍යවේදීන් ඝාතනයන් සඳහා වගවීම සහතික කිරීම:

- 2000 වසරේ සිට සිදු වූ මාධ්‍යවේදීන්ගේ ඝාතන - නිමලරාජන්ගේ ඝාතනය ඇතුළුව - ජනවාර්ගික වශයෙන් ඉලක්ක කරගත් ප්‍රචණ්ඩත්වයේ සහ දඬුවම් නොලැබීමේ පුළුල් රටාවක කොටසක් බව නිල වශයෙන් හඳුනා ගැනීම.
- 2000 වසරේ සිට නොවිසඳුණු සියලුම මාධ්‍යවේදී ඝාතන, ජාත්‍යන්තරව අධීක්ෂණය කරන ලද ඕනෑම ස්වාධීන විමර්ශනයක්, විනිවිද පෙනෙන නිලවරමක්, සාක්ෂිකරුවන් සඳහා ආරක්ෂාව සහ මහජන වාර්තාකරණය සහිතව පරීක්ෂා කරන බව සහතික කිරීම.
- පසුගිය කොමිෂන් සභාවල වාර්තා හෙළිදරව් කිරීම සහ නිකුත් කිරීම - මාධ්‍යවේදී ඝාතන සහ අතුරුදහන් කිරීම් සම්බන්ධව පසුගිය කොමිෂන් සභාවලින් යටපත් කර හෝ විනාශ කර තිබිය හැකි සාක්ෂි ඇතුළුව සියලුම වාර්තා වහාම වර්ගීකරණය කර ප්‍රකාශයට පත් කිරීම.

## එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය, සාමාජික රටවල් සහ ජාත්‍යන්තර ප්‍රජාව වෙත වන නිර්දේශ

1. ජාත්‍යන්තර සහභාගීත්වයෙන් යුත් ස්වාධීන විමර්ශන යාන්ත්‍රණයක අවශ්‍යතාවය නැවත තහවුරු කිරීම.

2015 වසරේ ශ්‍රී ලංකාව පිළිබඳ OHCHR විමර්ශනයේ (OISL) සොයාගැනීම්වලට අනුකූලව, මානව හිමිකම් කවුන්සිලය විසින් සිය ස්ථාවරය නැවත අවධාරණය කර දක්වන්නේ දේශීය යාන්ත්‍රණයන්ට පමණක් සන්නද්ධ ගැටුම අතරතුර සහ ඉන් පසුව සිදු වූ බරපතල උල්ලංඝනයන් විසඳීමට අවශ්‍ය ස්වාධීනත්වය, විශ්වසනීයත්වය සහ මහජන විශ්වාසය නොමැති බවයි. විදේශීය විමර්ශකයින්, නඩු පවරන්නන් සහ විනිසුරුවන් ඇතුළු සැබෑ ජාත්‍යන්තර සහභාගීත්වයක් සහිත ස්වාධීන වගවීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කරන ලෙස සාමාජික රටවල් ශ්‍රී ලංකාවෙන් ඉල්ලා සිටිය යුතුය, නැතහොත් එක්සත් ජාතීන්ගේ අනුග්‍රහය යටතේ පූර්ණ ජාත්‍යන්තර විනිශ්චය සභාවක් පිහිටුවීමට සහාය විය යුතුය, වත්මන් යෝජිත සත්‍ය කොමිසම ජාතික අයිතිය කෙරෙහි අවධානය යොමු කිරීම, ඇතුළත්කරණය සහිත සහභාගීත්වය සහ දේශපාලන කැමැත්ත ප්‍රදර්ශනය කිරීම

ඇතුළුව ජාත්‍යන්තර සම්මතයන් සහ ප්‍රමිතීන්ට අනුකූල විය යුතු බව සඳහන් කළ යුතුය.

### 2. විශ්ව අධිකරණ විමර්ශන සමග සහයෝගීතාවය ඉල්ලා සිටීම

ශ්‍රී ලංකාවේ සිදුවන ජාත්‍යන්තර අපරාධ සම්බන්ධයෙන් විශ්වීය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමට කවුන්සිලය විසින් රාජ්‍යයන් දිරිමත් කළ යුතු අතර, මාධ්‍යවේදී නිමලරාජන් **මෛල්වාගනම්** ඝාතනය සහ නාරන්තනි ඝාතන සම්බන්ධයෙන් එක්සත් රාජධානියේ සිදුවෙමින් පවතින විමර්ශන වැනි අඛණ්ඩ පරීක්ෂණ සඳහා අධිකරණ සහාය සහ තොරතුරු කාලෝචිත ලෙස සැපයීම ඇතුළුව එවැනි ක්‍රියාමාර්ග සඳහා පූර්ණ සහයෝගය ලබා දෙන ලෙස ශ්‍රී ලංකා රජයෙන් ඉල්ලා සිටිය යුතුය.

### 3. ශ්‍රී ලංකා වගවීමේ ව්‍යාපෘතියේ (SLAP) වරම ශක්තිමත් කිරීම සහ පවත්වාගෙන යාම.

අනාගත වගවීමේ උත්සාහයන් සඳහා සාක්ෂි රැස් කිරීම, සංරක්ෂණය කිරීම සහ විශ්ලේෂණය කිරීම සඳහා වන SLAP හි තීරණාත්මක කාර්යභාරය හඳුනා ගනිමින්, මානව හිමිකම් කවුන්සිලය එහි වරම සහ සම්පත් අලුත් කර වැඩි දියුණු කළ යුතුය. ව්‍යාපෘතිය ස්වාධීනව හා ඵලදායී ලෙස ක්‍රියාත්මක වීම සඳහා සාමාජික රටවල් දේශපාලනික, මූල්‍යමය සහ මෙහෙයුම් සහාය සහතික කළ යුතුය.

### 4. කවුන්සිලයේ යෝජනා සහ අනුකූලතා අධීක්ෂණය පිළිබඳ පසු විපරම් සිදු කෙරෙන බව සහතික කිරීම.

ශ්‍රී ලංකාව විසින් පසුගිය කවුන්සිල යෝජනා (උදා: HRC/46/1), විශේෂයෙන් වගවීම, අධිකරණ ප්‍රතිසංස්කරණ සහ වින්දිතයින් කේන්ද්‍ර කරගත් යුක්තිය සම්බන්ධ යෝජනා ක්‍රියාත්මක කිරීම තක්සේරු කිරීම සඳහා HRC එහි පසු විපරම් යාන්ත්‍රණයන් ශක්තිමත් කළ යුතුය. මෙයට පැහැදිලි මිණුම් සලකුණු සහ කාලරාමු සැකසීම සහ අර්ථවත් ප්‍රගතියක් නොමැති විට අතිරේක පියවර සලකා බැලීම ඇතුළත් වේ.[228]

### 5. වින්දිතයන්ගේ සහභාගීත්වය සහ සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීම

ශ්‍රී ලංකාව තුළ සහ ඩයස්පෝරාව තුළ ඕනෑම වගවීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සඳහා වන ආරක්ෂාව සහිත සහ ආරක්ෂිත උපදේශන ඇතුළුව, ඕනෑම යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියක දී වින්දිතයින් සහ සිවිල් සමාජය කේන්ද්‍රීය බව කවුන්සිලය සහ සාමාජික රටවල් සහතික කළ යුතුය. මෙයට සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ පියවර සහ පළිගැනීම්වලින් ආරක්ෂා වීම, දිවි ගලවා ගත් අයගේ සංගම් සඳහා සහය මෙන්ම විදේශයන්හි සිට සුරක්ෂිත සහභාගීත්වය ලැබීම සමග සම්බන්ධ විය යුතුය.

## එක්සත් රාජධානි රජයට නිර්දේශ

එක්සත් රාජධානියේ බලධාරීන් ඔවුන්ගේ පරීක්ෂණ දිගටම කරගෙන යා යුතු බවත්, සාක්ෂි මගින් එක්සත් රාජධානියේ සිටින සැකකරුවන් ඝාතනවලට සම්බන්ධ කරන්නේ නම්, ඔවුන්ට එක්සත් රාජධානියේ අධිකරණයක නඩු පැවරිය යුතු බවත් නිර්දේශ කෙරේ. වින්දිතයින්ගේ පවුල් සඳහා යුක්තිය ඉටු කිරීමේ එකම විභව ආකාරය මෙය විය හැකිය.

## මාධ්‍ය ආයතන සහ මාධ්‍ය නිදහස් කණ්ඩායම් සඳහා නිර්දේශ

### 1. ලේඛනගත කිරීම සහ නීති උපදේශනය සඳහා සහාය වීම

ශ්‍රී ලාංකික මාධ්‍යවේදීන්, නීතිඥයින් සහ සිවිල් සමාජය සමග එක් වී විමර්ශන ලේඛනගත කිරීම, සාක්ෂි සංරක්ෂණය කිරීම සහ හැකි සෑම විටම උපායමාර්ගික විමර්ශන ආරම්භ කිරීම සඳහා අරමුදල් සැපයීම සහ හවුල් වීම.

[228] උදාහරණයක් ලෙස එක්සත් ජාතීන්ගේ වධහිංසා විරෝධී කමිටුව 2016 සිට ශ්‍රී ලංකාව සලකා බලා නොමැත.

## 2. මහජන අනුස්මරණ ක්‍රියාකාරීව ප්‍රවර්ධනය කිරීම

තම රාජකාරිය කරන අතරතුර ඝාතනයට ලක් වූ මාධ්‍යවේදීන්ට, විශේෂයෙන් දෙමළ මාධ්‍යවේදීන්ට ගෞරව කිරීම. ජාත්‍යන්තර මාධ්‍ය නිදහස පිළිබඳ ඉසව්වල දී ඔවුන් ගැන කතා කිරීම. මෙය ඔවුන් සිහිපත් කිරීමට මෙන් ම මෙම අපරාධ සඳහා දඬුවම් නොලැබූ අයට එරෙහිව කතා කිරීමට උපකාරී වේ.

# බීබීසී වෙත නිර්දේශ:

නිමලරාජන් **මෛල්වාගනම්** ඝාතනය වූ අවස්ථාවේ ඔහුගේ ප්‍රමුඛ ගෝලීය විකාශකයෙකු සහ සේවායෝජකයෙකු ලෙස, යුක්තිය සඳහා පෙළඹවීමට සහ මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට බීබීසීය සංකේතාත්මක සහ ආයතනික බලය දරයි. ඒ අනුව, අපි බීබීසීයට නිර්දේශ කරන්නේ:

## 1. නිමලරාජන්ගේ නාමයට ප්‍රසිද්ධියේ ගෞරව කරමින් යුක්තිය ඉල්ලා සිටීම

මාධ්‍යවේදියෙකු ලෙස නිමලරාජන්ගේ ධෛර්යය සහ අඛණ්ඩතාව නැවත තහවුරු කරමින් ඉහළ මට්ටමේ ප්‍රසිද්ධ ප්‍රකාශයක් නිකුත් කිරීම, ඔහුගේ ඝාතනය සඳහා වගවීම සඳහා පැහැදිලිවම ඉල්ලා සිටිමින්, දෙමළ මාධ්‍යවේදීන්ට එරෙහි ව්‍යාප්ත ප්‍රචණ්ඩත්වය ඇතුළුව ශ්‍රී ලංකාවේ අඛණ්ඩව සිදුවන දඬුවම් නොලැබීම ඉස්මතු කිරීමට සිය මාධ්‍ය වේදිකාවක් සේ භාවිතා කිරීම.

## 2. වගවීම සක්‍රියව අනුගමනය කිරීම

ජාත්‍යන්තර උපදේශනය, උපායමාර්ගික නඩු පැවරීම් සහ ශ්‍රී ලංකා අධිකරණ පද්ධතියේ අසාර්ථකත්වය පිළිබඳ විශේෂඥ විමර්ශන ඇතුළුව යුක්තිය සඳහා ස්වාධීන නීතිමය මාර්ග සඳහා සහාය වීම. නඩුව දෘශ්‍යමානව පවතින බව සහ විශ්වාසදායක නඩු පැවරීම් අනුගමනය කරන බව සහතික කිරීම සඳහා මානව හිමිකම් කණ්ඩායම් සහ එක්සත් ජාතීන්ගේ යාන්ත්‍රණයන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම.

## 3. මාධ්‍යවේදීන්ගේ ආරක්ෂක යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීම

අධි අවදානම් සන්දර්භයන් තුළ මාධ්‍යවේදීන් සඳහා වැඩිදියුණු කළ ආරක්ෂක ප්‍රොටෝකෝල අනුගමනය කර ක්‍රියාත්මක කිරීම, ඒවාට ඇතුළත් වන්නේ:

- ගැටුම් කලාපවලට ගැලපෙන තර්ජන සහ අවදානම් තක්සේරු රාමු
- හදිසි ස්ථානගත කිරීම් සහ ඉවත් කිරීමේ පද්ධති,
- ආරක්ෂිත සන්නිවේදනය සහ නීතිමය ආරක්ෂක සහාය

ආරක්ෂක පුහුණුව සහ ආරක්ෂක සම්පත් කාර්ය මණ්ඩලයට පමණක් නොව, වඩාත් අවදානමට ලක්විය හැකි දේශීය මාධ්‍ය ශිල්පීන් සහ නිදහස් දායකයින් වෙනුවෙන් ද පුළුල් කිරීම.

## 4. අභ්‍යන්තර ප්‍රතිපත්ති සමාලෝචනය සහ ප්‍රතිසංස්කරණය

නිමලරාජන්ගේ පවුලේ අයට සහ හිතමිතුරන්ට ලබා දුන් සහයෝගය ඇතුළත් කරමින් ඝාතනය සම්බන්ධයෙන් බීබීසී ප්‍රතිචාර දැක්වූ ආකාරය පිළිබඳ අතීත අභ්‍යන්තර සමාලෝචනයක් සිදු කිරීම.

තර්ජනයට ලක්ව සිටින මාධ්‍යවේදීන්ගේ අනාගත ප්‍රතිචාරාත්මක බව සහ අවදානම් අවම කිරීම වැඩිදියුණු කිරීම සඳහා ඉගෙන ගත් පාඩම් ආයතනිකකරණය කිරීම.

## 5. පවුලේ අයට සහයෝගය ලබා දීම

යුක්තිය සහ වගවීම සම්බන්ධයෙන් පවුලට සහාය වන අතර පවුලේ අයට මූල්‍යමය සහයෝගය ද සහතික කිරීම. නිමලරාජන් සහ අනෙකුත් ඝාතනයට ලක් වූ මාධ්‍යවේදීන්ට ගෞරව කිරීම සහ ඓතිහාසික වාර්තාවේ සත්‍යය ආරක්ෂා කිරීම සඳහා වන අනුස්මරණ මුලපිරීම්වලට සහාය දැක්වීම.

සත්‍යය ප්‍රකාශ කිරීම නිසා මාධ්‍යවේදීන් දිගින් දිගටම ඝාතනය වන ලෝකයක, නිමලරාජන්ගේ ඝාතනය සම්බන්ධයෙන් වන බීබීසී ප්‍රතිචාරය මගින් වැදගත් පූර්වාදර්ශයක් සැපයිය හැකිය. කැපවීම, පැහැදිලි, තිරසාර සහ සෝෂාකාරී නම් යුක්තිය ප්‍රමාද වීම යනු යුක්තිය ප්‍රතික්ෂේප වීමක් නොවේ.

ITJP යනු 2013 සිට ශ්‍රී ලංකාවේ යුක්තිය සහ
වගවීම ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම
සඳහා ක්‍රියාත්මක වන ස්වාධීන ජාත්‍යන්තර,
ලාභ නොලබන සංවිධානයකි.

REDRESS යනු වධහිංසාවලින් දිවි ගලවා ගත්
අයට යුක්තිය සහ වන්දි ලබා දෙන,
අපරාධකරුවන්ට දඬුවම් නොලැබීම අභියෝගයට
ලක් කරන සහ වධහිංසාවලට එරෙහිව සටන්
කිරීම සඳහා නීතිමය සහ ප්‍රතිපත්තිමය
ප්‍රතිසංස්කරණ සඳහා පෙනී සිටින ජාත්‍යන්තර
මානව හිමිකම් සංවිධානයකි.

www.redress.org
www.itjpsl.com
www.jdslanka.org